ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2012

# කාර්යසාධන වාර්තාව

# 2012

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින්**

**2002 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලද අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි**
**මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.**

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ටද පරිවර්තනය කර ඇත.

# පටුන


| | පිටු අංක |
|---|---|
| පෙරවදන | 01 |
| 1. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2-10 |
| 2. දිවි නැගුම - සවිබල ගෘහ ආර්ථිකයක් | 11-23 |
| දිවි නැගුම වැඩසටහන | |
| i කෘෂිකාර්මික අංශය | 12-14 |
| ii පශු සම්පත් අංශය | 14 |
| iii ධීවර අංශය | 15-16 |
| iv ව්‍යවසාය සංවර්ධන හා ගෘහ කර්මාන්ත අංශය | 17 |
| • දිවි නැගුම වැඩසටහනේ බලපෑම | 19 |
| • දිවිනැගුම වැඩසටහනේ ජයග්‍රහණ සහ අභියෝග | 20-21 |
| • සමාජ ආරක්ෂණය - සමෘද්ධි වැඩසටහන | 22-23 |
| 3. ගම නැගුම - සවිබල ගැන්වුන ප්‍රජාවක් | 24-42 |
| • විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන | 38-39 |
| • ප්‍රාථමික පාසල් 5000 හා ද්විතීයික පාසල් 1000 ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන - "හොඳම දේ දැයේ දරුවන්ටයි" | 40-42 |
| 4. පුර නැගුම - පරිසර හිතකාමී නාගරික පරිසරයක් | 43-47 |
| • දියත උයන - නාගරික සංවර්ධන වැඩසටහන | 44 |
| • මාතෘ සායන වැඩිදියුණු කිරීම | 45 |
| • සති පොළ ඉදි කිරීම | 46 |
| • ව්‍යායාම් පථ ඉදිකිරීම | 46 |
| • බස් නැවතුම්පළ සංවර්ධනය | 47 |
| 5. ප්‍රාදේශිය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක් | 48-67 |
| • ග්‍රාමීය / පළාත් අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කිරීම | 50-51 |
| • අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය / සම්පූර්ණ කිරීම | 51-52 |
| • බහුවිධ වාරිමාර්ග සංවර්ධනය කිරීම | 53 |
| • සංචාරක කටයුතු සඳහා පොදු උපයෝගිතා සැපයීම | 53-55 |
| • මූලික මිනිස් අවශ්‍යතා වෙනුවෙන් ප්‍රවේශය | 55-56 |
| • ජීවනෝපාය සංවර්ධන හා ස්වයංරැකියා සඳහා ඒකාබද්ධ යටිතල පහසුකම් | 56-57 |
| • උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය | 58-64 |
| • බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන | 65-66 |
| 6. උපාය මාර්ගික මූලාරම්භයන් - නැගී එන ආර්ථිකයක් | 68-91 |
| • සංචාරක පහසුකම් වැඩි කිරීම (Tourist Facilities Development) | 70-73 |
| • සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විදේශාධාර ව්‍යාපෘතීන්හි දායකත්වය | 73-75 |
| • සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Tourism Promotion) | 75-77 |
| • සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීම (Human Resources Development) | 78-79 |
| • පොදු විනෝදාත්මක පහසුකම් සංවර්ධනය | 80-86 |
| • ජාතික සත්වෝද්‍යාන සංවර්ධනය | 80-81 |
| • ජාතික උද්භිද උද්‍යානයන්හි පොදු පහසුකම් සංවර්ධනය | 82-86 |
| • ආයෝජන ප්‍රවර්ධනය | 87-91 |
| 7. ගිණුම්, මූල්‍ය, අභ්‍යන්තර විගණන හා මානව සම්පත් | 92-112 |
| 8. විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ | 113-115 |

# පෙරවදන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සියළු සංවර්ධන ප්‍රවේශයන්වල අධිතාලම වන්නේ "මිනිසා ගොඩනගා පවුල රැකීමත්, පවුල ගොඩනගා ගම රැකීමත්, ගම ගොඩනගා රට රැකීමත්, රට ගොඩනගා ලෝකය දිනීමත්" යන සංකල්පයයි. එය සමස්ථ සංවර්ධන වැඩ පිළිවෙළකි. (Inclusive Growth)

මෙහි මූලාරම්භය වන්නේ සාර්ථක යහපත් මිනිස් ප්‍රජාවක් බිහි කිරීමය. එමඟින් සෑම අතින්ම සවිබල ගැන්වූ පවුලක් නිර්මාණය කිරීමත්, එමඟින් ග්‍රාමීය, නාගරික හා පළාත් සංවර්ධනය කර ජාතික ආර්ථික සංවර්ධනයට අවශ්‍ය වන කර්මාන්තයන් ප්‍රවර්ධනයෙන් ජාත්‍යන්තර ආර්ථිකය හා බැඳුනු පුළුල් සංවර්ධන වැඩ පිළිවෙළකට ගමන් කිරීමයි. මේ සඳහා අමාත්‍යාංශය 2012 වර්ෂයේදී ඉතා ක්‍රියාකාරී ලෙස දායක වී ඇත.

සමස්ථ දිවයිනම ආවරණය වන දිවි නැගුම ජාතික ව්‍යාපාරයේ III වන අදියර ප්‍රතිලාභී පවුල් ලක්ෂ 25 කට සෙත සලසමින් 2012 වර්ෂයේ මාර්තු මාසයේදීද, IV වන අදියර 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ලක්ෂ 50 ක් පමණ වන රටේ සියළුම පවුල්වලට සෙත සලසමින් ක්‍රියාත්මක විය.

ගම නැගුම වැඩසටහනින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයත් , පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමත්, පෙර පාසල් සංවර්ධනයත් යනාදි අංග සාර්ථකව ක්‍රියාත්මක විය.

ශාරීරික අභ්‍යාස මංතීරු ඉදිකිරීම, බස් නැවතුම්පොළ සංවර්ධනය, ක්‍රීඩාපිටි හා මහජන උද්‍යාන ඉදිකිරීම, පදික මාවත් සංවර්ධනය, සතිපොළ සංවර්ධනය, මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන වැනි නාගරික පහසුකම් සංවර්ධනය, 'පුරනැගුම' වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත.

ආර්ථිකයට කරන දායකත්වයෙන් ඈත්වූ පළාත්වලට එම අවස්ථාව ලබාදීම සඳහා දිවයිනේ සියළුම පළාත් සංවර්ධනය පිණිස ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් (උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය, බටහිර රන්අරුණ, වයඹ පුබුදුව, රුහුණු උදානය, සබරගමු අරුණාලෝකය, පුබුදමු වෙල්ලස්ස, කඳුරට උදානය, රජරට නවෝදය) මඟින් සෑම පළාතක්ම ආවරණය වන පරිදි සංවර්ධන කටයුතු 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත. මෙහිදී විශේෂ අවධානය උතුරු කරයේ ගැටුම්වලට ලක්වූ ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරීමත්, අවතැන් වූවන් නැවත පදිංචි කිරීමත්, ඔවුන්ගේ ජීවනෝපාය යථා තත්ත්වයට පත් කිරීමත්, ඊට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයත්, නව ජීවනෝපාය මාර්ග ඇති කිරීමත් උතුරු වසන්තය වැඩසටහන යටතේ ප්‍රමුඛව ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව 2012 වර්ෂය තුළදී පළාත් සංවර්ධනය අරමුණු කර ගනිමින් විදේශ ණය හා ආධාර යටතේ මෙන්ම දේශීය අරමුදල් යොදවා ද ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර නිම කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට හැකිවිය.

වර්ෂ 2016 වන විට ක්‍රය ශක්තියෙන් ඉහළ සංචාරකයන් මිලියන 2.5 ක් මෙරටට ගෙන්වා ගැනීමේ ඉලක්කය ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ පසුගිය වසරේදී සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි. 2012 වර්ෂයේදී මිලියන 1.0 ක සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමේ ඉලක්කය ඉක්මවා සංචාරකයන් පිරිසක් මෙරටට ගෙන්වා ගැනීමට සංචාරක ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කළ සංචාරක අංශයන්හි පහසුකම් සංවර්ධනය, ප්‍රවර්ධන කටයුතු හා සංචාරක ක්ෂේත්‍රය තුළ මානව සම්පත සංවර්ධනය ඉවහල් විය.

2012 වසරේදී රු. මිලියන 2.0 ක ආයෝජන මෙරටට ගෙන්වා ගැනීමේ ඉලක්කය මත ක්‍රියාත්මක වූ ආයෝජන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධන කටයුතු වඩා සාර්ථකව ඉටු කරමින් වඩාත් සෘජුවම ජාතික ආර්ථිකය හා ජාත්‍යන්තර ආර්ථිකය අතර මනා ආර්ථික සබැඳියාවක් ගොඩ නගා ගැනීමටත් සමත් විය.

2012 වර්ෂයේදී දේශීය ව්‍යාපාරික ප්‍රජාව ශක්තිමත් කරලීම උදෙසා කෘෂිකාර්මික, ධීවර හා පශු සම්පත්, ඉදිකිරීම්, කාර්මික, පරිගණක හා සේවා කටයුතු, සංචාරක සහ යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍රයන්හි පෘථුල ව්‍යාප්තියක් ඇති කළ අතර, ආයෝජන ප්‍රවර්ධනය උදෙසා පුළුල් ගෝලීය වෙළෙඳ පොළට සම්බන්ධ වෙමින් උසස් තාක්ෂණය දේශීය ආර්ථිකය හා බද්ධ කරමින් වඩාත් ඉහළ වටිනාකම් දේශීය නිෂ්පාදනයට එකතු කිරීමත් අමාත්‍යාංශය විසින් ඉටු කරන ලද කාර්යයන් අතර වේ.

"ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය" බවට පත් කිරීමේ අභිලාෂයෙන් මෙම සමස්ථ ක්‍රියාවලියම හසුරවමින් සිටින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය නියාමන කටයුතු හා ආයතනික පහසුකම් වැඩි දියුණු කිරීමත් පරිපාලන කටයුතු වඩාත් සරල කිරීම මඟින් ව්‍යාපාර සංවර්ධනයට හා ආයෝජනයට හිතකර පරිසරයක් ගොඩ නංවාලමින් ශ්‍රී ලංකාව ආසියාවේ ඉහළ ආර්ථිකයක් පවතින රටක් බවට පත් කිරීම උදෙසා අවශ්‍ය වැඩ පිළිවෙළ පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් සිටී.

# 1

# ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## නායකත්වය හා මඟ පෙන්වීම

### අමාත්‍ය

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා

### නියෝජ්‍ය අමාත්‍ය

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා

ගරු ආර්. මුත්තුසිවලිංගම් මැතිතුමා

## කාර්යමණ්ඩලය

### ලේකම්

පී.බී.ජයසුන්දර

### අතිරේක ලේකම්වරුන්

| | | |
|---|---|---|
| නිහාල් සෝමවීර | - | ප්‍රාදේශීය සංවර්ධන |
| ආර්.ඒ.ඒ.කේ. රණවක | - | ග්‍රාමීය ආර්ථික |
| චන්ද්‍රා වික්‍රමසිංහ | - | ජීවනෝපාය සංවර්ධන |
| එන්.බී.එච්. ධර්මවර්ධන | - | පාලන |
| එම්.බී.කේ. දිසානායක | - | ආයෝජන |

### අධ්‍යක්ෂ ජනරාල්වරුන්

| | | |
|---|---|---|
| රූපා එස් ඒකනායක | - | පාලන |
| එස්.එස්. හෙට්ටිආරච්චි | - | සංචාරක |
| සරෝජා සිරිසේන | - | විදේශීය සබඳතා |
| සුනන්ද මද්දුම බණ්ඩාර | - | සන්නිවේදන හා සංවර්ධන |
| චන්ද්‍රවංශ පතිරාජ | - | වනජීවී |
| ධම්ම දිසානායක | - | ජනසභා හා ග්‍රාමීය ආර්ථික |
| භාෂ්වර සේනාංක ගුණරත්න | - | සංවර්ධන සංසද |

### ප්‍රධාන ගණකාධිකාරී

ඩබ්. විමලසේන

### ප්‍රධාන අභ්‍යන්තර විගණක

එච්. චන්ද්‍රසේන

### අධ්‍යක්ෂවරුන් හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්

| | | |
|---|---|---|
| ආර්.පී.ආර්. අමරසිංහ | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| එම්.ඩී. නෙවිල් පද්මසිරි | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| එම්.ඒ.එස්. වීරසිංහ | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| එච්.සී.එස්. ගුණතිලක | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු) |
| යූ. සමරසිංහ | - | අධ්‍යක්ෂ (ග්‍රාමීය ආර්ථික ) |
| ඩබ්. ආනන්ද විජේසූරිය | - | අධ්‍යක්ෂ (ආයෝජන) |
| ආර්. ඩී. අනුර රණසිංහ | - | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| ඒ.එච්.එම්.යූ. අරුණ බණ්ඩාර | - | අධ්‍යක්ෂ (අධීක්ෂණ) |
| ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි | - | අධ්‍යක්ෂ (ලෝක ආහාර වැඩසටහන) |
| එන්.බී. මොන්ටි රණතුංග | - | අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන, පුරනැගුම) |

| | | |
|---|---|---|
| එච්.එම්. ජයතිලක හේරත් | - | අධ්‍යක්ෂ (දිවිනැඟුම ) |
| එන්.ඒ.පී. නිශ්ශංක | - | අධ්‍යක්ෂ (ස්වයං රැකියා) |
| එම්.සී.කේ. ධම්මිකා | - | අධ්‍යක්ෂ (ගම නැඟුම) |
| සී.ආර්. සූරියආරච්චි | - | අධ්‍යක්ෂ (දිළිඳුකම අවම කිරීම හා සාක් වැඩසටහන) |
| එම්.අයි.ඒ. වහබ්ඩීන් | - | අධ්‍යක්ෂ (විමධ්‍යගත අයවැය) |
| කේ.එන්.ඒ සෝමරත්න | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| පී.වී. ගුණතිලක | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| ඩී.ආර්.එල්. අබේරත්න | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| ඇලෙක්සි ගුණවර්ධන | - | අධ්‍යක්ෂ(විදේශ සබඳතා) |

**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරුන්**

| | | |
|---|---|---|
| එස්.යූ. චන්ද්‍රකුමාරන් | - | ගණකාධිකාරී |
| එච්.පී. ලලිත් කුමාර | - | ගණකාධිකාරී |
| පී.ආර්.එල්. වසන්ත | - | ගණකාධිකාරී |

## දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්

| | | |
|---|---|---|
| චන්ද්‍රා වික්‍රමසිංහ | - | කොමසාරිස් ජනරාල්, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| එච්.ඩබ්.එම්. පුෂ්පලතා මැණිකේ | - | වැ.බ.කොමසාරිස්, උඩරට ගැමිපුනරුත්ථාපන දෙපාර්තමේන්තුව |
| ඩී.එස්.ඒ. විජේසුන්දර | - | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| පී.එම්. අනුර ද සිල්වා | - | අධ්‍යක්ෂ, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව |
| ආර්.පී.බී. තිලකසිරි | - | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය |
| බී.පී.එස්. රංජිත් ගුණසේකර | - | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය |
| අමරනන්ද වීරසිංහ | - | සභාපති, ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය |
| නාලක ගොඩහේවා | - | සභාපති<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය |
| රූමි ජවුෆර් | - | කළමනාකරණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය |
| සේනක විජේවර්ධන | - | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය |
| සරත් චන්ද්‍ර මොහොට්ටි | - | සභාපති, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය |
| විපුල වනිගසේකර | - | වැ.බ.අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |
| ජේ.ඩී. නීල් රූපසිංහ | - | සභාපති, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |
| තිලක් හෙට්ටිආරච්චි | - | වැ.බ. අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය |
| එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩු | - | සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |

# දැක්ම

මහින්ද චින්තනය තුලින් දිළිඳුකමින් තොර මැදි ආදායම් රටක් ලෙස අලුත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම.

# මෙහෙවර

සවිබල ගැන්වූ ප්‍රජාවක්, සියළු පහසුකම් සහිත ශක්තිමත් ගමක්, විවිධත්වයෙන් ශක්තිය ලබා සමබරව නැගී එන පළාතක් හා ස්ථාවර ජාතික ආර්ථිකයක් ගොඩනැගිමට ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනයට හා මෙහෙයවීමට ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම.

# අමාත්‍යාංශයේ විෂය පථය

2010 අප්‍රේල් මස 30 වැනි දිනැති අංක 1651/20 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට පවරා ඇති විෂය පථය පහත පරිදි වේ.

1. දිළිඳුකම පිටුදැකීම, සංචාරක කර්මාන්තය සහ ආයෝජන ප්‍රවර්ධනයට අදාළ ව්‍යාපෘති සැකසීම සහ ප්‍රතිපත්ති සම්පාදනය.
2. වාර්ෂික අයවැයෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන වලට අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එකඟ වී ඇති කාල රාමුව තුළ ජාතික ප්‍රතිපත්තීන් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම.
3. අමාත්‍යාංශය යටතේ ඇති මහජනතාවට සේවා සපයන ආයතන වඩාත් කාර්යක්‍ෂමව සහ සුහදශීලී ආකාරයට පවත්වාගෙන යෑම.
4. දූෂණය හා නාස්තිය අවම කරමින් අදාල කර්මාන්තයන්හි කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීම සඳහා නූතන කළමනාකරණ උපක්‍රම සහ තාක්‍ෂණික විධික්‍රම භාවිතය තහවුරු කරගැනීම සඳහා සියළු ක්‍රියාවලීන් හා ක්‍රමෝපායන් ප්‍රතිස්ථාපනය කිරීම.
5. ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම.
6. ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තීන් සහ පියවරයන් ක්‍රියාත්මක කිරීම.
7. විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
8. සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සහ අදාල ප්‍රමිතිය අනුකූලව නගා සිටුවීම.
9. සංචාරක නියෝජිත ආයතන ලියාපදිංචිය
10. ශාක සංරක්‍ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වැවීමේ කර්මාන්තයට උදවු දීම.
11. සත්ත්ව දිවි පෙවෙත පිළිබඳව අධ්‍යාපනික වැඩ සටහන් සහ ප්‍රදර්ශන පැවැත්වීම.

## 2012 වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය


ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය

# නැගී එන ආර්ථිකය සඳහා අමාත්‍යංශයේ මැදිහත්වීම




රූප සටහන් අංක 1.1

# දිවි නැගුම - සවිබල ගෘහ ආර්ථිකයක්

# 2

# 2. දිවි නැගුම ජාතික වැඩසටහන

වර්තමාන රජයේ නියමු බලවේගය වන මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් ප්‍රකාශයක් වන "ජීවනෝපාය සහ සමාජ සංවර්ධනය තුළින් 2016 වන විට සම්පත් පිරුණු සමෘද්ධිමත් ගම නිර්මාණය කරමි" යන සංකල්පය සහ 2011 අයවැය ප්‍රකාශයෙහි සඳහන් කරුණු යථාර්ථයක් බවට පත් කරමින් දිවි නැගුම වැඩසටහන ජාතික මට්ටමින් ආරම්භ කරන ලදී.

පවුලේ දියුණුව අපේක්ෂා කරමින් පවුල කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ වූ මෙම වැඩසටහන කෘෂිකර්මය, පශුසම්පත්, ධීවර හා ව්‍යවසාය සංවර්ධන යන අංශ යටතේ ක්‍රියාත්මකභාවයට පත් කරන ලද අතර එමගින් එදිනෙදා පරිභෝජනය සඳහා අවශ්‍ය දෑ ගෘහාශ්‍රිතව සපුරා ගැනීමත්, අතිරික්ත නිෂ්පාදනය අලෙවිය තුළින් අමතර ආදායම් උපයා ගැනීමත් අපේක්ෂා කරන ලදී.

ඒ අනුව 2012 මාර්තු මාසයේදී ගෘහ ඒකක විසිපන්ලක්ෂයක් ද ඔක්තෝම්බර් මාසයේදී ගෘහ ඒකක පනස්ලක්ෂයක් පමණ වූ සියලුම පවුල් ද ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

## 2.1. කෘෂිකාර්මික අංශය

ගෙවත්ත සංවර්ධනය කිරීම තුළින් නිවසට අවශ්‍ය එළවළු, පළතුරු ගෙවත්තෙන් ලබා ගැනීමත්, එමගින් පවුලේ පෝෂණය ඉහළ නැංවීමත්, ගෘහ ආර්ථිකය වර්ධනය කිරීම මෙන්ම දේශීය වගාවන් දිරිගැන්වීම මගින් කෘෂිකාර්මික භෝග ආනයනය අවම කිරීමත් අපේක්ෂාවෙන් දිවිනැගුම ජාතික ව්‍යාපාරයේ ප්‍රධානතම අංශය වශයෙන් කෘෂිකාර්මික අංශය ක්‍රියාත්මක කරන ලදී.

2012 වසර අවසාන වන විට මෙම අංශය සඳහා රු.මි. 1559.81 ක් වැය කර අවශ්‍ය යෙදවුම් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. තුන්වන හා හතරවන අදියර යටතේ අංග සම්පූර්ණ ගෙවත්තක් ගොඩනැගීම අරමුණු කරගෙන එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය එළවළු හා පලාවර්ග, කෙටිකාලීන බෝග, මධ්‍යකාලීන හා දිගුකාලීන බෝග වර්ග සහ මී මැසි පාලනය ප්‍රචලිත කිරීමටත්, බිම්මල් වගාව ඉහළ නැංවීමටත් අවශ්‍ය යෙදවුම් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කරන ලදී. එමෙන්ම 2012 වර්ෂය අවසාන වන විට පොල් පැල 2,728,176 ක් ලබා දී අක්කර 42,628 ක භූමි ප්‍රමාණයක් ජාතික පොල් නිෂ්පාදනයට දිවි නැගුමෙන් දායක කර ඇති අතර එමගින් වසර පහකදී ගෘහයේ පොල් සහ පොල්තෙල් පරිභෝජනය ඉහළ නැංවීම තුළින් විකල්ප තෙල් පරිභෝජනයට විදේශයට ගලා යන විදේශ විනිමය අඩුකර ගැනීමට අපේක්ෂා කර ඇත.

මීට අමතරව රටේ පළතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම සහ පවුලේ පරිභෝජනයට පළතුරුවලින් ස්වයංපෝෂිතවීමේ අරමුණු පෙරදැරි කරගෙන 2012 වසර තුළදී මිලියන 3.96 ක පළතුරු පැල ලබා දී ඇත. මෙමගින් ඉදිරි වසර පහක කාලය තුළදී දේශීය පළතුරු නිෂ්පාදනය 40% කින් ඉහළ නැංවීමට අපේක්ෂා කරන ලදී.

තවද දේශීයව නිෂ්පාදනය කළ හැකි භෝග වර්ග වන මුං, තල, උඳු, රටකජු හා වියළි මිරිස් වගා කර එමගින් දේශීය අවශ්‍යතාවය රට තුළ සපුරා ගෙන ආනයනය අඩු කිරීම තුළින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමට ආරම්භයක් ලෙස 2012 වසරේ දී අක්කර දස දහසක් පමණ වගා කිරීමට කටයුතු කරන ලදී.

### 2.1.1 මිටි මුරුංගා පැළ බෙදා දීමේ වැඩසටහන

ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ යෝජනාවකට අනුව උතුරට මෙන්ම දකුණටද, ආවේණික බෝගයක් ලෙස මිටි මුරුංගා පැළ බෙදාදීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. පෝෂණ ගුණයෙන් ඉතා ඉහළ වීම, මාස 06 ක් වැනි කාලයක් තුළදී ඵල දැරීම හා පැළය වර්ධනය වීම සඳහා අඩු ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යවීම හා

වර්ෂය මුළුල්ලේ එල දැරීම මෙහි ඇති විශේෂත්වයකි.

ඒ අනුව 2012 මැයි /ජුනි යල කන්නයේදී මිටි මුරුංගා පැළ ලක්ෂ 05 ක් දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා බෙදා හරින ලදී.



දිවි නැගුම වැඩසටහන යටතේ සාර්ථකව කරන ලද මුං ඇට වගාවක්
දික්වැල්ල ප්‍රා. ලේ. කොට්ඨාශය,
මාතර දිස්ත්‍රික්කය



මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩ මුළුවක්
තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,
පොළොන්නරුව දිස්ත්‍රික්කය



සාර්ථකව වැඩුණු මිටි මුරුංගා නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, යාපනය දිස්ත්‍රික්කය



දිවි නැගුම යටතේ සාර්ථක ගෙවත්තක්
මැදිරිගිරිය ප්‍රදේශිය ලේකම් කොට්ඨාශය,
පොළොන්නරුව දිස්ත්‍රික්කය

### 2.1.2 ආරක්ෂිත දැල් ගෘහ තුළ ඉහළ වටිනාකමකින් යුත් භෝග වගා කිරීම

දිවයිනේ පවතින විවිධ කාලගුණික හා දේශගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි වසර පුරා එළවළු, පළතුරු වර්ග, වාණිජ වටිනාකමක් සහිත විදේශීය වෙළඳපොළේ හොඳ ඉල්ලුමක් ඇති මල්වගාව සහ ඉහළ වටිනාකමක් සහිත භෝග ලබා ගැනීමේ හැකියාව ගොඩනැගෙන අයුරින් හරිතාගාර හෙවත් ආරක්ෂිත දැල් ගෘහ තුළ වගා කිරීම, දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ ප්‍රචලිත කරන ලදී. 2012.12.31 දිනට ඉදිකර ප්‍රයෝජනයට ගත් ආරක්ෂිත දැල් ගෘහ සංඛ්‍යාව 2297 කි.

### 2012 වසරේ කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය

වගු අංක 2.1.1

| බෙදා දුන් ද්‍රව්‍ය | බෙදාදුන් ප්‍රමාණය | වියදම (රු.මි) |
|---|---|---|
| බීජ කට්ටල | 7,509,406 | 633.97 |
| එළවළු පැළ | 4,297,853 | 51.88 |
| පළතුරු පැළ | 3,955,492 | 350.83 |
| සුළු අපනයන භෝග පැළ | 2,449,501 | 64.27 |
| ධාන්‍ය වර්ග කි ග්‍රෑ(බෝග වර්ග 05 කින් ස්වයංපෝෂිත වීමට) | 14,734 | 4.73 |
| ඖෂධීය පැළ | 39,748 | 2.53 |
| පොල් පැළ | 2,728,176 | 111.95 |
| වෙනත් පැළ | 1,207,726 | 37.4 |
| මී මැසි පාලන යෙදවුම් | 9,016 | 20.22 |
| බිම්මල් වගා යෙදවුම් | 2,730 | 26.01 |
| විසිතුරු මල් වගා යෙදවුම් | 2,154 | 39.58 |
| ආරක්ෂිත දැල් ගෘහ සඳහා අවශ්‍ය යෙදවුම් | 2,297 | 175.26 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 2.2. පශු සම්පත් අංශය

ශ්‍රී ලංකාවේ ළමා පරපුර අතර පවතින මන්දපෝෂණය හා ප්‍රෝටීන ඌනතාවය අවම කිරීමට සත්ත්ව ප්‍රෝටීන ඉවහල් වන බැවින් ගෘහාශ්‍රිතව සත්ත්ව ප්‍රෝටීන බහුලව පවතින කිරි, බිත්තර, යනාදී ආහාර නිපදවීම මෙම අංශය යටතේ ක්‍රියාත්මක කරන ලදී. එමඟින් මන්දපෝෂණ තත්ත්වයට පිළියම් යෙදෙන අතර එය ආහාර ආනයනය සඳහා වැය වන මුදල් ද රටට ඉතිරි කර දීමට ඉවහල් විය.

පශු සම්පත් අංශය යටතේ කුකුළු පැටවුන්, කිරි ගවයින්, එළුවන් වැනි සතුන් ලබා දීම ද, ගවගාල් සකස් කිරීම ද සිදු කර ඇති අතර 2012.12.31 දිනට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 365.00 ක් වැය කර ඇත.

### 2012.12.31 දිනට පශු සම්පත් අංශයේ ප්‍රගතිය

වගු අංක 2.2.1

| ක්‍රියාකාරකම් | සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| කිකිළි පැටවුන් බෙදා දීම | 488,780 | 163.04 |
| කිරි ගවයින් බෙදා දීම | 1,810 | 5.68 |
| එළුවන් බෙදා දීම | 3,547 | 18.14 |
| ගව ගාල් සකස් කිරීම | 5,319 | 148.06 |
| කුකුල් කුඩු සකස් කිරීම | 6,536 | 28.48 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



සාර්ථකව පවත්වාගෙන යන කුකුළු පාලන ව්‍යාපෘතියක් අතුරලිය ග්‍රාම නිලධාරී වසම, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, මාතර දිස්ත්‍රික්කය



එළු පැටවුන් බෙදා දෙමින් අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ගාල්ල දිස්ත්‍රික්කය

## 2.3 ධීවර අංශය

දිවි නැගුම ජාතික වැඩසටහනේ ධීවර අංශය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දුන් ප්‍රතිපාදන මත ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය හරහා ව්‍යාපෘති දොළොහක් 2012 වර්ෂයේ ක්‍රියාත්මක කළ අතර එමගින්, ආහාර සුරක්ෂිතතාවය නැංවීම, සත්ත්ව ප්‍රෝටීන් අවශ්‍යතා සපුරාලීම, අතිරේක ආදායම් උත්පාදනය, පසු අස්වනු නාස්තිය අවම කිරීම, ධීවර හා ජලජීවී වගාව පිළිබඳ දැනුම හා තාක්ෂණය ලබා දීම තුළින් දිළිඳුබව අඩුකිරීම සහ විදේශ විනිමය ඉපයීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතීන් තනි පුද්ගල හා කණ්ඩායම් ව්‍යාපෘතීන් වශයෙන් ක්‍රියාත්මක කෙරේ.

2012 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට පොකුණු තුළ ආහාර පිණිස මත්ස්‍ය/මිරිදිය ඉස්සන් වගාව, විසිතුරු මත්ස්‍ය වගාව, ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම, ඒකාබද්ධ මත්ස්‍ය වගාව, විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ තත්ත්වය උසස් කිරීම, බෙල්ලන් වගාව, කාලීන ජලාශවල මත්ස්‍ය වගාව, වතු ජලාශවල මත්ස්‍ය වගාව, මොදා මසුන් වගාව සහ පසු අස්වනු තාක්ෂණ ව්‍යාපෘතීන් 6764 ක් ක්‍රියාත්මක කර ඇති අතර මේ සඳහා රු.මි. 105.81 වැය කර ඇත.

දුම් කරවල නිෂ්පාදනය සහ මුහුදු පැළැටි වගාව සඳහා පුහුණුව අවසන් කළ අතර ප්‍රතිලාභීන් 54 දෙනෙකු 2013 වර්ෂයේ ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතය.

### 2012.12.31 දිනට ධීවර අංශයේ ප්‍රගතිය

වගු අංක 2.3.1

| අනු | ව්‍යාපෘතිය | ආරම්භකර ඇති ප්‍රතිලාභින් ගණන |
|---|---|---|
| 01 | පොකුණු තුළ ආහාර පිණිස මත්ස්‍ය/මිරිදිය ඉස්සන් වගාව | 516 |
| 02 | විසිතුරු මත්ස්‍ය වගාව (නව) | 577 |
| 03 | ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම. | 24 |
| 04 | ඒකාබද්ධ මත්ස්‍ය වගාව | 113 |
| 05 | විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ තත්වය උසස් කිරීම | 793 |
| 06 | බෙල්ලන් වගාව | 18 |
| 07 | කාලීන ජලාශවල මත්ස්‍ය වගාව | 760 |
| 08 | වතු ජලාශවල මත්ස්‍ය වගාව | 230 |
| 09 | මිරිදිය දුම් කරවල නිෂ්පාදනය | උපකරණ ඇනවුම් කර ඇත. 2013 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය. |
| 10 | මුහුදු පැළැටි වගාව | |
| 11 | මොදා මසුන් වගාව | 43 |
| 12 | පසු අස්වනු තාක්ෂණික ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම. | 2675 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



දිවි නැගුම වැඩසටහන යටතේ කරගෙන යනු ලබන කරවල නිෂ්පාදන ව්‍යාපෘතියක්, යාපනය දිස්ත්‍රික්කය



පොකුණු තුළ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය
අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,
නුවර එළිය දිස්ත්‍රික්කය





මිරිදිය ධීවර ව්‍යාපෘතියක අස්වැන්න නෙලීම
තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, මොණරාගල දිස්ත්‍රික්කය



මිරිදිය ධීවර ව්‍යාපෘතියක්
මොණරාගල දිස්ත්‍රික්කය

## 2.4 ව්‍යවසාය සංවර්ධන හා ගෘහ කර්මාන්ත අංශය

ගෘහස්ථ කර්මාන්ත ආරම්භ කිරීමෙන් හා ප්‍රවර්ධනය කිරීමෙන් පවුලේ මෙන්ම රටේ ආර්ථික අභිවෘද්ධිය සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ හැකිය. ඒ අනුව දිවි නැඟුම ජාතික වැඩසටහන යටතේ ගෘහ කර්මාන්ත ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහනේ පළමු පියවර ලෙස ගෘහකර්මාන්ත සඳහා අදාළ තාක්ෂණය, වෙළඳපොල හා පුහුණු අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන ඒ ඒ දිස්ත්‍රික්කවලට ආවේණික කර්මාන්ත හා සම්පත් විභවතාවයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද අතර 2012.12.31 දින වන විට දිස්ත්‍රික් 24 ක ප්‍රදර්ශන පවත්වා ජනතාව දැනුවත් කර ඇත.

මෙහි දෙවන පියවර වශයෙන් කර්මාන්ත ආරම්භ කිරීමට පුහුණුව අවශ්‍ය වන පුද්ගලයින් තෝරා ගෙන ඔවුන්ට පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු පාඨමාලා පවත්වන ලදි.

- ආහාර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන
- දැව ආශ්‍රිත කර්මාන්ත
- කොහු සහ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- රබර් /ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්තය
- රසායනික නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තය
- ලුහු ඉංජිනේරු කර්මාන්තය
- කඩදාසි ආශ්‍රිත කර්මාන්තය
- ඇඟළුම් /පැච්වර්ක් /සුරතල් සතුන් ආශ්‍රිත කර්මාන්ත
- ඉදිකිරීම් ආශ්‍රිත කර්මාන්ත
- විදුලි කාර්මික ආශ්‍රිත කර්මාන්ත
- උණගස් හා වේවැල් ආශ්‍රිත කර්මාන්ත
- මැටි ආශ්‍රිත කර්මාන්ත
- කිතුල් සහ තල් ආශ්‍රිත කර්මාන්ත
- අත්කම් භාණ්ඩ කර්මාන්ත
- පිරිසිදු පොල්තෙල් නිෂ්පාදන කර්මාන්ත
- සේවා
- කෘෂි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- බිම්මල් ආශ්‍රිත කර්මාන්ත
- විසිතුරු මල් ආශ්‍රිත කර්මාන්ත

සාර්ථකව පුහුණුව අවසන් කළ පුද්ගලයින්ට මෙන්ම, පුහුණුව අවශ්‍ය නොවන දැනටමත් තාක්ෂණික දැනුම ඇති පුද්ගලයින්ට තමන්ගේම ගෘහ කර්මාන්තයක් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ හා ආරම්භක අමුද්‍රව්‍ය ලබා දෙන ලද අතර දැනට ප්‍රතිලාභීන් 12,535 ට පමණ ගෘහස්ථ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. 2012.12.31 දින වන විට කර්මාන්ත අංශය සඳහා රු.මි. 178.69 ක මුදලක් වැය කර ඇත.

දැනටමත් කිසියම් කර්මාන්තයක නියැලි පුද්ගලයින් උදෙසා ඔවුන්ගේ කර්මාන්තය වැඩි දියුණු කර ගැනීම සඳහා තවදුරටත් මූල්‍ය පහසුකම් අවශ්‍ය වන පුද්ගලයින්ට දිස්ත්‍රික් මට්ටමින් බැංකු නිලධාරින් කැඳවා වැඩමුළුවක් පවත්වා සම්බන්ධීකරණ කටයුතු කර දෙනු ලබන අතර මේ වන විට දිස්ත්‍රික් හතරක මෙම බැංකු වැඩසටහන් පවත්වා පුද්ගලයින් 573 කට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.





ගෘහස්ථ කර්මාන්ත පුහුණුවෙන් පසු සාර්ථකව ව්‍යාපාර ආරම්භ කරමින් තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, මොණරාගල දිස්ත්‍රික්කය



පුහුණුවෙන් පසු කොහු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ සාර්ථකව නියැලෙමින් , හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ගාල්ල දිස්ත්‍රික්කය

### 2.4.1 ස්වයංරැකියා වැඩසටහන

ස්වයංරැකියා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව ස්වයංරැකියා උත්පාදනය හා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම මෙම ඒකකයේ වගකීම වේ.

2012 අයවැය යෝජනාවකට අනුව ආබාධිත වූ, ආබාධිතව විශ්‍රාමික වූ ත්‍රිවිධ හමුදාවේ හා පොලිස් රණවිරුවන් හා දිවි පිදූ හා අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ රණවිරුවන්ගේ සමීපස්ථ ඥාතීන් සඳහා ස්වයං රැකියා ණය ලබා දීම සඳහා රණවිරු දිවි නැඟුම ස්වයං රැකියා විශේෂ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. මෙම චක්‍රීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂය තුළදී රු.මි. 10.00 ක ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදී. ණය ලබා දීම සඳහා අමාත්‍යාංශයෙන් දරණ ලද මුදලට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ද දායකත්වය දරා ඇත.

## රණවිරු දිවි නැගුම ස්වයං රැකියා විශේෂ ණය යෝජනා ක්‍රමය
## 2012.12.31 දිනට ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රගතිය

වගු අංක 2.4.1


| අංකය | ස්වයංරැකියා වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | ණය මුදල (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|
| | | නව ස්වයං රැකියා ආරම්භ කිරීම | ස්වයංරැකියා වැඩි දියුණු කිරීම | එකතුව | ස්වයංරැකියා ආරම්භ කිරීම සඳහා | ස්වයංරැකියා වැඩි දියුණු කිරීම සඳහා | එකතුව |
| 1 | වෙළඳාම | 4 | 6 | 10 | 1.80 | 2.75 | 4.55 |
| 2 | ඇඟලුම් කර්මාන්තය | 0 | 2 | 2 | | 1.00 | 1.00 |
| 3 | වගා කටයුතු | 8 | 9 | 17 | 3.50 | 3.80 | 7.30 |
| 4 | සේවා සැපයීම් | 2 | 3 | 5 | 1.00 | 1.50 | 2.50 |
| 5 | කුකුළු පාලනය | 1 | 0 | 1 | 0.20 | 0.00 | 0.20 |
| 6 | කුඩා කර්මාන්ත | 2 | 6 | 8 | 1.00 | 2.75 | 3.75 |
| 7 | කොහු කර්මාන්ත | 0 | 1 | 1 | 0.00 | 0.50 | 0.50 |
| 8 | ත්‍රීරෝද රථ මිළදී ගැනීම් | 3 | 0 | 3 | 1.50 | 0.00 | 1.50 |
| එකතුව | | **20** | **27** | **47** | **9.00** | **12.30** | **21.30** |

මූලාශ්‍රය - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

### 2.5. දිවි නැගුම වැඩසටහනේ බලපෑම


පසුගිය වසර කිහිපයක ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා එළවළු මිළ ගණන් සලකා බැලීමේදී අප්‍රේල් හා දෙසැම්බර් යන මාසවල (එනම් උත්සව මාසවලදී) එළවළු මිළ ශීඝ්‍ර ලෙස වැඩිවී ඇත. නමුත් එම වර්ෂයන්ට සාපේක්ෂව 2012 වර්ෂයේ එම මාසයන්හි දී එළවළු මිළ ගණන්වල අඩුවීමක් දක්නට ඇත. තවද සමස්ථයක් ලෙස 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ එළවළු මිළෙහි අඩුවීමක් දක්නට ඇත. දිවි නැගුම ජාතික වැඩසටහන මඟින් ඇති වූ පිබිදීම නිසා බොහෝ දෙනෙක් තම ගෙවත්තේ වගා කිරීමට යොමුවීම මේ සඳහා ප්‍රභල ලෙස බලපා ඇත.

රූප සටහන් අංක 2.5.1




මූලාශ්‍රය - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

රූප සටහන් අංක 2.5.2




මූලාශ්‍රය - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## 2.6. දිවි නැගුම වැඩසටහනේ ජයග්‍රහණ සහ අභියෝග

වර්තමානය වන විට ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවලට සාපේක්ෂව දූවැන්ත සංවර්ධනයක් කරා පියමං කරමින් සිටී. ලොව කිසිදු රටකට ගැති නොවී ජීවත්වීමට නම් අපේ රට සෑම අතින්ම ස්වයංපෝෂිත කිරීම පමණක් නොව සියලු ජන කොටස්වල ජීවනෝපාය ශක්තිමත් කිරීම ද කළ යුතු වේ.

අතීතයේ සිටම ශ්‍රී ලංකාව කෘෂිකාර්මික අතින් ස්වයංපෝෂිත වී පැවතුණු බව නොරහසකි. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පැමිණීමත් සමගම එම තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනස්වීමට පටන් ගැනුණි. නැවතත් ස්වයංපෝෂිත ගෘහ ඒකකයක් ඇති කිරීම සඳහා දිවි නැගුම ජාතික වැඩසටහන කදිම තෝතැන්නක් විය.

එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය සියලු දෑ වෙළඳපොළෙන් මිලට ගැනීමට පෙළඹී සිටින ජනතාව තමනට හැකි අයුරින් ගෙවත්තෙන්ම වගා කටයුතු කර ගැනීමට මානසික පෙළඹීමක් ලබා සිටී. වස විසෙන් තොර පිරිසිදු සහ නැවුම් එළවළු, පලා වර්ග හා පළතුරු පරිභෝජනය සඳහා එය හොඳ ප්‍රවණතාවයක් බව පෙනේ. එමගින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති වීමට ද හේතු වේ.

කුකුළු පාලනය යටතේ තම ගෘහාශ්‍රිතවම දෛනික පරිභෝජනය සඳහා අවශ්‍ය බිත්තර සපුරා ගැනීමට හැකි වීමෙන්, ජනතාවට තම දෛනික ආහාර වේලට බිත්තර වලින් පෝෂණය ලබා ගැනීමට හැකි විය. එමෙන්ම කිරිගව පාලනය හේතුවෙන් පිටිකිරි භාවිතයට හුරුවී සිටි ජනතාව ක්‍රමයෙන් නැවුම් එළකිරි පරිභෝජනය කරන්නට පටන් ගැණුනි.

දිවි නැගුම වැඩසටහන වූ කලි ගෙවතු වගාවට පමණක් සීමා වූ වැඩසටහනක් නොවේ. එමගින් පවුලේ අභිවෘද්ධිය සඳහා වූ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වේ. ඒ අනුව ව්‍යවසාය සංවර්ධනය යටතේ ස්වයංරැකියාවල නියුතු වීමට කැමැති පුද්ගලයන්ට ඒ සඳහා පුහුණුව ලබා දී කුඩා කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙන ලදී. එමගින් රැකියා විරහිතව සිටි ජනතාවට රැකියාලාභීන් වූවා පමණක් නොව තම ශක්තියෙන් නැගී සිටිය හැකි අභිමානවත් පිරිසක්ද බිහි කරන ලදී.

මේ සියලු ජයග්‍රහණ මැද මෙම වැඩසටහන සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා බාධාකාරී අභියෝග ද නැතුවා නොවේ. ඕනෑම රටක විවිධාකාර වූ ජනකොටස් සිටිති. තම

ශක්තියෙන්ම නැඟී සිටීමට වෙර දරන මිනිසුන් සිටින සමාජයක අනුන් මත යැපෙමින්ම ජීවිත ගත කරන මිනිසුන්ද සිටිනු ලබයි. එවන් වූ මිනිසුන් පවුලේ දියුණුව අපේක්ෂා කරමින් දිරියෙන් නැඟී සිටින මිනිසුන්ට අත්වැල් සපයන මෙවන් වැඩසටහන් සඳහා අභියෝගයකි. කෙසේ හෝ එම ජනතාවද මෙම වැඩසටහන තුළ ගොනු ගත කළ යුතුය.

එමෙන්ම මෙම වැඩසටහන බිම් මට්ටමේ දී ක්‍රියාත්මකභාවයට පැමිණවීම සඳහා පත් කර සිටින පහසුකාරකයින්ගේ මැදිහත්වීම, මෙම වැඩසටහනේ සාර්ථකත්වය සඳහා අපේක්ෂිත මට්ටමට නොලැබීමද තවත් අභියෝගයකි.

අත්‍යාවශ්‍ය ආහාර ආනයනය සඳහා විශාල මුදලක් වැය කෙරෙන මෙරටදී වගා කළ හැකි මිරිස්, තල, උඳු, කවුපි, මුං, රට කජු වැනි භෝගයන්ගෙන් ස්වංපෝෂිත වීම මෙම වැඩසටහනේ ඉදිරි ඉලක්කය වේ.

වගු අංක 2.6.1

**දිවි නැගුම ජාතික වැඩසටහන - 2012**

| අනු අංකය | දිස්ත්‍රික්කය | කෘෂි. අංශය | පශුසම්පත් හා ධීවර අංශය | ව්‍යවසාය සංවර්ධන අංශය | වෙනත් වියදම් රු. මි. | මුළු වියදම රු.මි. |
|---|---|---|---|---|---|---|
| | | වියදම රු. මි. | වියදම රු. මි. | වියදම රු. මි. | | |
| 1 | කොළඹ | 13.88 | 7.22 | 3.78 | 25.98 | **50.86** |
| 2 | ගම්පහ | 41.12 | 18.75 | 14.42 | 81.16 | **155.44** |
| 3 | කළුතර | 30.56 | 10.83 | 8.49 | 58.96 | **108.85** |
| 4 | රත්නපුර | 42.14 | 12.69 | 10.33 | 5.56 | **70.72** |
| 5 | කෑගල්ල | 47.54 | 6.90 | 11.04 | 6.76 | **72.25** |
| 6 | කුරුණෑගල | 85.41 | 16.08 | 1.76 | 10.83 | **114.08** |
| 7 | පුත්තලම | 31.15 | 23.70 | 2.32 | 40.77 | **97.94** |
| 8 | අනුරාධපුරය | 26.79 | 15.01 | 4.91 | 18.70 | **65.41** |
| 9 | පොළොන්නරුව | 37.04 | 10.63 | 10.77 | 20.09 | **78.54** |
| 10 | ගාල්ල | 44.61 | 20.24 | 8.79 | 31.19 | **104.83** |
| 11 | මාතර | 92.18 | 9.29 | 3.31 | 47.06 | **151.84** |
| 12 | හම්බන්තොට | 66.27 | 8.38 | 6.85 | 65.20 | **146.70** |
| 13 | මොණරාගල | 24.44 | 8.68 | 10.77 | 2.83 | **46.71** |
| 14 | බදුල්ල | 54.20 | 26.40 | 16.23 | 35.96 | **132.79** |
| 15 | නුවරඑලිය | 44.54 | 17.04 | 8.34 | 2.30 | **72.22** |
| 16 | මහනුවර | 44.17 | 35.57 | 7.59 | - | **87.33** |
| 17 | මාතලේ | 32.78 | 11.57 | 13.22 | 24.75 | **82.32** |
| 18 | ත්‍රිකුණාමලය | 11.61 | 4.37 | 1.09 | 5.33 | **22.40** |
| 19 | මඩකලපුව | 15.89 | 10.50 | 3.45 | 10.52 | **40.35** |
| 20 | අම්පාර | 52.41 | 28.32 | 0.14 | 1.08 | **81.95** |
| 21 | වවුනියා | 0.83 | 2.51 | 2.20 | 3.66 | **9.20** |
| 22 | මන්නාරම | 2.90 | 1.00 | 1.88 | 1.00 | **6.78** |
| 23 | යාපනය | 8.63 | 11.81 | 8.85 | 2.00 | **31.29** |
| 24 | මුලතිව් | 5.00 | 7.49 | 3.93 | 1.30 | **17.72** |
| 25 | කිළිනොච්චි | 4.01 | 1.00 | 3.79 | 1.20 | **10.00** |
| 26 | වෙනත් රාජ්‍ය ආයතන සඳහා | 699.70 | 144.83 | 13.21 | 155.14 | **1,012.87** |
| 27 | ආර්ථික සං. අමා. | - | - | - | 41.59 | **41.59** |
| **එකතුව** | | **1,559.81** | **470.81** | **181.47** | **700.90** | **2,912.99** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

***** වෙනත් වියදම් යටතේ අවිච්ඡේද වියදම්, දිරිය පියස නිවාස වැඩසටහන, දිවි නැගුම පොල, වී ගබඩා නවීකරණය , ධීවර ඉන්ධන සහනාධාරය යනාදී වියදම් ඇතුලත්ව ඇත.

## 2.7. සමාජ ආරක්ෂණය - සමෘද්ධි වැඩසටහන

සංවර්ධන හා සුභසාධක වැඩසටහන් අතරින් මුළු දිවයින පුරා වෙසෙන අඩු ආදායම්ලාභීන් උදෙසා ක්‍රියාත්මක වන සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන දරිද්‍රතාවය තුරන් කිරීමේ අදිටනින් ක්‍රියාවට නැගෙන සමෘද්ධි වැඩසටහනේ සහයක වැඩසටහනකි. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මෙම වැඩසටහනට ක්‍රියාවට නගනු ලබයි. ඒ අනුව සමෘද්ධි සහනාධාරය ලබාදෙන පවුල්වලට ප්‍රතිලාභ ලබාදීම අරමුණු කර ගනිමින් 2012 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන වැඩසටහන් පහත පරිදි වේ.

- සමෘද්ධි සහනාධාර වැඩසටහන
- මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන ( පෝෂණ මල්ල වැඩසටහන )
- සමාජ ආරක්ෂණ වැඩසටහන

### 2.7.1 සමෘද්ධි සහනාධාර වැඩසටහන

වර්ෂ 1995 සිට සමෘද්ධි සහනාධාර වැඩසටහන දිවයින පුරා පැතිරී සිටින අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන අතර 2012 අයවැය යෝජනා අනුව මෙතෙක් ලබා දුන් සමෘද්ධි සහනාධාර මුදල් පහත සඳහන් ආකාරයෙන් වැඩි කරන ලදි.

වගු අංක 2.7.1

| පවුලේ සාමාජික සංඛ්‍යාව | සහනාධාර වටිනාකම රු: |
|---|---|
| 1-2 | 750 |
| 3-5 | 1200 |
| 5 ට වැඩි | 1500 |
| සව්බල ගැන්වූ පවුල් සඳහා | 210 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

සමෘද්ධි සහනාධාර වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් ප්‍රතිලාභීන් ඉතිරි කිරීමට හා ආයෝජනයට පෙළඹවීමේ අරමුණින් සමෘද්ධි මුද්දරය වෙනුවට ඔවුනට හිමි මුදල්, සමෘද්ධි බැංකුවල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කිරීමේ ක්‍රමයක් 2012 අප්‍රේල් මස සිට හඳුන්වා දෙන ලදි. ඒ අනුව 2012 වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ රු.මි. 10,553 ක් වටිනා ආධාර මුදල් පවුල් 1,549,107 අතරේ බෙදා දී ඇත.

සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ 2006 - 2012 වර්ෂය දක්වා ලබා දෙන ලද ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

වගු අංක 2.7.2

| වර්ෂය | සමෘද්ධි සහනාධාර වැඩසටහන | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | වටිනාකම රු.මි. |
| 2006 | 1,916,594 | 9,244 |
| 2007 | 1,844,660 | 9,423 |
| 2008 | 1,631,113 | 9,967 |
| 2009 | 1,600,786 | 9,274 |
| 2010 | 1,572,129 | 9,241 |
| 2011 | 1,541,575 | 9,044 |
| 2012 | 1,549,107 | 10,553 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### 2.7.2 මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන ( පෝෂණ මල්ල වැඩසටහන )

“මහින්ද චින්තන” ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ වන අඩු ආදායම්ලාභි පවුල්වල, කිරි දෙන මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම සඳහා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන යටතේ අලුතින් දරුවන් ලද මව්වරුන්ට පෝෂ්‍යදායක ආහාර වේලක් ලබා ගැනීම සඳහා පෝෂණ මුද්දරයක් ලබා දීම සිදු කරන අතර 2012 වර්ෂය සඳහා රු. මි. 249.60 ක් වැය කරමින් ප්‍රතිලාභීන් 55,299 ක් සඳහා පෝෂණ මුද්දර ලබා දී ඇත.

### මච්චරුන් සඳහා පෝෂණ වැඩසටහන - 2008 - 2012

වගු අංක 2.7.3

| වසර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු.මි |
|---|---|---|
| 2008 | 60,050 | 385.70 |
| 2009 | 76,620 | 505.00 |
| 2010 | 71,471 | 388.00 |
| 2011 | 43,252 | 360.00 |
| 2012 | 55,299 | 249.60 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### 2.7.3 සමාජ ආරක්ෂණ වැඩසටහන

සමෘද්ධි ප්‍රතිලාභියා හෝ ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයින් ඔවුන්ගේ ආර්ථික හා සාමාජික කාර්යයන්හි පූර්ණ ලෙස කැපවීමට අවශ්‍ය රැකවරණය, සමාජීය ආරක්ෂාව සහතික කිරීම හා ස්වශක්තියෙන් නැගීසිටීමට අවශ්‍ය උපකාර ලබාදීමේ අරමුණින් සමාජ ආරක්ෂණ වැඩසටහන ආරම්භ කරන ලදි. සාමාජිකයින් දෙදෙනෙකුට වඩා සිටින පවුල් මේ සඳහා දායක කර ගනු ලබන අතර දරු උපතකදි, විවාහයකදි, මරණයකදී ,රෝහල් ගතවීමකදී හා උසස් අධ්‍යාපනයේදි යනාදි විශේෂ අවස්ථාවන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන මගින් ප්‍රතිලාභ ලබා දී ඇත . ඒ අනුව 2012 වර්ෂයේ ප්‍රතිලාභ බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

### සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන - 2012

වගු අංක 2.7.4

| දීමනා හා ප්‍රතිලාභ | වියදම රු.මි. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| උපත් | 3.64 | 729 |
| විවාහ | 9.89 | 3,297 |
| රෝහල් ගත කිරීම් | 9.79 | 3,449 |
| මරණ | 33.02 | 3,303 |
| ශිෂ්‍යත්ව | 28.72 | 26,739 |

මූලාශ්‍රය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

# 3

# ගම නැගුම - සවිබල ගැන්වුන ප්‍රජාවක්

# 3. ගම නැගුම - සවිබල ගැන්වුන ප්‍රජාවක්

රජයේ සංවර්ධන සැලසුම්වල කේන්ද්‍රිය මධ්‍යස්ථානය ලෙස ගම සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි සොඳුරු බවින් සෙනෙහසින් හා සෞන්දර්යයෙන් පිරි ගමක් 2016 දී බිහි කිරීම උදෙසා "ගම නැගුම" වැඩසටහන 2006 වර්ෂයේදී ආරම්භ කරන ලදි.

ග්‍රාමීය නාගරික සංවර්ධන විෂමතාවයන් අවම කිරිම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරන ලද ගම නැගුම වැඩසටහන අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය යන ප්‍රධාන ක්ෂෙත්‍ර 03 යටතේ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන වන සමෘද්ධි අධිකාරිය, උඩරට සංවර්ධන දෙපාර්තමේන්තුව, දක්ෂිණ සංවර්ධන අධිකාරිය වැනි ආයතන හරහා 2011 වර්ෂය දක්වාම ක්‍රියාත්මක විය.

2012 වර්ෂය වන විට ගම නැගුම වැඩසටහන නව ප්‍රවේශයකට යමින් ග්‍රාමීය ආර්ථික ක්‍රියාකාරකම් වලට සෘජු හා වක්‍ර ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කර ගනිමින් කුඩා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනක් ලෙස "එක ගමකට - එක වැඩක්" යන වැඩ සටහන ආරම්භ කරන ලදි.

මෙහිදි රුපියල් මිලියනයක වටිනාකමින් යුත් සංවර්ධන ව්‍යාපෘතියක් එක් ගමක ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදි. ඒ අනුව දිවයිනේ සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ව්‍යාපෘති 14,000 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා දෙන ලදී. විවිධ තාක්ෂණික හේතූන් නිසා අනුමත කරන ලද ව්‍යාපෘති ප්‍රමාණයෙන් ව්‍යාපෘති 13,098 ක් ආරම්භ කර ඉන් ව්‍යාපෘති 11,819 ක් නිම කිරීමට සමත් වී ඇත. ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ග්‍රාමිය විදුලි බල සම්පාදනය, සුළු වාරි මාර්ග, පානීය ජල සම්පාදනය, මාතෘ හා ළමා සායන පහසුකම්, පෙර පාසල් පහසුකම් වැඩි දියුණු කිරීම, ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා පිටි හා උද්‍යාන පහසුකම් සංවර්ධනය වැනි සංරචක යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.




ඉදිකරන ලද ළමා හා මාතෘ සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය
නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
අනුරාධපුර දිස්ත්‍රික්කය



ප්‍රජා ජල පහසුකම් සැපයීම
දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 2012 වසර තුල "එක ගමකට - එක වැඩක් " වැඩසටහනෙහි ව්‍යාපෘති බෙදීගොස් ඇති ආකාරය

රූප සටහන් අංක 3.1.1




මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 3.1. ග්‍රාමීය මාර්ග සංවර්ධනය

"එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ප්‍රමුඛ අවධානයක් යොමුකරන ලද්දේ ග්‍රාමීය මාර්ග සංවර්ධනයටයි. එමගින් ගොඩනැගෙන නව අන්තර් සම්බන්ධතා, ගෘහ ආර්ථික ඒකක තුල නිපදවෙන භාණ්ඩ හා සේවාවන් බෙදාහැරීම සඳහා පුළුල් ප්‍රවේශයක් විවෘත වන අතර ගම්මානවල පැන නගිමින් තිබෙන නව අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මාර්ග සංවර්ධනය මහඟු රුකුලක් වී ඇත. එමගින් දේශීය හා විදේශීය සංචාරකයින්ට නව සංචාරක ආකර්ෂණීය ස්ථාන වෙත ඉතා පහසුවෙන් හා කෙටි වේලාවක් තුල ගමන් කිරීමට පහසුකම් ඇතිවීම, ග්‍රාමීය ප්‍රදේශවල නව කර්මාන්ත බිහිවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වීම සහ ගමත් නගරයත් අතර සංවර්ධන විෂමතාවයන් අවම කර ගැනීමට හැකිවීම ඉන් ලදහැකි ප්‍රතිලාභයන් වේ.

2012 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ මාර්ග, පාලම්, බෝක්කු, යනාදී ව්‍යාපෘති 9,310 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 7,652 කි. එමගින් පුද්ගලයින් 3,618,517 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

## ග්‍රාමීය මාර්ග සංවර්ධනය (මාර්ග, පාලම්, බෝක්කු)

## 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.1.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 451 | 406 | 331.00 |
| ගම්පහ | 980 | 936 | 722.20 |
| කළුතර | 616 | 589 | 444.65 |
| රත්නපුර | 484 | 471 | 430.69 |
| කෑගල්ල | 513 | 502 | 380.93 |
| කුරුණෑගල | 921 | 755 | 529.02 |
| පුත්තලම | 342 | 313 | 277.37 |
| ගාල්ල | 753 | 704 | 516.24 |
| මාතර | 550 | 472 | 352.4 |
| හම්බන්තොට | 372 | 360 | 282.57 |
| මොණරාගල | 250 | 248 | 207.16 |
| බදුල්ල | 498 | 489 | 426.19 |
| නුවරඑළිය | 379 | 340 | 276.31 |
| මහනුවර | 1003 | 935 | 818.67 |
| මාතලේ | 458 | 445 | 424.85 |
| අනුරාධපුර | 343 | 310 | 242.54 |
| පොළොන්නරුව | 208 | 208 | 190.88 |
| ත්‍රිකුණාමලය | 165 | 160 | 162.75 |
| මඩකලපුව | 270 | 270 | 260.40 |
| අම්පාර | 488 | 397 | 375.04 |
| **එකතුව** | **10044** | **9310** | **7652.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්





ඉදිකරන ලද මලිගස්පෙ මොරගොඩ ඇළට සමාන්තර මාර්ගය
කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
ගාල්ල දිස්ත්‍රික්කය

ඉදිකරන ලද පනනාවත්ත මාර්ගය
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
කෑගල්ල දිස්ත්‍රික්කය

## 3.2. ප්‍රජා ජල සම්පාදනය

නිරෝගී සෞඛ්‍ය සම්පන්න ග්‍රාමීය ජනතාවක් බිහිකරලීමට අත්‍යාවශ්‍ය වන පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ජල ටැංකි සැකසීම, පොදු ලිං සැකසීම, ජල නල එලීම "එක ගමකට - එක වැඩක්" වැඩසටහන තුලින් සිදු කරන ලදී.

2012 වර්ෂයේදී ප්‍රජා ජල සම්පාදනය යටතේ ව්‍යාපෘති 451 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 367 කි. එමගින් ප්‍රතිලාභීන් 252,799 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

### ප්‍රජා ජල සම්පාදනය -2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.2.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 6 | 4 | 4.90 |
| ගම්පහ | 12 | 7 | 9.92 |
| කළුතර | 58 | 51 | 41.04 |
| රත්නපුර | 32 | 28 | 25.31 |
| කෑගල්ල | 28 | 26 | 19.67 |
| කුරුණෑගල | 921 | 755 | 529.02 |
| පුත්තලම | 53 | 43 | 21.73 |
| ගාල්ල | 15 | 11 | 6.72 |
| මාතර | 10 | 5 | 2.59 |
| හම්බන්තොට | 21 | 20 | 17.41 |
| මොණරාගල | 7 | 5 | 6.85 |
| බදුල්ල | 23 | 19 | 15.92 |
| නුවරඑළිය | 49 | 40 | 30.26 |
| මහනුවර | 56 | 43 | 40.39 |
| මාතලේ | 15 | 11 | 11.07 |
| අනුරාධපුර | 38 | 30 | 22.4 |
| පොළොන්නරුව | 11 | 11 | 6.80 |
| ත්‍රිකුණාමලය | 10 | 10 | 9.73 |
| මඩකලපුව | 3 | 3 | 2.58 |
| අම්පාර | 4 | 1 | 1.16 |
| **එකතුව** | 583 | 451 | 367.00 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්



සපයන ලද පානීය ජල පහසුකම් - පිංතාලිය හංදියේ සිට දඹේයාය දක්වා
බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මොණරාගල දිස්ත්‍රික්කය



දීර්ඝ කරන ලද කනිච්චාගල පානීය ජල ව්‍යාපෘතිය
තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 3.3. සුළු පරිමාණ වාරිමාර්ග සංවර්ධනය

මේ යටතේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන ජලය රඳවා ගැනීම, බෙදා හැරීම සඳහා වැව් අමුණු හා ඇල මාර්ග ඉදිකිරීම, පිළිසකර කිරීම සිදුවේ. "එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ සිදුකරනු ලබන මෙම සංවර්ධන වැඩසටහන තුලින් පුරන් කුඹුරු අස්වැද්දීම මගින් ගොවි ප්‍රජාවගේ ආර්ථිකය සරුසාර වී ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ යයි. එමගින් රට ස්වයංපෝෂිත කිරීමේ ජාතික අරමුණටද ඉමහත් දායකත්වයක් ලබාදේ. අපද්‍රව්‍ය සහිත ඇල මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම තුලින් පරිසර දූෂණය අවම වීම, ඩෙංගු වැනි වසංගත රෝග මැඩලීමට හැකිවීම, ගංවතුර ආපදා හානි අවම කිරීමටද හේතුවෙයි.

2012 වර්ෂයේදී සුළු වාරිමාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 605ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 542 කි. එමගින් ප්‍රතිලාභීන් 243,110 කට පමණ ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව උදාකර ඇත.

### සුළු පරිමාණ වාරිමාර්ග සංවර්ධනය 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.3.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 737 | 605 | 542 |
| ගම්පහ | 12 | 10 | 9.19 |
| කළුතර | 12 | 12 | 9.01 |
| රත්නපුර | 9 | 8 | 7.44 |
| කෑගල්ල | 5 | 5 | 0 |
| කුරුණෑගල | 258 | 192 | 194.65 |
| පුත්තලම | 35 | 31 | 30.64 |
| ගාල්ල | 49 | 39 | 30.98 |
| මාතර | 39 | 29 | 26.07 |
| හම්බන්තොට | 107 | 103 | 88.61 |
| මොණරාගල | 16 | 14 | 14.63 |
| බදුල්ල | 8 | 8 | 7.56 |
| නුවරඑළිය | 6 | 4 | 2.32 |
| මහනුවර | 12 | 12 | 11.70 |
| මාතලේ | 22 | 21 | 19.85 |
| අනුරාධපුර | 85 | 66 | 47 |
| පොළොන්නරුව | 18 | 18 | 13.19 |
| ත්‍රිකුණාමලය | 15 | 13 | 11.72 |
| මඩකලපුව | 3 | 3 | 2.86 |
| අම්පාර | 17 | 11 | 10.89 |
| **එකතුව** | **737** | **605** | **542.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### නිමකරන ලද ව්‍යාපෘතියක්



කොන්ක්‍රීට් කරන ලද 9 සී කෙත් ඇළෙහි ඉතිරි කොටස

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

හම්බන්තොට දිස්ත්‍රික්කය

### 3.4. මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම්

සෞඛ්‍ය සම්පන්න නිරෝගී මවුවරුන් හා දරු පරපුරක් බිහි කිරීමේ අරමුණින් යුතුව ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් වැඩිදියුණු කිරීම "එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ක්‍රියාවට නංවන ලදී. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට සියළු පහසුකම් වලින් සමන්විත එක් මාතෘ සායන මධ්‍යස්ථානයක් හෝ ස්ථාපිත කිරීමටත්, ග්‍රාමීය ප්‍රදේශවල තාවකාලිව ස්ථාන වල පවත්වාගෙන යන සායන සඳහා ස්ථිර ගොඩනැගිලි පහසුකම් ඇතිකිරීමත් දැනට පවතින අඩුපාඩුකම් සහිත මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් මේ යටතේ සිදු කර ඇත.

මෙම වැඩසටහන යටතේ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන සඳහා පිරිසිදු පානීය ජලය ලබාදීම, ආසන පහසුකම් ලබාදීම, දරුවන්ගේ ඇඳුම් මාරුකිරීම සඳහා සුදුසු ස්ථාන පහසුකම් ඇතිකිරීම, දරුවන්ට ක්‍රීඩා කිරීමේ ස්ථාන, පිරිසිදු සනීපාරක්ෂක පහසුකම්, විදුලි පංකා හා රූපවාහිනී ආදී පහසුකම් ලබාදීම සිදු කරන ලදී.

2012 වර්ෂයේදී මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 118 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 90 කි. එමගින් ප්‍රතිලාභීන් 93,439 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

#### මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.4.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 6 | 6 | 5.6 |
| ගම්පහ | 4 | 4 | 3.61 |
| කළුතර | 4 | 3 | 1.17 |
| රත්නපුර | 6 | 6 | 5.83 |
| කෑගල්ල | 3 | 3 | 0 |
| කරුණෑගල | 39 | 31 | 23.92 |
| පුත්තලම | 8 | 7 | 6.21 |
| ගාල්ල | 8 | 7 | 2.85 |
| මාතර | 6 | 4 | 2.5 |
| හම්බන්තොට | 4 | 4 | 1.95 |
| මොණරාගල | 8 | 8 | 7.65 |
| බදුල්ල | 5 | 4 | 3.47 |
| නුවරඑළිය | 9 | 8 | 3.89 |
| මහනුවර | 9 | 6 | 6.30 |
| අනුරාධපුර | 9 | 8 | 6.36 |
| පොළොන්නරුව | 1 | 1 | 0.43 |
| ත්‍රිකුණාමලය | 1 | 1 | 0.98 |
| මඩකලපුව | 6 | 6 | 5.66 |
| අම්පාර | 2 | 1 | 1.29 |
| **එකතුව** | 138 | 118 | 90.00 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්



ඉදිකරන ලද ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානය
ගම්පහ දිස්ත්‍රික්කය

## 3.5. පෙර පාසල් සංවර්ධනය

කුඩා දරුවන් සමාජයට හුරු කරවීම, පාසල් යන්නට පෙර අවශ්‍ය වන සමාජ අධ්‍යාපනික පසුබිම සකස් කිරීම, කුඩාකල සිටම දේශීය කැම බීමට සිරිත් විරිත් වලට සහ යහගුණයන්ට පුරුදු පුහුණු කිරීම, සමාජයේ හැසිරීමේදී පිළිපැදිය යුතු සංස්කෘතික ගුණාංග හුරුකිරීම, තම දක්‍ෂතා ඔප් නැංවීමට අවකාශ ලබාදීම, අන් මතයන්ට සහ අන් අයට ගරු කිරීම ඉගැන්වීම, ආගම දහමට අනුව අධ්‍යාත්මික පෝෂණයක් කුඩාකල සිටම ඇති කිරීම සඳහා පෙර පාසල් සංවර්ධනය වැදගත් වේ.

ඒ අනුව"එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් වියේ පසුවන ළමුන්ගේ අධ්‍යාපනික, ක්‍රීඩා හා සනීපාරක්‍ෂක අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය, පෙර පාසල් සඳහා සෙල්ලම් මිදුල් හා ඉගැන්වීමේ උපකරණ ලබාදීම ආදිය සිදුකරන ලදී.

2012 වර්ෂයේදී පෙර පාසල් පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 325 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 266 කි. එමගින් ප්‍රතිලාභීන් 117,118 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

## පෙර පාසල් සංවර්ධනය කිරීම 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.5.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 20 | 18 | 16 |
| ගම්පහ | 13 | 12 | 10.86 |
| කළුතර | 19 | 10 | 6.24 |
| රත්නපුර | 6 | 6 | 5.45 |
| කෑගල්ල | 5 | 4 | 0.39 |
| කුරුණෑගල | 33 | 21 | 17.72 |
| පුත්තලම | 25 | 20 | 16.30 |
| ගාල්ල | 13 | 11 | 7.09 |
| මාතර | 11 | 7 | 5.78 |
| හම්බන්තොට | 37 | 34 | 23.44 |
| මොණරාගල | 23 | 23 | 21.45 |
| බදුල්ල | 17 | 15 | 12.14 |
| නුවරඑළිය | 19 | 18 | 12.42 |
| මහනුවර | 23 | 20 | 18.00 |
| අනුරාධපුර | 70 | 66 | 54.98 |
| පොළොන්නරුව | 15 | 15 | 13.10 |
| ත්‍රිකුණාමලය | 6 | 4 | 3.5 |
| මඩකලපුව | 13 | 13 | 11.62 |
| අම්පාර | 13 | 8 | 9.19 |
| **එකතුව** | 381 | 325 | 266.00 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 3.6. විදුලිබල පහසුකම් සංවර්ධනය

"එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයේ ඉතා වැදගත් අංශයක් වන විදුලිබල පහසුකම් ලබාදීම කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමුකරමින් මෙතෙක් විදුලිබලය නොමැති ජනතාව වෙසෙන ප්‍රදේශ සඳහා විදුලිබල පහසුකම් ලබාදීම සිදුකරන ලදී. එමගින් අඳුරේ ගිලී පැවති ජන ජීවිතවලට විශාල ආලෝකයක් ලැබුනු අතර ග්‍රාමීය ජීවනෝපාය සවර්ධනය වීම, තොරතුරු තාක්‍ෂණය හා පරිගණක පහසුකම් ලබාගත හැකිවීම, ග්‍රාමීය ආයෝජන ප්‍රවර්ධනය, යනාදී විවිධ ක්‍ෂෙත්‍රයන්හි සංවර්ධනයක් ඇතිවිය.

2012 වර්ෂයේදී විදුලිබල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 217 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 194 කි. එමගින් ප්‍රතිලාභීන් 7,791 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

## විදුලිබල පහසුකම් සංවර්ධනය 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.6.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කුරුණෑගල | 126 | 126 | 107.39 |
| පුත්තලම | 62 | 61 | 57.90 |
| මොණරාගල | 4 | 4 | 3.99 |
| නුවරඑළිය | 2 | 1 | 1.00 |
| මාතලේ | 1 | 1 | 1.00 |
| අනුරාධපුර | 23 | 16 | 14.63 |
| පොළොන්නරුව | 2 | 2 | 1.97 |
| මඩකලපුව | 3 | 3 | 2.94 |
| අම්පාර | 3 | 3 | 2.99 |
| **එකතුව** | **226** | **217** | **194.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 3.7. ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය

වඩාත් සමබර මානසිකත්වයක් පවතින ජනතාවක් වෙසෙන ජන සමාජය අභ්‍යන්තර මෙන්ම බාහිර අවුල් වියවුල් නොමැති ගමක් ලෙස හඳුන්වාදිය හැක. එවන් සමාජ වට පිටාවක් සහිත ගමක් නිර්මාණය කිරීමට එම ගමේ ජනතාව අධ්‍යාත්මික හා සමාජීය වශයෙන් ශක්තිමත් කළ යුතුය.

ග්‍රාමීය ජන සමාජයේ පවතින දෛනික වූද, අත්‍යාවශ්‍ය වූද, සමාජීය හා අධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාත්මක වීමෙන් එම ගම සංවර්ධනයේ අරුණාලෝකයෙන් යුක්ත ගමක් බවට පත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වූ "ගම නැගුම" සංවර්ධන වැඩසටහනේ තවත් එක් වැදගත් සංවරකයක් ලෙස "ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය" හඳුන්වාදිය හැක.

ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය මගින් යහපත් ජන සමාජයක් බිහිකරලීමේ අරමුණින් "එක ගමකට - එක වැඩක් " වැඩසටහන යටතේ ප්‍රජාශාලා, පුස්තකාල, බහු කාර්ය ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය කරඇත. මේ මගින් ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සැලසෙන අතර ඔවුන්ගේ ගැටළු නිරාකරණය කර ගැනීමට, අවශ්‍ය දැනුම ලබාගැනීමට පහසුකම් සැපයෙන අතරම ග්‍රාමීය ප්‍රදේශ අංගසම්පූර්ණ සෞභාග්‍යමත් ප්‍රදේශ බවට පත්ව තිබේ.

2012 වර්ෂයේදී ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 654 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 501 කි. එමගින් ප්‍රතිලාභීන් 632,063 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

## ගොඩනැගිලි පහසුකම් සංවර්ධනය 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.7.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 41 | 31 | 28.70 |
| ගම්පහ | 65 | 40 | 20.99 |
| කළුතර | 46 | 29 | 13.67 |
| කෑගල්ල | 16 | 12 | 4.44 |
| කුරුණෑගල | 83 | 52 | 39.61 |
| පුත්තලම | 17 | 15 | 12.78 |
| ගාල්ල | 42 | 33 | 19.62 |
| මාතර | 48 | 30 | 22.49 |
| හම්බන්තොට | 23 | 23 | 18.43 |
| මොණරාගල | 10 | 10 | 8.20 |
| බදුල්ල | 13 | 13 | 10.09 |
| නුවරඑළිය | 18 | 17 | 9.21 |
| මහනුවර | 63 | 53 | 43.24 |
| මාතලේ | 45 | 43 | 40.63 |
| අනුරාධපුර | 101 | 86 | 67.13 |
| පොළොන්නරුව | 33 | 33 | 20.23 |
| ත්‍රිකුණාමලය | 87 | 86 | 77.98 |
| මඩකලපුව | 29 | 29 | 27.08 |
| අම්පාර | 25 | 19 | 16.04 |
| **එකතුව** | **805** | **654** | **501.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## නිමකරන ලද ව්‍යාපෘති කිහිපයක්



ඉදිකරන ලද ප්‍රජා ශාලාව
මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
ගම්පහ දිස්ත්‍රික්කය

### 3.8. ක්‍රීඩාපිටි /උද්‍යාන පහසුකම් සංවර්ධනය

නිසි ශාරීරික යෝග්‍යතාවයෙන් පිරි නිරෝගී ජනතාවක් බිහිකරලීමට ක්‍රීඩා හා ව්‍යායාම් ආදිය ඉතා වැදගත් වන අතර මේ සඳහා අවශ්‍ය වන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම, උද්‍යාන පහසුකම් ඇතිකිරීම "එක ගමකට - එක වැඩක්" වැඩසටහන යටතේ සිදු කෙරේ. මේ තුලින් ජනාකීර්ණ ප්‍රදේශවල පුද්ගලයින් නිකරුනේ ගැවසීම වැළකෙන අතර මහාමාර්ග ආදියේ ක්‍රීඩා කටයුතු සිදුකිරීමේදී ඇතිවන අනතුරු වලින්ද ආරක්ෂාව සැලසේ. පුද්ගලයාට මානසික ආතතියෙන් මිදීමට හැකිවීමද ඉන් ලැබී ඇති ප්‍රතිලාභයකි.

2012 වර්ෂයේදී ක්‍රීඩාපිටි /උද්‍යාන පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 139 ක වැඩ නිමකර ඇති අතර ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 107 කි. එමගින් ප්‍රතිලාභීන් 132,009 කට පමණ ප්‍රතිලාභ සැලසී ඇත.

#### ක්‍රීඩාපිටි /උද්‍යාන පහසුකම් සංවර්ධනය 2012.12.31 දිනට (දිස්ත්‍රික් අනුව)

වගු අංක 3.8.1

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| කොළඹ | 10 | 9 | 9.8 |
| ගම්පහ | 14 | 8 | 4.34 |
| කළුතර | 10 | 9 | 5.34 |
| කෑගල්ල | 6 | 5 | 1.21 |
| කුරුණෑගල | 12 | 5 | 5.35 |
| පුත්තලම | 7 | 7 | 6.33 |
| ගාල්ල | 13 | 11 | 7.72 |
| මාතර | 6 | 5 | 2.93 |
| හම්බන්තොට | 11 | 10 | 10.15 |
| මොණරාගල | 3 | 3 | 1.93 |
| බදුල්ල | 3 | 3 | 0.90 |
| නුවරඑළිය | 7 | 7 | 4.88 |
| මහනුවර | 10 | 7 | 7.42 |
| අනුරාධපුර | 18 | 18 | 15.33 |
| පොළොන්නරුව | 6 | 6 | 3.94 |
| ත්‍රිකුණාමලය | 8 | 7 | 1.00 |
| මඩකලපුව | 16 | 16 | 15.43 |
| අම්පාර | 8 | 3 | 4.17 |
| **එකතුව** | **168** | **139** | **107.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ගම නැගුම වැඩසටහන යටතේ 2012 වසර තුල නිමකල ව්‍යාපෘති (දිස්ත්‍රික්ක අනුව)

වගු අංක 3.8.2

| දිස්ත්‍රික්කය | මාර්ග පාලම් බෝක්කු | ජල සම්පාදන | සුළු වාරිමාර්ග | මාතෘ නිවාස | පෙර පාසල් | විදුලිය | ගොඩනැ ගිලි | ක්‍රීඩා පිටි/ උද්‍යාන | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 406 | 4 | 10 | 6 | 18 | 0 | 31 | 9 | 407.28 |
| ගම්පහ | 936 | 7 | 12 | 4 | 12 | 0 | 40 | 8 | 781.91 |
| කළුතර | 589 | 51 | 6 | 3 | 10 | 0 | 29 | 9 | 516.79 |
| රත්නපුර | 471 | 28 | 8 | 6 | 6 | 0 | 0 | 0 | 506.38 |
| කෑගල්ල | 502 | 26 | 5 | 3 | 4 | 0 | 12 | 5 | 406.64 |
| කුරුණෑගල | 755 | 83 | 192 | 31 | 21 | 126 | 52 | 5 | 1010.14 |
| පුත්තලම | 313 | 43 | 31 | 7 | 20 | 61 | 15 | 7 | 433.01 |
| අනුරාධපුරය | 310 | 30 | 66 | 8 | 66 | 16 | 86 | 18 | 474.97 |
| පොළොන්නරුව | 208 | 11 | 18 | 1 | 15 | 2 | 33 | 6 | 251.52 |
| ගාල්ල | 704 | 11 | 39 | 7 | 11 | 0 | 33 | 11 | 592.4 |
| මාතර | 472 | 5 | 29 | 4 | 7 | 0 | 30 | 5 | 423.57 |
| හම්බන්තොට | 360 | 20 | 103 | 4 | 34 | 0 | 23 | 10 | 444.57 |
| මොණරාගල | 248 | 5 | 14 | 8 | 23 | 4 | 10 | 3 | 269.86 |
| බදුල්ල | 489 | 19 | 8 | 4 | 15 | 0 | 13 | 3 | 485.06 |
| නුවරඑළිය | 340 | 40 | 4 | 8 | 18 | 1 | 17 | 7 | 344.15 |
| මහනුවර | 935 | 43 | 12 | 6 | 20 | 0 | 53 | 7 | 945.8 |
| මාතලේ | 445 | 11 | 21 | 0 | 0 | 1 | 43 | 0 | 501.32 |
| ත්‍රිකුණාමලය | 160 | 10 | 13 | 1 | 4 | 0 | 86 | 7 | 200.62 |
| මඩකලපුව | 270 | 3 | 3 | 6 | 13 | 3 | 29 | 16 | 338.91 |
| අම්පාර | 397 | 1 | 11 | 1 | 8 | 3 | 19 | 3 | 421.77 |
| **එකතුව** | **9310** | **451** | **605** | **118** | **325** | **217** | **654** | **139** | **9757.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ගමනැගුම වැඩසටහනේ ආංශික ප්‍රගතිය 2006-2011

| දිස්ත්‍රික්කය | මාර්ග | | ජල සම්පාදන | | සුළු වාරිමාර්ග | | විදුලිය | | මාතෘ නිවාස | | පාසල් වැසිකිළි ය කැසිකිළි | | පෙර පාසල් | | පොදු ගොඩනැගිලි | | ජීවනෝපාය සංවර්ධනය | | සමාජ සංවර්ධනය | | වෙනත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම:රුගමිග* |
| කොළඹ | 3208 | 1171.84 | 123 | 36.37 | 433 | 130.84 | 14 | 6.41 | 100 | 86.95 | 306 | 132.96 | 268 | 8.85 | 22 | 5.98 | 26 | 11.72 | 91 | 16.05 | 0 | 0 | **4591** | **1607.97** |
| ගම්පහ | 8059 | 3542.31 | 111 | 78.58 | 717 | 252.74 | 16 | 3.24 | 0 | 0 | 972 | 172.56 | 263 | 15.13 | 66 | 25.56 | 49 | 9.17 | 35 | 62.33 | 10 | 7.98 | **10298** | **4169.6** |
| කළුතර | 4306 | 1792.04 | 92 | 83.42 | 307 | 79.15 | 110 | 45.43 | 30 | 10.88 | 356 | 37.44 | 430 | 7.68 | 16 | 3.6 | 1 | 0.28 | 62 | 28.79 | 0 | 0 | **5710** | **2088.71** |
| රත්නපුර | 4232 | 1772.83 | 121 | 35.77 | 813 | 303.68 | 12 | 10.31 | 157 | 55.24 | 417 | 55.87 | 472 | 8.4 | 16 | 3.09 | 450 | 46.22 | 267 | 51.88 | 2 | 0.6 | **6959** | **2343.89** |
| කෑගල්ල | 5126 | 1474.17 | 118 | 42.43 | 695 | 184.8 | 104 | 34.54 | 120 | 53.34 | 271 | 39.95 | 353 | 8.45 | 51 | 33.94 | 1676 | 36.09 | 241 | 44.74 | 0 | 0 | **8755** | **1952.45** |
| කුරුණෑගල | 5231 | 1643.23 | 380 | 216.45 | 812 | 316.34 | 2010 | 718.19 | 140 | 60.51 | 379 | 115.58 | 439 | 18.28 | 679 | 222.07 | 6451 | 115.3 | 980 | 19.6 | 65 | 39.99 | **17566** | **3485.54** |
| පුත්තලම | 2219 | 1043.61 | 259 | 173.47 | 468 | 124.97 | 874 | 328.93 | 118 | 63.03 | 313 | 88.18 | 210 | 11.87 | 22 | 8.77 | 713 | 46.72 | 514 | 110.32 | 47 | 23.59 | **5757** | **2023.46** |
| ගාල්ල | 4658 | 2665.87 | 284 | 43.5 | 376 | 171.53 | 77 | 30.34 | 19 | 19.62 | 327 | 55.27 | 347 | 9.19 | 102 | 88.56 | 7 | 9.8 | 546 | 113.02 | 5 | 0.27 | **6748** | **3206.97** |
| මාතර | 4298 | 1931.76 | 229 | 84.56 | 599 | 177.43 | 155 | 56.91 | 4 | 43.03 | 799 | 66.18 | 250 | 8.76 | 76 | 77.23 | 79 | 8.66 | 460 | 20.68 | 15 | 2.32 | **6964** | **2477.52** |
| හම්බන්තොට | 2303 | 1509.87 | 262 | 83.93 | 794 | 438.7 | 37 | 24.73 | 85 | 47.25 | 1035 | 84.3 | 226 | 7.8 | 125 | 115.16 | 195 | 61.08 | 174 | 50.49 | 0 | 51.94 | **5236** | **2475.25** |
| මොණරාගල | 2074 | 953.48 | 242 | 67.97 | 303 | 169.06 | 272 | 244.2 | 4 | 12.77 | 543 | 97.36 | 182 | 4.94 | 22 | 45.18 | 233 | 24 | 597 | 78.63 | 6 | 9.73 | **4478** | **1707.32** |
| බදුල්ල | 3239 | 1503.37 | 157 | 72.24 | 274 | 94.65 | 22 | 63.62 | 97 | 33.84 | 297 | 25.7 | 267 | 4.43 | 338 | 97.78 | 596 | 78.85 | 5 | 2.21 | 3 | 1.77 | **5295** | **1978.46** |
| නුවර එළිය | 2620 | 1099.25 | 180 | 61.16 | 212 | 49.28 | 121 | 84.5 | 41 | 16.14 | 264 | 30.48 | 185 | 2.7 | 285 | 48.97 | 398 | 40.79 | 10 | 3.42 | 2 | 2.92 | **4318** | **1439.61** |
| මහනුවර | 4547 | 1502.08 | 190 | 39.54 | 805 | 223.36 | 35 | 12.6 | 118 | 85.36 | 473 | 115.11 | 459 | 16.82 | 154 | 364.52 | 14 | 101.95 | 190 | 66.25 | 8 | 3.34 | **6993** | **2530.93** |
| මාතලේ | 2533 | 970.03 | 120 | 51.38 | 558 | 244.28 | 250 | 111.08 | 97 | 53.5 | 237 | 66.07 | 333 | 8.87 | 111 | 50.96 | 5 | 2.45 | 15 | 6.18 | 9 | 4.96 | **4268** | **1569.76** |
| අනුරාධපුර | 1858 | 1120.07 | 162 | 75.31 | 614 | 292.98 | 457 | 516.26 | 103 | 64.22 | 340 | 65.91 | 182 | 7.99 | 149 | 83.3 | 4 | 1.71 | 594 | 189.09 | 121 | 53.6 | **4584** | **2470.44** |
| පොළොන්නරුව | 946 | 561.25 | 115 | 48.39 | 111 | 69.58 | 113 | 35.5 | 50 | 50.95 | 209 | 81.1 | 86 | 4 | 75 | 67.84 | 19 | 10.61 | 99 | 36.86 | 2 | 0.63 | **1825** | **966.71** |
| වව්නියාව | 146 | 106.83 | 24 | 9.04 | 28 | 20.42 | 33 | 25.88 | 0 | 0 | 0 | 0 | 0 | | 11 | 12.98 | 25 | 11.26 | 65 | 66.09 | 0 | 0 | **332** | **252.5** |
| ත්‍රිකුණාමලය | 762 | 530.79 | 90 | 24.94 | 176 | 112.1 | 80 | 23.71 | 66 | 35.74 | 74 | 50.7 | 25 | 2.96 | 1 | 0.38 | 1521 | 78.93 | 229 | 95.87 | 3 | 2.65 | **3027** | **958.77** |
| මඩකළපුව | 1148 | 870.2 | 58 | 21.53 | 56 | 45.63 | 31 | 13.89 | 44 | 28.43 | 196 | 19.82 | 112 | 5.94 | 0 | 0 | 386 | 94.56 | 451 | 122.2 | 0 | 0 | **2482** | **1222.2** |
| අම්පාර | 1615 | 1191.6 | 105 | 38.05 | 81 | 70.74 | 31 | 13.35 | 25 | 47.2 | 79 | 41.46 | 34 | 4.94 | 30 | 10 | 789 | 131.22 | 106 | 37.72 | 15 | 5.86 | **2910** | **1592.14** |
| යාපනය | 37 | 14.08 | 107 | 42.89 | 39 | 58.86 | 32 | 12.69 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 2.38 | 424 | 360.04 | 38 | 9.33 | 0 | 0 | **678** | **500.27** |
| කිළිනොච්චි | 3 | 4.9 | 4 | 1.15 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 26 | 4.7 | 38 | 9.33 | 0 | 0 | **71** | **20.08** |
| මුලතිවු | 3 | 6 | 0 | 0 | 1 | 6.13 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 9 | 7.06 | 6 | 4 | 0 | 0 | **19** | **23.19** |
| මන්නාරම | 260 | 163.02 | 39 | 10.73 | 2 | 1.65 | 39 | 77.05 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 | 5.15 | 65 | 34.73 | 58 | 39.77 | 0 | 0 | **470** | **332.1** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## 3.9. විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන

සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි, විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන සුපුරුදු අයුරින් 2012 වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලද්දේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය කෙරෙහි සෘජු බලපෑම් සිදු කරන සෙසු සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මගින් ආවරණය නොවන සුළු පරිමාණ භෞතික හා සමාජ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙනි.


ගම නැගුම වැඩසටහන හා සමගාමීව ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රිවරුන් 225 සඳහා එක් මන්ත්‍රිවරයකුට රුපියල් ලක්ෂ 50 බැගින් මුල්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලැබේ.

ඒ අනුව 2012 වර්ෂයේදී ද දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 196 සඳහා රු.මි. 980 ක්ද, ජාතික ලැයිස්තුවෙන් පත්වු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 29 සඳහා රු.මි. 145 ක්ද වශයෙන් මුළු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 225 සඳහා රු.මි. 1125 ක මුල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික්ක අනුව වෙන් කෙරිණි .

මෙම වැඩසටහන යටතේ සුළු පරිමාණ භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 14,805 ක් නිම කිරීමට සඳහා රු.මි. 1000.77 ක මුදලක් වැය කර ඇත.

**විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන - 2012 - ආංශික ලෙස ව්‍යාපෘති බෙදීයාම**

රූප සටහන් අංක 3.9.1




මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන - 2012 - දිස්ත්‍රික් සාරාංශය

වගු අංක 3.9.1

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුළු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 19 | 1051 | 115.40 |
| 2 | ගම්පහ | 18 | 738 | 89.707 |
| 3 | කළුතර | 10 | 448 | 59.917 |
| 4 | රත්නපුර | 10 | 540 | 54.067 |
| 5 | කෑගල්ල | 09 | 372 | 27.364 |
| 6 | කුරුණෑගල | 15 | 1449 | 68.959 |
| 7 | පුත්තලම | 08 | 818 | 28.860 |
| 8 | අනුරාධපුර | 09 | 850 | 41.719 |
| 9 | පොළොන්නරුව | 05 | 539 | 24.780 |
| 10 | ගාල්ල | 10 | 687 | 53.620 |
| 11 | මාතර | 08 | 638 | 45.859 |
| 12 | හම්බන්තොට | 07 | 796 | 34.600 |
| 13 | මොණරාගල | 05 | 393 | 24.204 |
| 14 | බදුල්ල | 08 | 678 | 38.525 |
| 15 | නුවරඑළිය | 07 | 586 | 35.406 |
| 16 | මහනුවර | 12 | 1091 | 65.844 |
| 17 | මාතලේ | 05 | 470 | 25.713 |
| 18 | ත්‍රිකුණාමලය | 04 | 213 | 20.249 |
| 19 | මඩකලපුව | 05 | 427 | 30.395 |
| 20 | අම්පාර | 07 | 741 | 45.036 |
| 21 | වව්නියාව | 06 | 170 | 10.364 |
| 22 | යාපනය | 09 | 698 | 37.930 |
| 23 | කිලිනොච්චි | | 139 | 8.654 |
| 24 | මුලතිව් | 06 | 69 | 7.196 |
| 25 | මන්නාරම | 06 | 204 | 6.387 |
| **එකතුව** | | **196** | **14805** | **1000.77** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## 3.10. ප්‍රාථමික පාසල් 5000 හා ද්විතීයික පාසල් 1000 ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන - "හොඳම දේ දැයේ දරුවන්ටයි"

ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුල සදහන් අරමුණු සාක්ෂාත් කරමින් දැයේ දරුවන්ට තම විභවතාවයන් උපරිම ලෙස සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය පදනම සැකසීම සඳහා ප්‍රාථමික පාසල් 1000 හා ද්වීතීයික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය සමග සම්බන්ධවී 2012 වර්ෂයේ අගෝස්තු මස සිට ආරම්භ කරන ලදි.

ප්‍රාථමික අධ්‍යාපනය ඵලදායි ලෙස සම්පුර්ණ කරමින් නිපුණතා ඇති සිසුන් ද්විතීයික අධ්‍යාපනයට ඇතුලත් කිරීම සඳහා ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීම් ලබා දීම මෙන්ම ළමයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා රැකවරණය වැනි සියළුම ළමා අයිතිවාසිකම් සක්‍රියව සපුරාලන පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සංවර්ධනය කරන ලද ප්‍රාථමික පාසල් 5000 "ළමා මිතුරු පාසල් " ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත.


මෙම වැඩසටහනෙහි අරමුණු වුයේ,

- ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සඳහා අංග සම්පුර්ණ ප්‍රාථමික අධ්‍යාපනයක් තහවුරු කිරීම පිණිස පහසුකම් ඇති ප්‍රාථමික පාසල් පද්ධතියක් ප්‍රතිනිර්මාණය කිරීම.
- ඉතා දුර බැහැර සිට නගරයේ පාසල් වෙත ඇදෙන ප්‍රාථමික සිසුන් දැනට මුහුණ දෙන අවිවේකය ශාරීරික හා මානසික පීඩනය වැනි තත්ත්වයන් සමනය කිරීමට පදනමක් සකස් කිරීම.
- ප්‍රාථමික පාසල් හා ද්විතීයික පාසල් වලට ඇතුළත් වීම සඳහා දැනට පවතින තරගකාරී බව අවම කිරීම.
- ප්‍රාථමික පාසලක් සඳහා අනුමත නිර්ණායකවලට අනුව තිබිය යුතු සම්පත් ලබා දීම මගින් ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම.
- ප්‍රාථමික පාසල් ළමා මිතුරු සංකල්පය මුල් කරගනිමින් ළමයින්ට ප්‍රියමනාප ඉගෙනුම ඉගැනීම පරිසරයක් සම්පාදනය කරමින් ගුණාත්මක සංවර්ධනය සඳහා පාසල් පාදක ක්‍රියාකාරකම් සුවිශේෂීව හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම මගින් විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ ශක්‍යතා වර්ධනය හා දෙමාපියන් දැනුවත් කිරීම මගින් දෙමව්පිය සහයෝගය ලබාගෙන ප්‍රාථමික අංශයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම .

එක් පාසලකට රුපියල් ලක්ෂ 5 බැගින් ප්‍රතිපාදන ලබාදුන් අතර මෙහිදී ව්‍යාපෘති 6483 ක් පහත සදහන් සංරචක යටතේ වැඩිදියුණු කිරීම සිදු කරන ලදී.

## ආංශික වශයෙන් ව්‍යාපෘති බෙදීගොස් ඇති ආකාරය

රූප සටහන් අංක 3.10.1




මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## නිම කරනලද ක්‍රියාකාරකම් කිහිපයක්



සකස්කරන ලද පළමුවන වසර සිසුන්ගේ
ක්‍රියාකාරකම් කාමරය
හපුගහගම ප්‍රාථමික විද්‍යාලය
දිවුලපිටිය ප්‍රාලේ කොට්ඨාශය
ගම්පහ දිස්ත්‍රික්කය



සකස්කරන ලද පාසල් වැට හා ගේට්ටුව
විහාරගල ප්‍රාථමික විද්‍යාලය
සූරියවැව ප්‍රාලේ කොට්ඨාශය
හම්බන්තොට දිස්ත්‍රික්කය



පාසලට ජල පහසුකම් සැපයීම
අලුත්ගම ප්‍රාථමික විද්‍යාලය
පාතදුම්බර ප්‍රාලේ කොට්ඨාශය
මහනුවර දිස්ත්‍රික්කය



පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියාව හා තීන්ත
ආලේප කිරීම
පෙරුනාවලර් විද්‍යාලය
ආලයඩිවම්බු ප්‍රාලේ කොට්ඨාශය
අම්පාර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරාගත් පාසල් 1678 ක පූර්වයෙන් සඳහන් සංවර්ධන වැඩ කොටස් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කල අතර මාස 2 ක් වැනි කෙටි කාලයක් තුලදි හදුනාගත් සියළුම ව්‍යාපෘති නිම කරන ලද අතර එහි ප්‍රගතිය පහත සටහනෙන් දැක්වේ.

## පාසල් ප්‍රතිනිර්මාණය කිරිමේ වැඩසටහනෙහි 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 3.10.1

| අනු අංකය | දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම් ආරම්භකල පාසල් ගණන | නිදහස්කල ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | වියදම (රු.මි.) 2012.12.31 දිනට | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 45 | 22.50 | 22.00 | 100 |
| 2 | ගම්පහ | 66 | 33.00 | 32.80 | 100 |
| 3 | කළුතර | 49 | 25.00 | 23.44 | 100 |
| 4 | රත්නපුර | 196 | 98.00 | 94.78 | 100 |
| 5 | කෑගල්ල | 173 | 86.50 | 68.80 | 100 |
| 6 | කුරුණෑගල | 111 | 55.50 | 54.95 | 100 |
| 7 | පුත්තලම | 66 | 33.00 | 27.43 | 100 |
| 8 | ගාල්ල | 86 | 43.00 | 42.72 | 100 |
| 9 | මාතර | 63 | 31.50 | 30.87 | 100 |
| 10 | හම්බන්තොට | 35 | 17.50 | 15.95 | 100 |
| 11 | මොණරාගල | 41 | 20.50 | 19.79 | 100 |
| 12 | බදුල්ල | 56 | 28.00 | 26.72 | 100 |
| 13 | නුවරඑළිය | 57 | 28.50 | 28.33 | 100 |
| 14 | මහනුවර | 58 | 29.00 | 28.70 | 100 |
| 15 | මාතලේ | 37 | 18.50 | 17.97 | 100 |
| 16 | අනුරාධපුර | 111 | 55.50 | 52.51 | 100 |
| 17 | පොළොන්නරුව | 67 | 33.50 | 33.47 | 100 |
| 18 | වව්නියාව | 14 | 7.00 | 6.99 | 100 |
| 19 | ත්‍රිකුණාමලය | 67 | 33.50 | 32.62 | 100 |
| 20 | මඩකළපුව | 70 | 35.00 | 35.00 | 100 |
| 21 | අම්පාර | 95 | 47.50 | 47.32 | 100 |
| 22 | යාපනය | 61 | 30.50 | 30.50 | 100 |
| 23 | කිළිනොච්චි | 13 | 6.50 | 6.50 | 100 |
| 24 | මුලතිව් | 19 | 9.50 | 9.49 | 100 |
| 25 | මන්නාරම | 22 | 11.00 | 10.76 | 100 |
| | **එකතුව** | **1678** | **839.50** | **800.48** | |
| **අමාත්‍යාංශය දැරූ වියදම** | | | | **2.52** | |
| **මුළු වියදම** | | | | **803.00 *** | |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

***** පාසල් සංවර්ධන වැඩසටහන සඳහා 2012.12.31 දිනට මුළු වියදම රු.මි. 803.00 වු අතර, දිස්ත්‍රික් විසින් වැඩ නිමවා ගෙවීම් සඳහා රු.මි. 25.27 ක අතැති බිල්පත් පැවතිණි. ඒ අනුව මුළු වියදම රු.මි. 828.28 ක් වි ඇත. මෙම අතැති බිල්පත් සඳහා ප්‍රතිපාදන 2013 වර්ෂයේදී ලබාදීමට අපේක්ෂිතය.

# 4

# පුර නැගුම - පරිසර හිතකාමී නාගරික පරිසරයක්

# 4. පුර නැගුම - පරිසර හිතකාමී නාගරික පරිසරය

### 4.1.හරිත නගර වැඩසටහන

සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතින නාගරිකරණය හේතු කොට ගෙන මහා පරිමාණව සිදුවන පරිසර දූෂණය පිටු දැක ජනතා අවශ්‍යතා සපිරෙන පරිදි නාගරික පහසුකම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරිම "හරිත නගර" වැඩසටහනේ බලාපොරොත්තුවයි. කොළඹ ඇතුළු තදාසන්න නගර "හරිත නගර" ලෙස සංවර්ධනය කිරිම උදෙසා 2012 වර්ෂයේදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පහත සඳහන් සංවර්ධන කාර්යයන් ඉටුකර ඇත.

### 4.1.1. දියත උයන - නාගරික සංවර්ධන වැඩසටහන

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව මෙම අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 99.15ක ප්‍රතිපාදන ලබාදීම තුළින් ''දියත උයන'' බත්තරමුල්ලේ ඉදි කරනු ලැබූයේ ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව මඟිනි. මෙහි ප්‍රථම අදියරට මල් අලෙවි කුටි 84ක් ත්‍රිමාණ රූපාකාරයෙන් දිස්වන මංතිරු සහ ශරිර සුවතා මංතිරු මෙන්ම වතුර මල් යනාදිය ඉදිකිරිම මඟින් වඩාත් ප්‍රසන්න පරිසරයක් ඇති කිරිමට කටයුතු යොදා ඇත. 2012.12.31 දිනට රුපියල් මිලියන 61ක වියදමක් දරා ඇති මෙම ව්‍යාපෘතියේ ශ්‍රමදායකත්වය නාවික හා යුධ හමුදාව මඟිනි.



දියත උයනෙහි ඉදිකර ඇති මල් අලෙවි කුටි





නවීන තාක්ෂණය ඇසුරු කරගෙන ත්‍රිමාණ රූපාකාරයෙන් දිස්වන මංමාවත් හා ශරීර සුවතා මංතීරු

### 4.1.2 මාතෘ සායන සංවර්ධනය කිරීම

සෞභාග්‍යමත් සමාජයක් වෙනුවෙන් සෞඛ්‍ය සම්පන්න මානව සම්පතක් ගොඩ නැගීම සඳහා ආයෝජනය කිරීම රජය ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ රජයේ අරමුණ ඉටු කර ගැනිම සඳහා ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන ගොඩනැංවීමට 2012 වර්ෂයේදීද රජය දැඩි අවධානයක් යොමු කරන ලද අතර මෙයින් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සෞඛ්‍ය සේවා දර්ශක වල පවතින විෂමතාවය අවම කිරීම ප්‍රධාන අරමුණක් විය.

2011 වර්ෂයේදී ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ පළමු හා දෙවන අදියර ආරම්භ කරන ලද අතර මින් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක් ආවරණය වන පරිදි ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන 24 ක සංවර්ධන කටයුතු ඉලක්ක කර තිබුණි. 2012.12.31 දින වන විට රු.මි. 113.37 ක වියදමින් මධ්‍යස්ථාන 24 හිම සංවර්ධන කාර්යයන් සම්පූර්ණයෙන්ම නිම කර ඇත. එමෙන්ම 2012 වර්ෂයේදී ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ තෙවන අදියර ආරම්භ කරන ලද අතර රු.මි. 505.64 ක් පමණ මේ සඳහා වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබුණි. තෙවන අදියර යටතේ ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන 37 ක් සංවර්ධනය සඳහා තෝරාගත් අතර රු.මි. 76.83 ක් 2012.12.31 දින වන විට වියදම් කර ඇත.




රු.මි.12.31 වියදමින් සංවර්ධනය කරන ලද කැළණිය, දළුගම්ගොඩ ළමා හා මාතෘ සායනය
ප්‍රතිලාභීන් සංඛ්‍යාව -250



ගම්පහ, රු.මි. 5.09 ක වියදමින් සංවර්ධනය කරන ලද මාකෙවිට ළමා හා මාතෘ සායනය
ප්‍රතිලාභීන් සංඛ්‍යාව -175



බියගම, රු.මි. 9.70 ක වියදමින් සංවර්ධනය කරන ලද මාවරමණ්ඩිය ළමා හා මාතෘ සායනය
ප්‍රතිලාභීන් සංඛ්‍යාව -200

### 4.1.3 සති පොළ ඉදි කිරීම

පාරිභෝගික ජනතාවට වඩාත් හොඳ තත්වයේ පාරිභෝගික භාණ්ඩ ලබාදීමත්, වෙළඳ ප්‍රජාවට යහපත් හා නවීන පහසුකම් ලබාදීමත් අරමුණු කර ගනිමින් නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර පවතින සම්බන්ධය ශක්තිමත් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් සති පොළ සංවර්ධනය කිරීම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ.



මල්වතුහිරිපිටිය සති පොළෙහි දිවි නැගුම නිෂ්පාදකයින් සඳහා වෙන් කරන ලද අංශය
ගම්පහ දිස්ත්‍රික්කය

2011 වර්ෂයේ ප්‍රථම අදියර වශයෙන් ප්‍රා.ලේ කොට්ඨාශ 9 ක සති පොළ 14 ක සංවර්ධන කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී. සති පොළ සංවර්ධනය කිරීමේ දෙවන අදියර වශයෙන්, ප්‍රථම අදියරෙහි වැඩ අවසන් නොවූ සතිපොළ 9 ක් හා අළුතින්ම හඳුනාගත් සතිපොළ 10 ක සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. 2012.12.31 දින වන විට ප්‍රථම හා දෙවන අදියරෙහි සංවර්ධනය කිරිමට හඳුනාගත් සතිපොළ 12 ක වැඩ සම්පූර්ණයෙන්ම නිම කර ඇත. 2012.12.31 දින වන විට රු.මි 337.86 ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත . එමෙන්ම 2012 වර්ෂයේදී මාතර මීදිගම සතිපොළෙහි සංවර්ධනය වෙනුවෙන් 2012.12.31 දින වන විට රු.මි 0.8 ක් වැය කර ඇත.



නයිවල සති පොළ
ගම්පහ දිස්ත්‍රික්කය

### 4.1.4 ව්‍යායාම පථ ඉදිකිරීම

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ඇති කිරීම සඳහා ශාරීරික ව්‍යායාම් වල යෙදීමට මිනිසුන් දිරිගැන්වීමේ අරමුණින් ව්‍යායාම පථ සකස් කිරිම සඳහා 2012 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි 174.21 ක් වන අතර මෙමගින් ගම්පහ, කළුඇළ හා කිරිබත්ගොඩ යන ස්ථානයන්හි සුවතා මං තීරු ඉදි කිරිම සිදු කර ජනතා අයිතියට පත් කර ඇත.



ගම්පහ, කළුඇළ ව්‍යායාම පථයෙහි දර්ශනයක්



කිරිබත්ගොඩ ඉදිකරන ලද ව්‍යායාම පථය

## 4.1.5 බස් නැවතුම්පොළ සංවර්ධනය

නාගරික හා අර්ධ නාගරික සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් පවත්වා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රධාන වේ. මේ අරමුණ පෙර දූරිව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් බස් නැවතුම් පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

2012 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ඇඹිලිපිටිය බස් නැවතුම් පොළ භූමිය තාර දමා ප්‍රතිසංස්කරණය කළ අතර ඒ සඳහා රු.මි 31.11 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2012.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය රු.මි. 15.74 ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. එමෙන්ම බදුල්ල, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මස්පැන්න බස්නැවතුම්පොළ ඉදිකිරීම සඳහා රු.මි 17.75 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2012.12.31 දින වන විට රු.මි 5.51 ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.




ඇඹිලිපිටිය බස් නැවතුම් පොළ භූමිය තාර දමා
ප්‍රතිසංස්කරණය කිරීම
ඇඹිලිපිටිය ප්‍රා ලේ කොට්ඨාශය
රත්නපුර දිස්ත්‍රික්කය



මස්පැන්න බස් නැවතුම් පොළ ඉදි කිරිම
වැලිමඩ ප්‍රා ලේ කොට්ඨාශය
බදුල්ල දිස්ත්‍රික්කය

# 5

# ප්‍රාදේශීය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක්

# 5. ප්‍රාදේශීය වර්ධන මධ්‍යස්ථාන - පැතිරුනු සංවර්ධනයක්

රටේ සියළුම පළාත් වලින් ජාතික ආර්ථිකයට වන දායකත්වය ඉහළ නංවා සියළුම පළාත් තුලනාත්මක සංවර්ධන මාවතකට යොමු කරවා ගැනීමේ පරමාර්ථයෙන් 2012 වර්ෂයේදී ද ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය.

ප්‍රාදේශ අතර පවතින ආර්ථික හා සමාජ අසමානතාවයන් අවම කිරීම සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුතු යටිතල පහසුකම් ඇති කිරීම සහ නිපුණතා සහිත මානව සම්පත් බිහිකිරීම කෙරෙහි මෙහිදී දැඩි අවධානය යොමු කරන ලදී.

මෙම වැඩසටහන් මගින් සිදු කරනු ලැබූ සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 6 ක් යටතේ ගොනු කර ඇත.



## 5.1. ග්‍රාමීය / පළාත් අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කිරීම

රටේ අභ්‍යන්තර ප්‍රවාහනය පද්ධතිය කාර්යක්‍ෂම කිරීම තුළින් ග්‍රාමීය නිෂ්පාදන වෙළෙඳ පොළ දක්වා ගෙන ඒම පහසු වීම නිසා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වීම , ගම හා නගරය අතර දුරස්ථ භාවය අවම වීම නිසා ප්‍රජාව ගම තුළ රැඳීමේ ප්‍රවණතාවය ඉහළ නැංවීම හා පොදු ප්‍රවාහන පද්ධතිය කාර්යක්ෂම වීමෙන් දේශීය දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය සහ ඵලදායීතාවය වැඩි කිරීම ග්‍රාමීය / පළාත් අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කිරීම මෙමගින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු වේ.

**ග්‍රාමීය / පළාත් අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන**
**2012.12.31 දිනට අත්පත් කරගෙන ඇති සමුච්චිත ප්‍රගතිය**

වගු අංක 5.1.1

| ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | දිස්ත්‍රික්කය | සමස්ත ව්‍යාපෘතියේ ඉලක්ක කි.මී. ගණන | 2012.12.31 දිනට වැඩ අවසන් කර ඇති මුළු කි.මී. ගණන | 2012.12.31 දිනට දරණ ලද මුළු වියදම රු. මි |
|---|---|---|---|---|
| බටහිර රන් අරුණ | කොළඹ | 173.61 | 167.85 | 1477.47 |
| | කළුතර | 206.48 | 192.09 | 1941.00 |
| | ගම්පහ | 323.00 | 256.46 | 2730.84 |
| වයඹ පුබුදුව | කුරුණෑගල | 434.67 | 385.65 | 3904.28 |
| | පුත්තලම | 220.54 | 220.54 | 2268.95 |
| රජරට නවෝදය | අනුරාධපුර | 287.13 | 120.07 | 2459.74 |
| | පොළොන්නරුව | 137.96 | 80.99 | 1023.60 |
| රුහුණු උදානය | ගාල්ල | 350.10 | 217.16 | 1675.24 |
| | මාතර | 113.01 | 99.78 | 1530.29 |
| | හම්බන්තොට | 256.15 | 154.85 | 2069.72 |
| සබරගමුව අරුණාලෝකය | රත්නපුර | 272.65 | 140.85 | 1301.48 |
| | කෑගල්ල | 333.03 | 117.45 | 1278.03 |
| කඳුරට උදානය | මහනුවර | 430.59 | 158.10 | 2839.23 |
| | මාතලේ | 123.50 | 65.35 | 612.11 |
| පුබුදමු වෙල්ලස්ස | බදුල්ල | 277.73 | 177.17 | 2990.79 |
| | මොණරාගල | 179.60 | 81.37 | 1520.78 |
| | **එකතුව** | **4119.75** | **2635.73** | **31623.55** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



නාරවිල යක්දෙස්සාව මාර්ගය
නාත්තන්ඩිය ප්‍රා. ලේ කොට්ඨාශය
පුත්තලම දිස්ත්‍රික්කය
කාපට් කරන ලද දුර - කි.මී 4. 45



මාකඳුර - උඩවෙල මාර්ගය
කටුගම්පොළ ප්‍රා .ලේ කොට්ඨාශය
කුරුණෑගල දිස්ත්‍රික්කය
කාපට් කරන ලද දුර - කි.මී 11.38



කෝන්ගස්දෙනිය- මල්ලැහැව මාර්ගය
මීරිගම ප්‍රා. ලේ කොට්ඨාශය
ගම්පහ දිස්ත්‍රික්කය
කාපට් කරන ලද දුර - කි.මී 3.7

- 2011 වර්ෂයේදී මෙම වැඩසටහන මගින් උතුරු නැගෙනහිර හැර ඉතිරි පළාත් 7 හි පළාත් මාර්ග විෂයට අයත් වන " C "හා " D " ශ්‍රේණිවල මාර්ග කි.මී 4,119.75 ක් සංවර්ධනයට ඉලක්ක කර තිබූ අතර 2011 වර්ෂයේදී ඉන් කි.මී 1,000 ක් හා 2012 වර්ෂයේදී කි.මී 1,635.72 ක් වශයෙන් කි.මී 2,635.72 ක දුර ප්‍රමාණයක් කාපට් කර ඇත.
- 2012 වර්ෂයේ පළාත් මාර්ග කාපට් කිරිම සඳහා රු.මි 19,458.79 ක් වියදම් කර ඇත.
- උතුරු පළාතෙහි බිම් බෝම්බ ඉවත් කිරිම, පස් බැමි කඩා ඉවත් කිරිම ආදියට යොදා ගන්නා බර යන්ත්‍ර නඩත්තුව සඳහා 2012 වර්ෂයේදී රු.මි 145.75 ක් වෙන් කර ඇති අතර 2012.12.31 දින වන විට ඉන් රු.මි 82.56 ක් වියදම් කර ඇත.

### 5.2. අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය / සම්පූර්ණ කිරීම

ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා භාවිතයට ගත නොහැකි තත්ත්වයේ තිබූ රජයේ දේපළ, සම්පත් නාස්තියක් හා ආරම්භක අරමුණු වලින් බැහැරව නොයෙකුත් ක්‍රියාකාරකම් සඳහා යොදාගැනීමේ ප්‍රවණතාවයක් ලෙස හඳුනාගන්නා ලදී. ඒ අනුව හඳුනාගත් දිස්ත්‍රික්ක 14 ක අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය කර ඒවා ප්‍රයෝජනයට ගතහැකි මට්ටමට පිළිසකර කිරිම තුළින් ඒවායේ ප්‍රතිලාභ මහජනතාවට ගලා යාමට සලස්වන ලදී. එමගින් රාජ්‍ය වියදම් වල ප්‍රතිලාභ විධිමත් කිරීමට පියවර ගන්නා ලදී.



කිතුල්ඇල්ල බහුකාර්යය ගොඩනැගිල්ල
ඇල්ල ප්‍රා ලේ කොට්ඨාශය
බදුල්ල දිස්ත්‍රික්කය



සෙසිලියා ජාතික පාසලෙහි අසම්පූර්ණව ඉදිකරන
ලද පන්ති කාමරවල වැඩ අවසන් කිරීම
මඩකලපුව දිස්ත්‍රික්කය

## අත්හැර දමන ලද හෝ අසම්පූර්ණ රජයේ දේපළ ප්‍රතිසංස්කරණය කිරීම

## 2012.12.31 දිනට අත්පත් කරගෙන ඇති සමුච්චිත ප්‍රගතිය

වගු අංක 5.2.1

| වැඩසටහන | දිස්ත්‍රික්කය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි) | 2012.12.31 දිනට වියදම් කරන ලද මුදල(රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2012.12.31 දිනට වැඩ අවසන් ව්‍යාපෘති ගණන | 2012.12.31 දිනට ක්‍රියාත්මක තත්වයේ පැවති ව්‍යාපෘති ගණන |
| බටහිර රන් අරුණ | ගම්පහ | 39.15 | 24.31 | 4 | 4 | |
| | කළුතර | 31.02 | 17.52 | 17 | 16 | |
| රුහුණු උදානය | ගාල්ල | 35.26 | 18.90 | 18 | 11 | 4 |
| | මාතර | 3.67 | | 2 | 2 | |
| සබරගමුව අරුණාලෝකය | කෑගල්ල | 1.44 | 1.44 | 3 | 3 | |
| රජරට නවෝදය | අනුරාධපුරය | 34.71 | 20.01 | 30 | 24 | 5 |
| පුබුදමු වෙල්ලස්ස | බදුල්ල | 28.66 | 45.66 | 11 | 10 | 1 |
| වයඹ පුබුදුව | කුරුණෑගල | 51.16 | 28.41 | 47 | 45 | 2 |
| | පුත්තලම | 16.43 | 11.83 | 42 | 39 | 3 |
| කඳුරට උදානය | මහනුවර | 1.90 | 1.84 | 2 | 2 | |
| | නුවරඑළිය | 6.05 | 2.30 | 2 | 2 | |
| නැගෙනහිර නවෝදය | ත්‍රිකුණාමලය | 20.78 | 18.29 | 3 | 3 | |
| | අම්පාර | 24.07 | 18.88 | 15 | 14 | 1 |
| | මඩකලපුව | 205.54 | 156.90 | 45 | 24 | 21 |
| **එකතුව** | | **499.84** | **366.29** | **241** | **199** | **37** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2012 වර්ෂයේදී ව්‍යාපෘති 241 ක් හඳුනා ගන්නා ලද අතර වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති 199 ක වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති 37 ක වැඩ 2013 වර්ෂයේදී නිම කිරීමට යෝජිතය. මේ සඳහා රු.මි 499.84 ක ප්‍රතිපාදන 2012 වර්ෂයේදී වෙන් කරන ලද අතර 2012.12.31 දින වන විට රු.මි 366.29 ක ප්‍රතිපාදන වැය කර ඇත.

### 5.3. බහුවිධ වාරිමාර්ග සංවර්ධනය කිරීම

ප්‍රමාණවත් ජල සැපයුමක් ලබාදීම තුළින් කෘෂි ඉඩම් වල නිෂ්පාදන ඵලදායීතාව වැඩිකිරීමත් එසේම වගා කළහැකි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම තුළින් අස්වනු ඉහළනංවා කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය කර ගොවි පවුල් වල ආදායම වැඩිකිරීමත්, වාරි කර්මාන්ත සංවර්ධනය හා පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනෙහි ප්‍රධාන පරමාර්ථ විය.




දිමුතුගම වැව්දිගොඩ්දූව වාරි ඇළ
ප්‍රතිසංස්කරණය කිරීම
වැලිමඩ ප්‍රා ලේ කොට්ඨාශය
බදුල්ල දිස්ත්‍රික්කය



කෝන්ගහවැව ප්‍රතිසංස්කරණය කිරීම
බඩල්කුඹුර ප්‍රා ලේ කොට්ඨාශය
මොණරාගල දිස්ත්‍රික්කය

2012 වර්ෂයේ මේ සඳහා රු.මි 534.17 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2012.12.31 දිනට වැඩ අවසන් ව්‍යාපාති සංඛ්‍යාව 38 කි. ව්‍යාපෘති 19 ක වැඩ 2013 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

### 5.4. සංචාරක කටයුතු සඳහා පොදු උපයෝගීතා සැපයීම

මානසික අවිවේකී බවින් හා අධික කාර්යබහුලත්වයෙන් මිදී ජනතාවට තම විවේක කාලය මානසික නිරවුල්තාවයක් ඇතිවන ආකාරයට ගතකිරිමට අවශ්‍ය වන පරිසරයක් නිර්මාණය කිරීමට අමාත්‍යාංශය මෙමගින් පියවර ගෙන ඇත. මෙහිදී සංචාරක කලාප සංවර්ධනය කිරීම , ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, බහුවාර්ගික සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරිම , නගර අලංකරණය, සංචාරක ගමනාන්තයන් වල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම ආදී ක්‍රියාකාරකම් සිදු කරන ලදී. එමෙන්ම රටේ අඩු ආදායම් ලබන ජනතාව අතර මුදල් සංසරණය ඉහළ නංවා ඔවුන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීමද මෙමගින් අපේක්ෂා කරන ලදී.

## සංචාරක කටයුතු සඳහා පොදු උපයෝගීතා ව්‍යාපෘතිය

## 2012.12.31 දින වන විට අත්පත් කරගෙන ඇති සමුච්චිත ප්‍රගතිය

වගු අංක 5.4.1

| දිස්ත්‍රික්කය | අනුමත මුදල (රු.මි) | වියදම් කරන ලද මුදල (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක තත්වයේ පැවති ව්‍යාපෘති ගණන |
| ගම්පහ | 200.00 | 7.81 | 11 | 8 | 3 |
| ගාල්ල | 213.01 | 320.30 | 29 | 1 | 28 |
| හම්බන්තොට | 63.91 | 13.10 | 2 | | 1 |
| කෑගල්ල | 88.52 | | 1 | | 1 |
| පොළොන්නරුව | 102.15 | 17.92 | 5 | | 5 |
| බදුල්ල | 54.44 | 7.62 | 19 | 16 | 3 |
| මාතලේ | 1.25 | 0.54 | 1 | | 1 |
| නුවරඑළිය | 260.66 | 107.04 | 326 | 136 | 190 |
| යාපනය | 50.00 | 13.43 | 2 | | 2 |
| **එකතුව** | **1033.94** | **487.76** | **396** | **161** | **234** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනයේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
ඇල්ල ප්‍රා ලේ කොට්ඨාශය
බදුල්ල දිස්ත්‍රික්කය



වීරකැටිය උඩුකිරිවිල වැව වටා මාර්ග පද්ධතිය සකස්කිරීම
වීරකැටිය ප්‍රා ලේ කොට්ඨාශය
හම්බන්තොට දිස්ත්‍රික්කය

- මේ සඳහා 2012 වර්ෂයේදී රු.මි 1033.94 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර අනුමත ව්‍යාපාති ගණන 396 කි. 2012.12.31 දින වන විට රු.මි 487.76 ක වියදමින් ව්‍යාපෘති 161 ක වැඩ අවසන් කර ඇති අතර ව්‍යාපෘති 234 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

### 5.5. මූලික මිනිස් අවශ්‍යතා වෙනුවෙන් ප්‍රවේශය

ජීවත්වීම සඳහා සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් සපුරාලීමට අවකාශ සැලසීම "මූලික මිනිස් අවශ්‍යතා සඳහා ප්‍රවේශය" සඳහා වන සංවර්ධන ව්‍යාපෘතින් මගින් සලකා බැලේ. විශේෂයෙන්ම ගංවතුරින් හානියට පත් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම , පානීය ජල ව්‍යාපෘති ඉදිකිරීම හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම ආදී ව්‍යාපෘති මින් කැපී පෙනෙන අතර ජනතාවට අවශ්‍ය පහසුකම් ලබාදී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණ විය.

**මූලික මිනිස් අවශ්‍යතා වෙනුවෙන් ප්‍රවේශය ව්‍යාපාතිය**

**2012 වර්ෂය තුළදී අත්පත් කරගෙන ඇති සමුච්චිත ප්‍රගතිය**

වගු අංක 5.5.1

| දිස්ත්‍රික්කය | අනුමත මුදල (රු.මි) | වියදම් කරන ලද මුදල(රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක තත්වයේ පැවති ව්‍යාපෘති ගණන |
| ගම්පහ | 230.00 | 117.10 | 26 | 24 | 1 |
| ගාල්ල | 37.45 | | 3458 | 3457 | 1 |
| මාතර | 64.15 | 35.80 | 4544 | 4544 | |
| හම්බන්තොට | 98.40 | 75.04 | 740 | 192 | 408 |
| කෑගල්ල | 5.35 | | 5 | | 5 |
| අනුරාධපුරය | 32.75 | | 14 | 13 | |
| බදුල්ල | 30.62 | 24.38 | 90 | 65 | 25 |
| මහනුවර | 26.70 | 7.41 | 267 | 93 | 174 |
| නුවරඑළිය | 73.30 | 55.90 | 1 | 1 | |
| ත්‍රිකුණාමලය | 4.94 | | 1 | 1 | |
| අම්පාර | 45.06 | | 5 | 3 | 1 |
| වවුනියාව | 36.45 | 0.67 | 1 | | 1 |
| මන්නාරම | 10.00 | | 1 | | 1 |
| මුලතිවු | 8.91 | | 3 | | 3 |
| උතුරු පළාත | 26.53 | 24.86 | 4 | 4 | |
| **එකතුව** | **730.61** | **341.16** | **9160** | **8397** | **620** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



පැල්පතින් නවලොවට වැඩසටහන යටතේ ලබාදුන් මූල්‍ය ආධාර වලින් කාරියමඩිත්ත ඒ.කේ.දුල්මිණි තරංගා මහත්මිය ඉදිකරනු ලබන නව නිවහන
අගුණකොළපැලැස්ස ප්‍රා ලේ කොට්ඨාශය
හම්බන්තොට දිස්ත්‍රික්කය



උතුරු පළාත
අවතැන්වූවන් නැවත පදිංචි කිරිම සඳහා සිදු කරන ලද සංවර්ධන කටයුතු වලදී යොදාගත් යන්ත්‍රෝපකරණ සඳහා ලබා දුන් ද්‍රව්‍යමය හා ඉන්ධන සහනාධාර


2012 වර්ෂයේදී අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව 9160 ක් වූ අතර 2012.12.31 දින වන විට ඉන් ව්‍යාපෘති 8397 ක වැඩ අවසන් කර ඇත. 2012.12.31 දින වන විට අත්පත් කර ගෙන ඇති මූල්‍ය ප්‍රගතිය රු.මි 341.16 කි.

## 5.6. ජීවනෝපාය සංවර්ධන හා ස්වයං රැකියා සඳහා ඒකාබද්ධ යටිතල පහසුකම්

ස්වයං රැකියාලාභීන් හට පුළුල් නිෂ්පාදන හා සේවා වෙළඳපොළක් ලබාදීමෙන් රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඔවුනගේ වැඩිදායකත්වයක් ලබා ගැනීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වූ අතර රට තුළම නිෂ්පාදනය කර පරිභෝජනය කිරීම නිසා විදේශයට ඇදීයන මුදල් රට තුළම ඉතිරිවීම හා ජනතාවගේ ජීවන තත්වය උසස්වීම ආදී ප්‍රතිලාභ රැසක් මෙමගින් අත්පත් කරගත හැකිවේ යයි උපකල්පනය කරන ලදී. එමෙන්ම ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය වීම නිසා නාගරීකරණයට හසුනොවී ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරිම සඳහා ප්‍රජාව ගම තුළ රඳවා ගැනීම අපේක්ෂා කරන ලදී.



ප්‍රතිසංස්කරණය කරන ලද මලල්පොල පිදුරුවැල්ල පාලම
යටියන්තොට ප්‍රා ලේ කොට්ඨාශය
දිස්ත්‍රික්කය කෑගල්ල



තේ දළු ප්‍රවාහනය සඳහා මහදිගආරාව මාර්ගය කොන්ක්‍රීට් කිරීම
හාලිඇල ප්‍රා ලේ කොට්ඨාශය
බදුල්ල දිස්ත්‍රික්කය

## ජීවනෝපාය සංවර්ධන හා ස්වයං රැකියා සඳහා ඒකාබද්ධ යටිතල පහසුකම් ව්‍යාපෘතිය

## 2012.12.31 දින වන විටඅත්පත් කරගෙන ඇති ප්‍රගතිය

වගු අංක 5.6.1

| දිස්ත්‍රික්කය | අනුමත මුදල (රු.මි) | වියදම් කරන ලද මුදල(රු.මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක තත්වයේ පැවති ව්‍යාපෘති ගණන |
| කොළඹ | 61.54 | 15.58 | 5 | 5 | |
| ගම්පහ | 38.46 | 17.30 | 1 | 1 | |
| මාතර | 3.97 | 0.80 | 1 | | 1 |
| හම්බන්තොට | 112.34 | 26.00 | 1 | | 1 |
| කෑගල්ල | 18.91 | 24.88 | 3 | 1 | |
| රත්නපුර | 33.09 | 6.22 | 2 | 1 | |
| අනුරාධපුරය | 127.58 | 117.78 | 661 | 79 | 582 |
| පොළොන්නරුව | 112.71 | 51.65 | 190 | 116 | 187 |
| බදුල්ල | 1.57 | 7.06 | 6 | 6 | |
| මොණරාගල | 65.50 | 5.35 | 3 | 1 | 2 |
| පුත්තලම | 20.00 | 20.00 | 26 | 26 | |
| කුරුණෑගල | 75.00 | 31.39 | 328 | 328 | |
| මහනුවර | 10.10 | 10.03 | 1 | 1 | |
| ත්‍රිකුණාමලය | 50.00 | 28.80 | 10 | 9 | 1 |
| මන්නාරම | 0.41 | | 3 | 1 | |
| **එකතුව** | **731.18** | **362.84** | **1241** | **575** | **774** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

- 2012 වර්ෂයේදී අනුමත ව්‍යාපෘති ගණන 1241 ක් වන අතර අනුමත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි 731.18 කි. 2012.12.31 දින වන විට ව්‍යාපෘති 575 ක වැඩ අවසන් කර ඇති අතර රු.මි 362.84 ක් වියදම් කර ඇත. එමෙන්ම ව්‍යාපෘති 774 ක් ක්‍රියාත්මක තත්වයේ පවතී.

## 5.7. උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දුන් අතර පසුගිය වසර කිහිපය තුළ ආධාර ලබා දෙන ජාත්‍යන්තර ආයතනවල සහයෝගයද ඇතිව එම ප්‍රදේශය තුළ වේගවත් සංවර්ධනයක් ඇති කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ග අනුව, උතුරු වසන්තය හා නැගෙනහිර නවෝදය සංවර්ධන වැඩසටහන් ඉහත කී ප්‍රදේශයන්හි කඩිනම් අවශ්‍යතා මෙන්ම දිගුකාලීන සංවර්ධන අවශ්‍යතාද සපුරා ගැනීම පිණිස රජය ආරම්භ කළ ප්‍රවේශයන් වේ.

යුධමය තත්ත්වය හේතුවෙන් විනාශවූ සමාජ හා ආර්ථික යටිතල පහසුකම් නැවත ගොඩ නැංවීම සඳහා කෙටි කාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වැඩසටහන් ඇතුළත් සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක තත්වයේ පැවතිණි. ඒ යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය, නිවාස, ජල සම්පාදන යෝජනා ක්‍රම, වාරිමාර්ග යෝජනා ක්‍රම, මළාපවහන පද්ධති, රෝහල්, පාසල් ගොඩනැගිලි , පාලම්, බෝක්කු ප්‍රතිසංස්කරණය, විදුලිබල පහසුකම් සපයාදීම හා ජීවනෝපාය සංවර්ධන කටයුතු ද 2012 වර්ෂයේදී සිදු කරන ලදී.

### 5.7.1 මාර්ග හා පාලම්

දීර්ඝ කාලයක් පුරා පැවති ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් තුළ පිරිහීමට පත්ව තිබූ මාර්ග පද්ධතියේ අඩුපාඩුකම් සම්පූර්ණ කර එම ප්‍රදේශවල ජීවත් වන ජනතාව හට වෙළඳපොළ ප්‍රවේශ වීම, නිෂ්පාදන මිලදී ගැනීම මෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය හා සංස්කෘතික කටයුතු සඳහා පහසුකම් සලසාදීම පිණිස රජය දියත් කර ඇති සංවර්ධන ක්‍රියාමාලාවේ එක් අදියරක් ලෙස මාර්ග හා පාලම් ප්‍රතිසංස්කරණය සඳහන් කළ හැකිය.

#### උතුරු පළාත

පළාතේ මාර්ග සංවර්ධනය සඳහා අමාත්‍යාංශය රු.මි 3,310.93ක් ආයෝජනය කර ඇති අතර මේ යටතේ ග්‍රාමීය මාර්ග කි.මී. 470.15 ක් හා පාලම් 12 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර මහා මාර්ග කි.මී. 281.16 ක් කාපට් කිරීම 2012.12.31 දින වන විට සිදු කරමින් පැවතිණි.

#### උතුරු පළාත -2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.1

| දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම | භෞතික ඉලක්කය 2012 (කි.මී./ සංඛ්‍යාව ) | ලඟා කරගත් ඉලක්කය 2012.12.31 (කි.මී./ සංඛ්‍යාව ) | | ප්‍රතිපාදන 2012 (රු. මි. ) | වියදම 2012.12.31 (රු. මි. ) |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් | ක්‍රියාත්මක වෙමින් පැවති | | |
| යාපනය | මහා මාර්ග (කි.මී. ) | 60.87 | | 60.87 | 577.00 | 559.70 |
| | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 219.52 | 149.82 | 46.15 | 583.65 | 361.24 |
| | පාලම් (සංඛ්‍යාව ) | 4 | 1 | 3 | | |
| කිලිනොච්චි | මහා මාර්ග (කි.මී. ) | 43.84 | | 43.84 | 491.67 | 472.80 |
| | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 131.44 | 59.85 | 35.63 | 215.14 | 131.79 |
| | පාලම් (සංඛ්‍යාව ) | 6 | 5 | | | |
| මුලතිව් | මහා මාර්ග (කි.මී. ) | 85.45 | | 85.45 | 716.83 | 699.71 |
| | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 129.26 | 74.25 | 58.67 | 296.41 | 163.16 |
| | පාලම් (සංඛ්‍යාව ) | පාලම් - 4<br>හරස් මාර්ග -2<br>බෝක්කු -1 | පාලම් -1 | පාලම් - 3<br>හරස් මාර්ග -2<br>බෝක්කු -1 | | |
| වවුනියාව | මහා මාර්ග (කි.මී. ) | 23.07 | | 23.07 | 110.00 | 95.01 |
| | ග්‍රාමීය මාර්ග (කි.මී.) | 181.63 | 90.69 | 42.48 | 420.26 | 271.66 |
| | පාලම් (සංඛ්‍යාව ) | 2 | 2 | | | |
| මන්නාරම | මහා මාර්ග (කි.මී. ) | 31.93 | _ | 31.93 | 377.00 | 354.96 |
| | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 201.84 | 95.54 | 80.60 | 286.93 | 200.89 |
| | පාලම් (සංඛ්‍යාව ) | පාලම් 3 | 3 | | | |
| **එකතුව** | **මහා මාර්ග (කි.මී. )** | **281.16** | | **281.16** | **4074.89** | **3310.93** |
| | **ග්‍රාමීය මාර්ග (කි.මී. )** | **863.69** | **470.15** | **263.53** | | |
| | **පාලම් (සංඛ්‍යාව )** | **පාලම් -19<br>හරස් මාර්ග-2<br>බෝක්කු-1** | **පාලම් -12** | **පාලම්- 6<br>හරස් මාර්ග-2<br>බෝක්කු-1** | | |





තෝනික්කල් ලක්ෂපාන ග්‍රාමීය මාර්ගය
වව්නියාව දිස්ත්‍රික්කය

පරන්තන් පූහරින් මාර්ගය
කිලිනොච්චි දිස්ත්‍රික්කය

## නැගෙනහිර පළාත

පළාතේ මාර්ග සංවර්ධනය සඳහා අමාත්‍යාංශය රු.මි 1,149.83 ක් ආයෝජනය කර ඇති අතර මේ යටතේ ග්‍රාමීය මාර්ග කි.මි. 285.85 ක හා පාලම් 37 ක ප්‍රතිසංස්කරණ කාර්යයන් සිදු කර ඇත.

### නැගෙනහිර පළාත - 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.2

| දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම | භෞතික ඉලක්කය 2012 (කි.මී./ සංඛ්‍යාව ) | ලඟා කරගත් ඉලක්කය 2012.12.31 (කි.මී./ සංඛ්‍යාව ) | | ප්‍රතිපාදන 2012 (රු. මි. ) | වියදම 2012.12.31 (රු. මි. ) |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ අවසන් | ක්‍රියාත්මක වෙමින් පැවති | | |
| ත්‍රිකුණාමලය | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 131.40 | 58.37 | 70.06 | 341.03 | 166.33 |
| | පාලම් (සංඛ්‍යාව ) | 78 | 15 | 62 | | |
| මඩකලපුව | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 102.63 | 55.52 | 40.73 | 557.10 | 441.03 |
| | පාලම් (සංඛ්‍යාව ) | 36 | 19 | 3 | | |
| අම්පාර | ග්‍රාමීය මාර්ග (කි.මී. ) | 260.96 | 182.25 | 110.50 | 801.49 | 542.47 |
| | පාලම් (සංඛ්‍යාව ) | 23 | 3 | 3 | | |
| **එකතුව** | **ග්‍රාමීය මාර්ග කි.මී.** | **494.99** | **285.85** | **221.29** | **1,699.62** | **1,149.83** |
| | **පාලම් (සංඛ්‍යාව )** | **137** | **37** | **68** | | |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය





අල් අමීන් මාර්ගය කොන්ක්‍රීට් කිරීම
කවතාමුණෙයි - මඩකලපුව

පාලම හා බෝක්කුව ඉදිකිරීම
වෙරුගල් - ත්‍රිකුණාමලය

### 5.7.2 විදුලි බල හා බල ශක්ති

යුධමය ගැටුම් පැවති වකවානුව තුළ බිඳවැටුනු විදුලිබල පද්ධතිය යළි නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව උතුරු පළාත තුළ විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන හා විදුලිය දීර්ඝ කිරීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරිම සඳහා විදේශාධාර ව්‍යාපෘති මගින් මූල්‍ය ප්‍රතිපාදනය සැපයීම සිදු කරන ලදී.

මේ යටතේ යාපනය, කිලිනොච්චිය හා මුලතිවු දිස්ත්‍රික්කයන්හි විදුලිබල අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2012 වර්ෂයේදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.මි. 731.12 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2012.12.31 දින වන විට රු.මි. 714.88 මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මේ යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන් පහත සඳහන් වේ.

- කි. වො. 132/33 පමණ වු චුන්නාහම් උප විදුලි පොල ඉදි කිරීම
- කි. වො. 132 පමණ වු කිලිනොච්චි සිට චුන්නාහම් දක්වා වු ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ විදුලි මාර්ගය ඉදිකිරිම



කිලිනොච්චි චුන්නාහම් සම්ප්‍රේෂණ දිගුව

චුන්නාහම් විදුලි උප පොළ ඉදිකිරීම



### 5.7.3 දිළිඳුකම පිටු දැකීම

උතුරු පළාත තුළ නැවත පදිංචි කිරීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමේ අරමුණින් හා අභ්‍යන්තරව අවතැන්වු ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ අරමුණින් 2012 වර්ෂය තුළ ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර මෙට්‍රික් ටොන් 19,500.86 ක් ප්‍රතිලාභීන් 408,879 ක් අතර බෙදා දිම සඳහා රු.මි. 2,415.54 වැය කර ඇත. එමෙන්ම නැගෙනහිර පළාතේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමේ අරමුණින් හා අභ්‍යන්තරව අවතැන්වු ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ අරමුණින් 2012 වර්ෂය තුළ ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර මෙට්‍රික් ටොන් 69.18 ක් ප්‍රතිලාභීන් 1,387 ක් බෙදා දීම සඳහා රු.මි. 9.41 වැය කර ඇත.



තෝරා ගත් කණ්ඩායම් වල පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම

වැඩ සඳහා ආහාර



## උතුරු පළාත -2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.3

| දිස්ත්‍රික්කය | ලගා කරගත් ඉලක්කය 201.12.31 (ආහාර මෙ.ටො) | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2012 (රු. මි.) | වියදම 2012.12.31 (රු. මි. ) |
|---|---|---|---|---|
| යාපනය | 5,975.09 | 164,530 | 850.00 | 740.38 |
| කිලිනොච්චිය | 2,759.82 | 53,034 | 350.00 | 341.97 |
| මුලතිව් | 4,627.12 | 63,234 | 580.00 | 573.34 |
| වව්නියාව | 3,605.54 | 69,422 | 475.00 | 446.77 |
| මන්නාරම | 2,533.29 | 58,659 | 324.00 | 313.08 |
| **එකතුව** | **19,500.86** | **408,879** | **2,579.00** | **2,415.54** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## නැගෙනහිර පළාත - 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.4

| දිස්ත්‍රික්කය | ලගා කරගත් ඉලක්කය 2012.12.31 (ආහාර මෙ. ටො.) | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ප්‍රතිපාදන 2012 (රු. මි. ) | වියදම 2012.12.31 (රු. මි. ) |
|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 30.72 | 596 | 4.00 | 3.84 |
| මඩකලපුව | 17.95 | 264 | 3.00 | 2.57 |
| අම්පාර | 20.51 | 527 | 4.00 | 3.00 |
| **එකතුව** | **69.18** | **1387** | **11.00** | **9.41** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 5.7.4 නිවාස සංවර්ධනය

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව, සෑම පවුලක් සඳහාම රැකවරණය, මූලික සෞඛ්‍ය පහසුකම් හා ආහාර සුරක්ෂිතතාවය සහිත වටපිටාවක පිහිටි සැප පහසු නිවසක ජීවත් වීම සහතික කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. සමාජයේ වෙසෙන විශේෂ ඉලක්කගත කණ්ඩායමක් වශයෙන් හඳුනාගෙන ඇති උතුරු පළාතේ යුද්ධයෙන් අවතැන්වූ පුද්ගලයන් සඳහා තත්ත්වයෙන් උසස් නිවාස සැපයීමේ අරමුණින් ආරම්භ කරන ලද නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතිය මගින් 2012 වර්ෂය තුළ නිවාස 1000 ක් ඉදි කර ඇත. සමස්ථ ආයෝජනය රු.මි. 1,645.09 කි .



ඉන්දියානු නියමු නිවාස ව්‍යාපෘතිය
කිලිනොච්චි දිස්ත්‍රික්කය



ඉන්දියානු නියමු නිවාස ව්‍යාපෘතිය
මුලතිව් දිස්ත්‍රික්කය

### නිවාස සංවර්ධනය 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.5

| දිස්ත්‍රික්කය | ඉදි කරන ලද නිවාස ප්‍රමාණය | ප්‍රතිපාදන 2012 (රු.මි) | වියදම 2012.12.31 (රු.මි) | ප්‍රතිලාභීන් ප්‍රමාණය(පවුල්) |
|---|---|---|---|---|
| යාපනය | 150 | 1,650.00 | 1,645.09 | 150 |
| කිලිනොච්චිය | 250 | | | 250 |
| මුලතිව් | 250 | | | 250 |
| වව්නියාව | 175 | | | 175 |
| මන්නාරම | 175 | | | 175 |
| | 1000 | 1,650.00 | 1,645.09 | **1,000** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 5.7.5 ජල සම්පාදන හා ජලාපවහන වැඩසටහන

වසර 2020 වන විට රටෙහි වාසය කරන සෑම පුරවැසියෙකුටම කාර්යක්ෂම තිරසාර ක්‍රමවේදයක් තුළින් දැරිය හැකි පිරිවැයකට පිරිසිදු පානීය ජලය ලබා දීම රජයේ අරමුණයි. මෙම අරමුණ පෙරදැරි කරගෙන අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ දී ඔවුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම සඳහා රජය දැඩි අවධානය යොමු කර ඇති අතර පානීය ජල ව්‍යාපෘති , ළිං හා ජලාපවහන කාණු පද්ධති ඉදි කිරීම සඳහා උතුරු නැගෙනහිර පළාත වෙනුවෙන් 2012 වර්ෂය තුළ කරන ලද සමස්ථ ආයෝජනය රු.මි. 1,123.29කි.

### උතුරු පළාත - 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.6

| දිස්ත්‍රික්කය | ඉදි කරන ලද ළිං හා ජල යෝජනා ක්‍රම | ප්‍රතිපාදන 2012 (රු.මි.) | වියදම 2012.12.31 (රු.මි) |
|---|---|---|---|
| යාපනය | ළිං 559 | 401.34 | 326.79 |
| කිලිනොච්චිය | ළිං 27 | 4.95 | 2.34 |
| මුලතිව් | ළිං 11 | 226.42 | 224.44 |
| වව්නියාව | ළිං 12 | 29.11 | 1.00 |
| මන්නාරම | ළිං 6, ජල යෝජනා ක්‍රම 2 | 234.14 | 229.47 |
| **එකතුව** | **ළිං 615, ජල යෝජනා ක්‍රම 2** | **895.96** | **784.04** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



වැල්වැටිතුරේ පානීය ජල යෝජනා ක්‍රමය යාපනය දිස්ත්‍රික්කය

පල්ලවරායන්කට්ටු ප්‍රදේශයේ ළිං ඉදිකිරීම කිලිනොච්චි දිසිත්‍රික්කය



### නැගෙනහිර පළාත- 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.7

| දිස්ත්‍රික්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිපාදන 2012 (රු.මි) | වියදම 2012.12.31 (රු.මි) |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | ජලාපවහන කාණු කි.මී 3 .55 | 331.79 | 282.63 |
| මඩකලපුව | ළිං 12 , ජලාපවහන කාණු කි.මී 0.69 | 148.06 | 33.38 |
| අම්පාර | ළිං 2 , ජලාපවහන කාණු කි.මී 10.16 | 84.82 | 23.24 |
| **එකතුව** | **ළිං 14 , ජලාපවහන කාණු කි.මී 13.85** | **564.67** | **339.25** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



පානීය ජල යෝජනා ක්‍රමයක් ඉදිකිරීම
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය



ජෝති පටුමගෙහි කාණු පද්ධතිය සකස්කිරීම
ආරයම්පතී ග්‍රාම නිලධාරි වසම - මඩකලපුව දිස්ත්‍රික්කය

## 5.7.6 වාරිමාර්ග

උතුරු හා නැගෙනහිර පළාත් තුළ යුධමය ගැටුම් පැවති සමයේ විනාශයට පත් සුළු,මධ්‍ය හා මහා පරිමාණ වාරි මාර්ග නැවත ගොඩනැංවීම හේතුවෙන් මනා ලෙස ජල සංරක්ෂණය හා කළමනාකරණය කිරීමට හැකි විය. මෙමගින් වගා කටයුතු සඳහා ජලය සැපයීම තුළින් කෘෂිකාර්මික නිෂ්පාදිතය වැඩිවී ඇති අතර එම ප්‍රදේශ වල ජනතාවගේ ජීවනෝපාය ක්‍රියාකාරකම්ද වැඩිදියුණු වී ඇත.

### 2012.12.31 දිනට සිදු කරන ලද වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතිය පහත පරිදි වේ.



කුඩෙයිතාංගි වැව
මුලතිව් දිස්ත්‍රික්කය



පිරමන්තාරු වැව
කිලිනොච්චි දිස්ත්‍රික්කය



පුළුගනාවි වැව
මඩකලපුව දිස්ත්‍රික්කය

**උතුරු පළාත -2012.12.31 දිනට ප්‍රගතිය**

වගු අංක 5.7.8

| අංශය | 2012 වර්ෂයේ ලගා කර ගත් ඉලක්කය (වැව් සංඛ්‍යාව) | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|
| සුළු පරිමාණ වැව් | 95 | 1046.99 | 847.17 |
| මහා හා මධ්‍ය පරිමාණ වැව් | 11 | 654.57 | 536.97 |
| **එකතුව** | **106** | **1701.56** | **1384.14** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**නැගෙනහිර පළාත -2012.12.31 දිනට ප්‍රගතිය**

වගු අංක 5.7.9

| අංශය | 2012 වර්ෂයේ ලගා කර ගත් ඉලක්කය (වැව් සංඛ්‍යාව ) | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|
| සුළු පරිමාණ වැව් | 38 | 348.32 | 257.73 |
| මහා පරිමාණ වැව් (කරවාහු වැව) | 1 | 92.46 | 67.27 |
| **එකතුව** | **39** | **440.78** | **325.00** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## 5.7.7 යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

යුධමය ගැටුම් හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් තුළ විනාශ වූ රජයේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා 2012 වර්ෂය තුළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් වැය කළ මුදල රු.මි. 2630.77 කි. මෙහිදී රජයේ පරිපාලන ගොඩනැගිලි, පාසල්, රෝහල් හා පොදු ගොඩනැගිලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රමුඛතාවය දෙන ලදී.

## උතුරු පළාත-2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.10

| අංශය | භෞතික ප්‍රගතිය (සංඛ්‍යාව) | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|
| රජයේ පරිපාලන ගොඩනැගිලි | 114 | 1339.40 | 1206.71 |
| පාසල් | 70 | 341.48 | 324.72 |
| රෝහල් | 65 | 517.03 | 509.21 |
| ගොවිජනසේවා මධ්‍යස්ථාන | 61 | 222.24 | 197.96 |
| පොදු ගොඩනැගිලි | 13 | 245.87 | 113.28 |
| වෙළඳ පොළ මධ්‍යස්ථාන | 135 | 250.02 | 38.72 |
| **එකතුව** | 458 | 2916.04 | 2390.60 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



මල්ලාකම් උසාවි සංකීර්ණය
යාපනය දිස්ත්‍රික්කය



විලාවනෙයි විද්‍යාලය
මුලතිව් දිස්ත්‍රික්කය



තෙල්ලිපලෙයි ප්‍රා.ලේ කාර්යාලය
යාපනය දිස්ත්‍රික්කය



යාපනය රෝහල නවීකරණය කිරීම



තලෙයි මන්නාරම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම
මන්නාරම දිස්ත්‍රික්කය



පන්නන්කන්ඩි සුසාන භූමිය
කිලිනොච්චි දිස්ත්‍රික්කය

## නැගෙනහිර පළාත-2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.7.11

| අංශය | භෞතික ප්‍රගතිය (සංඛ්‍යාව) | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|
| රෝහල් | 14 | 141.70 | 141.70 |
| පොදු ගොඩනැගිලි | 2 | 258.52 | 47.39 |
| වෙළඳ පොළ මධ්‍යස්ථාන | 10 | 236.88 | 51.08 |
| **එකතුව** | **26** | **637.10** | **240.17** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



ත්‍රිකුණාමලය පොදු රෝහල සඳහා වෛද්‍ය උපකරණ සැපයීම හා ගොඩනැගිලි නවීකරණය කිරීම



එරාවූර්හි ළමා උද්‍යානය ඉදිකිරීම
මඩකලපුව දිස්ත්‍රික්කය



ඉරක්කාමම්හි වෙළඳපළ ගොඩනැගිල්ල ඉදිකිරීම
අම්පාර දිස්ත්‍රික්කය

## 5.8. බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන

උතුරේ පැවති ත්‍රස්තවාදී කටයුතු නිමා වීමත් සමඟ ප්‍රධානතම අභියෝගය වුයේ යුධ ගැටුම් පැවති ප්‍රදේශවල බිම් බෝම්බ වලින් තොර පරිසරයක් නිර්මාණය කිරීමයි. මේ සඳහා රජය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කර බිම් බෝම්බ සහ යුද්ධයෙන් ශේෂවු පුපුරණ ද්‍රව්‍යයන්ගෙන් නිදහස් කර ගැනීම සඳහා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදි.



අතින් බිම් බෝම්බ ඉවත් කිරීම



පුහුණු කරන ලද බල්ලන් මගින් බිම් බෝම්බ ඉවත් කිරීම



යන්ත්‍ර මගින් බිම් බෝම්බ ඉවත් කිරීම

### 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංක 5.8.1

| දිස්ත්‍රික්කය | බිම් බෝම්බ උවදුරට ගොදුරුවූ මුළු බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | බිම් බෝම්බ ඉවත් කර ඇති බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | බිම් බෝම්බ ඉවත් කිරීමට ඇති බිම් ප්‍රමාණය (වර්ග මීටර්) |
|---|---|---|---|
| යාපනය | 52,095,175 | 47,931,052 | 4,164,123 |
| කිලිනොච්චි | 598,299,576 | 578,845,595 | 19,453,981 |
| මුලතිව් | 230,331,444 | 210,194,453 | 20,136,991 |
| වව්නියා | 223,646,516 | 216,428,340 | 7,218,176 |
| මන්නාරම | 317,235,133 | 291,235,189 | 25,999,944 |
| **උප එකතුව** | **1,421,607,843** | **1,344,634,628** | **76,973,215** |
| ත්‍රිකුණාමලය | 98,687,801 | 95,275,807 | 3,411,994 |
| මඩකලපුව | 495,246,649 | 480,574,937 | 14,671,712 |
| අම්පාර | 46,638,752 | 46,569,646 | 69,107 |
| **උප එකතුව** | **640,573,202** | **622,420,389** | **18,152,813** |
| අනුරාධපුරය | 3,547,971 | 196,695 | 3,351,276 |
| පොලොන්නරුව | 233,900 | 48,279 | 185,621 |
| **උප එකතුව** | **3,781,871** | **244,974** | **3,536,897** |
| **එකතුව** | **2,065,962,916** | **1,967,299,992** | **98,662,925** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

බිම් බෝම්බ බිය තුරන් කර ජීවත් වීමට අවශ්‍ය නිදහස් පරිසරය සකස් කිරීමේ පරමාර්ථය පෙර දැරිව ක්‍රියාත්මක කළ මානුෂවාදී බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන හේතුවෙන් 2012.12.31 දින වන විට බෝම්බ ඉවත් කිරීමට ඉතිරිව පවතින භූමි ප්‍රමාණය වර්ග මීටර් 98,662,925 දක්වා අඩු කිරීමට හැකි විය.







බිම් බෝම්බයක් පිපිරීමෙන් ආබාධිත වූ අයෙක්

ඉවත් කරන ලද බිම් බෝම්බ

බිම් බෝම්බ අවධානම පිළිබඳ දැනුවත් කිරීම

සිතියම් අංක 5.8.1




මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 5.9 උතුරු හා නැගෙනහිර පළාත් හැර අනෙකුත් පළාත් වල ක්‍රියාත්මක කළ විදේශාධාර ව්‍යාපෘති

- උතුරු හා නැගෙනහිර පළාත් තුළ විදේශාධාර ව්‍යාපෘති මගින් සිදුකරන ලද සංවර්ධන කාර්යයන්ට අමතරව උතුරුමැද, වයඹ, ඌව, මධ්‍යම, බස්නාහිර, දකුණ හා සබරගමුව යන පළාත් ආශ්‍රිතව සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය 2012.12.31 දිනට පහත පරිදි දැක්විය හැකිය.

#### මාර්ග හා පාලම් ප්‍රතිසංස්කරණය

වගු අංක 5.9.1

| පළාත | 2012.12.31 දිනට භෞතික ප්‍රගතිය | | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2012.12.31 දිනට වියදම (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | මාර්ග (කි.මී) | පාලම් ( සංඛ්‍යාව) | | | |
| උතුරුමැද පළාත | 62.57 | 3 | 406.44 | 391.33 | 12,060 |
| වයඹ පළාත | 54.09 | 15 | 139.85 | 182.95 | 78,114 |
| ඌව පළාත | 101.50 | 1 | 215.04 | 151.60 | 50,266 |
| මධ්‍යම පළාත | 47.50 | 2 | 447.80 | 658.49 | 29,427 |
| **එකතුව** | **265.66** | **21** | **1,209.13** | **1,384.37** | **169,867** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

#### සුළු පරිමාණ වැව් ප්‍රතිසංස්කරණය

වගු අංක 5.9.2

| පළාත | 2012.12.31 දිනට භෞතික ප්‍රගතිය (වැව් සංඛ්‍යාව) | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2012.12.31 දිනට වියදම (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| උතුරුමැද පළාත | 18 | 369.36 | 406.28 | 2,662 |
| වයඹ පළාත | 21 | 44.70 | 47.69 | 9,419 |
| ඌව පළාත | 11 | 53.75 | 59.35 | 7,643 |
| මධ්‍යම පළාත | 5 | 151.78 | 116.39 | 816 |
| **එකතුව** | **55** | **619.59** | **629.71** | **20,540** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

- උතුරුමැද හා වයඹ පළාත් තුළ පානීය ජලය ලබාගැනීම සඳහා ළිං 13 ක් ඉදිකරන ලද අතර මේ සඳහා වැයකරන ලද මුදල රු.මි. 37.51 ක් වේ. මෙමගින් ප්‍රතිලාභීන් 16,563 කට පමණ සෙත සැලසෙන බව ගණන් බලා ඇත.

- ගැමිදිරිය ව්‍යාපෘතිය මගින් උතුරුමැද, ඌව, මධ්‍යම, බස්නාහිර හා දකුණ යන පළාත් තුළ පවතින මාර්ග, සුළු පරිමාණ වාරිමාර්ග, පානීය ජල ව්‍යාපෘති, ප්‍රජා ශාලා යන අංශ වල ප්‍රතිසංස්කරණ කාර්යයන් වෙනුවෙන් 2012 වර්ෂය තුළ රු.මි. 1,985.87 ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන ඇති අතර එමගින් ප්‍රතිලාභීන් 487,546 කට පමණ සෙත සැලසී ඇත.

# 6

# උපාය මාර්ගික මූලාරම්භයන් - නැගී එන ආර්ථිකයක්


# 6. සංචාරක කටයුතු හා පොදු විනෝදාත්මක පහසුකම් සංවර්ධනය

ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා සංචාරක ආර්ථිකය සුවිශේෂි වූ දායකත්වයක් සපයනු ලබයි. 2012 වර්ෂයේදී දළ ජාතික නිෂ්පාදිතයට සංචාරක ව්‍යාපාරයේ දායකත්වය 1.4% ක් පමණ වේ. පැවති යුධමය වාතාවරණය හේතුවෙන් සංචාරක ව්‍යාපාරයේ යම් පසුබෑමක් සිදුවුවද යුද්ධය නිමාවීමත් සමඟම සංචාරක කර්මාන්තය වසරකට 30% ක පමණ වර්ධන වේගයක් පෙන්නුම් කරමින් ඉතා වේගයෙන් පුළුල් වන අයුරු දැකිය හැකි විය.

2012 වසරේ අපේක්ෂිත සංචාරක පැමිණීම් ඉලක්කය වූ සංචාරකයින් මිලියනය ඉක්මවා සංචාරකයින් මෙරටට පැමිණි අතර මෙරටට පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව 1,005,605 ක් වේ. 2012 වර්ෂයේදී සංචාරක ක්ෂේත්‍රයෙන් ලද මුළු ඉපැයීම් ප්‍රමාණය ඇ.ඩො.මි. 1038.3 ක් බව ගණන් බලා ඇත.

**සංචාරක පැමිණීම් - 2011 හා 2012 වර්ෂ සඳහා**

රූප සටහන් අංක 6.1.1




මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2011 වසරේදී දියත් කළ පස් අවුරුදු (2011-2016) සංචාරක සංවර්ධන උපායමාර්ගික සැලැස්මට අනුව වර්ෂ 2016 වන විට මිලියන 2.5ක සංචාරකයින්ගේ පැමිණීම ඉලක්ක කර සංචාරක ක්ෂේත්‍රයේ සියළු කටයුතු සැලසුම් කෙරිනි. ඒ අනුව සංචාරක ක්ෂේත්‍රයේ උපාය මාර්ග, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් ඔස්සේ මෙහෙයවන ලදී. එනම් සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය (Tourist Facility Development), සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Tourism Promotion), සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීම (Tourism Human Resources Development) වේ. මෙම ක්ෂේත්‍ර ශක්තිමත් කරමින් 2011-2016 කාලය තුළ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සෘජු විදේශ ආයෝජන ඇ. ඩො. මි. 3000 මට්ටමකට ගෙන ඒමත්, වසර 2016 වන විට සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සෘජු රැකියා අවස්ථා 500,000ක් පමණ බිහි කරලීමත්, ඉලක්ක කර ගෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා සංචාරක ක්ෂේත්‍රයේ නියැලි ඒ යටතේ වූ ආයතන සමූහය ක්‍රියාත්මක විය.

## 6.1 සංචාරක පහසුකම් වැඩි කිරීම :Tourist Facility Development)

සංචාරක පැමිණීම් සංඛ්‍යාත්මකව වැඩිවීමට වඩා ඉතා ඉහළ ක්‍රයශක්තියක් ඇති සංචාරකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ සිදුකරන ලදී. වසර 2016 දී ඉලක්කගත සංචාරක පැමිණීම් වන මිලියන 2.5 ට වැඩිකර ගැනීමට අවශ්‍ය කරන්නා වූ නවාතැන් පහසුකම් සැපයීම අරමුණු කර ගෙන ප්‍රධාන සංචාරක නිකේතනයන්හි පහසුකම් වැඩි කිරීමේ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කළ අතර විශේෂයෙන්ම ඉහළ ක්‍රයශක්තියක් ඇති සංචාරකයින්ගේ ගමනාන්ත ලෙස කල්පිටිය, පාසිකුඩා, කුච්චවේලි, දෙද්දුව ආදී නව සංචාරක කලාප පරිසර හිතකාමී අයුරින් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

### ඉදිවෙමින් පවතින සංචාරක නිකේතන පිළිබඳ 2012-12-31 දිනට ප්‍රගතිය

වගු අංකය 6:1:1

| සංචාරක කලාපය | භූමි ප්‍රමාණය(අක්කර) | ඉදිකිරීමට යෝජිත කාමර ගණන | දැනට වැඩ නිමකර ඇති කාමර ගණන | දැනට ඉදිකරමින් පවතින කාමර ගණන | දැනට පෞද්ගලික අංශයේ දායකත්වය (රු.මි.) |
|---|---|---|---|---|---|
| පාසිකුඩා | 156 | 854 | 130 | 724 | 10161.0 |
| කල්පිටිය | දූපත් 14 (අක්කර 20,562) | 5,000 | - | කාමර 88ක් ඉදිකෙරෙමින් ඇති අතර කාමර 200ක් ඉදිකිරීමට සැලසුම් සකස්කර ඇත | 5,100ක් අපේක්ෂා කෙරෙනු ඇත. |
| කුච්චවේලි | 510 | 3,000 | 50 | - | 850.0 |
| දෙද්දූව | 1,734 | - | - | - | - |
| යාල | 1136 | 345 | 66 (2010 සිට සේවා සපයයි) | 84 | 2705.0 |
| බෙන්තොට | 100 | 615 | 497 | 118 | - |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



පැරඩයිස් සංචාරක නිකේතනය - පාසිකුඩා



අගෝඩා සංචාරක නිකේතනය - පාසිකුඩා

### ❖ එක් වහලක් යටතේ පහසුකම් සැලසීමේ ඒකකය

සංචාරක පහසුකම් සංවර්ධනය වේගවත්ව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් එක් වහලක් යටතේ සියළු පහසුකම් සැලසීමේ ඒකකය (One Stop Unit) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය තුළ ස්ථාපිත කර ඇත. මෙමගින් සංචාරක හෝටල් ව්‍යාපෘතින්වල ආයෝජකයින්ගේ ගැටළු කඩිනමින් නිරාකරණය කොට අවශ්‍ය අනුමැතීන් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලදී.

## එක් වහලක් යටතේ පහසුකම් සැලසීමේ ඒකකයේ ප්‍රගතිය (One Stop Unit ) - 2012

වගු අංකය 6:1:2

| | 2011 | 2012 |
|---|---|---|
| අනුමැතිය සඳහා ඉදිරිපත් වූ ව්‍යාපෘති සංඛ්‍යාව | 210 | 283 |
| අනුමැතීන් ලබා දුන් ව්‍යාපෘති සංඛ්‍යාව | 92 | 112 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## දිස්ත්‍රික් වශයෙන් එක් වහලක් යටතේ ව්‍යාපෘතීන් සඳහා අනුමැතීන් ලබා ගැනීම - 2012

වගු අංකය 6:1:3

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතීන් සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුරය | 1 | 28 |
| මඩකලපුව | 14 | 429 |
| බදුල්ල | 1 | 12 |
| කොළඹ | 17 | 1872 |
| ගාල්ල | 19 | 945 |
| ගම්පහ | 8 | 583 |
| හම්බන්තොට | 9 | 195 |
| යාපනය | 4 | 110 |
| කළුතර | 11 | 631 |
| මහනුවර | 2 | 130 |
| මාතලේ | 3 | 147 |
| මාතර | 8 | 360 |
| නුවරඑළිය | 2 | 84 |
| පුත්තලම | 6 | 325 |
| ත්‍රිකුණාමලය | 7 | 238 |
| | **112** | **6089** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### ❖ සංචාරක සත්කාරක නිවාස වැඩසටහන (Home Stay Programme)

සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රබල සැපයුම්කරුවන් බවට ප්‍රජාව පත් කර ගෙන ඔවුන්ට එහි ප්‍රතිලාභ සෘජුවම ලබා දීමත්, ඉලක්ක ගත සංචාරක පැමිණීම් වලට සාපේක්ෂව අපේක්ෂිත කාමර සංඛ්‍යාව සැපයීම සහතික කිරීමත් යන අරමුණු පෙර දැරිව මෙම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කෙරිනි. විශේෂයෙන්ම දිවි නැගුම ජාතික වැඩසටහන සමග සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන මගින් පවුලේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කිරීමට මනා පිටුවහලක් සපයයි.

ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක සත්කාරක නිවාස ආරම්භ කිරීමට කැමති පුද්ගලයින්ට අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම්, ප්‍රචාරණය හා දිරිගැන්වීම් සිදු කරනු ලබයි.



සත්කාරක නිවාස පිළිබඳව දැනුවත් කිරීම්



සත්කාරක නිවාස හිමියන් සඳහා පුහුණු වැඩමුළු පවත්වමින්

### සංචාරක සත්කාරක නිවාස වැඩසටහන 2012.12.31 දිනට ප්‍රගතිය

වගු අංකය 6:1:4

| ඉලක්කය | ළඟා කර ගත් කාමර සංඛ්‍යාව (2012.12.31) | % |
|---|---|---|
| 1500 | 972 | 64.8 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### ❖ දේශීය තානායම් වැඩි දියුණු කිරීම - 'තානායම වැඩසටහන'

"තානායම වැඩසටහනෙහි" ප්‍රධාන අරමුණ වන්නේ දේශීය සංචාරකයන් තුළ දේශීය තානායම් පිළිබඳව ප්‍රසාදයක් නැවත ඇති කර ඒවායේ සේවාලාභීන්ට ඉහළම ආගන්තුක සත්කාර සැලසීමයි. මෙහිදී දේශීය ආහාර වට්ටෝරු අනුව ආහාර පිළියෙල කර දීම, ඉහළ ගුණාත්මයෙන් යුක්ත සනීපාරක්‍ෂක සේවා සැලසීම ආදිය මගින් දේශීය සංචාරක කටයුතු වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය තානායම් ප්‍රමිතිකරණය සම්බන්ධ උපදේශන අත්පොත ලබා දී ඒ අනුව කටයුතු කෙරෙන බව සහතික කර ගැනීමට පසු විපරම් ක්‍රියාවලියක් සකස් කර සේවාවන් විධිමත් කිරීමට කටයුතු කර ඇත.



සංවර්ධනය කරන ලද මාරවිල තානායම



වැඩි දියුණු කරන ලද බගවන්තලාව තානායම

### ❖ සංචාරක ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

දුරබැහැර පළාත්වල සිට කොළඹට පැමිණ තම සංචාරක ආයතන ලියාපදිංචි කිරීමට යන කාලය හා පිරිවැය ඉතිරි කර දීම සහ සංචරණ ව්‍යාපාරයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කරලීම ආදී කාර්යයන් ඉතා පහසුවෙන් සහ කඩිනමින් ඉටුකර දීම සඳහා වූ සංචාරක ජංගම සේවා 2012 වර්ෂය තුළදී පවත්වනු ලැබීය. මේ යටතේ අනුරාධපුරය, කල්පිටිය, අරුගම්බේ, ත්‍රිකුණාමලය, බෙන්තොට ආදී ප්‍රධාන සංචාරක පුරවරයන් කේන්ද්‍ර කොට ගනිමින් සංචාරක ජංගම සේවා සහ දැණුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.




සංචාරක ජංගම සේවා වැඩමුළුවක්



සත්කාරක නිවාස හිමියන් සඳහා පුහුණු සැසියක් පවත්වමින්

### 6.1.1 සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විදේශාධාර ව්‍යාපෘතීන්හි දායකත්වය

**ජපන් රජයේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (TRIP)** අවසන් අදියරට පැමිණ ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මීගමුව, සීගිරිය, අනුරාධපුරය හා නුවරඑළිය සංචාරක ගමනාන්තයන්හි යටිතල පහසුකම් සංවර්ධනය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනයේ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පුළුල් කිරීම, ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජපානයේ සංචාරක අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම යනාදී අංග සඳහා ප්‍රමුඛත්වය ලබා දී ක්‍රියාත්මක කර ඇත. එමගින් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී.

#### යටිතල පහසුකම් සංවර්ධනය

මේ යටතේ මීගමුව නගරයේ හැමිල්ටන් ඇළ වැඩි දියුණු කිරීමත්, නව මාළු සංකීර්ණයක් ඉදිකිරීම හා නගර අලංකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඉනාමළුව-සීගිරිය ප්‍රධාන මාර්ගය, තෙන්නකෝන් මාවත හා සීගිරිය-මොරගස්වැව මාර්ගය වැඩි දියුණු කර වටරවුම් මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමත්, අනුරාධපුරයේ පූජා නගරයේ වටරවුම්පාර වැඩිදියුණු කිරීම හා මල්වතු ඔය උද්‍යාන සංවර්ධනයත් සිදු කරන ලද අතර නුවරඑළියේ වික්ටෝරියා උද්‍යානය වැඩිදියුණු කිරීම හා ග්‍රෙගරි වැව ආශ්‍රිත සංචාරක උද්‍යානයක් ඉදි කිරීම යන ක්‍රියාකාරකම් අවසන් කර ඇත.





හැමිල්ටන් ඇළ සංවර්ධනය කිරීම



වික්ටෝරියා උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය - නුවරඑළිය



ග්‍රෙගරි උද්‍යානයේ සංවර්ධනය - නුවරඑළිය

### මහනුවර පල්ලෙකැලේ සංචාරක හෝටල් පාසල ඉදි කිරීම

මේ යටතේ රු.මි. 255.0 ක් වැය කර අංග සම්පූර්ණ නව හෝටල් පාසල ඉදි කර අවසන් කර ඇති අතර ඒ සඳහා රු.මි.110 ක් වටිනා නවීන උපකරණ ලබා දී ඇත. 2013 වසරේ දී නිළ වශයෙන් විවෘත කිරීමට නියමිත වර්ග අඩි 5500 කින් යුත් මෙම හෝටල් පාසල, මෙම ක්ෂේත්‍රයට අවතීර්ණ වන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය සියළු නවීන පහසුකම්වලින් යුක්තය.





හෝටල් පාසල සංවර්ධනය - මහනුවර දිස්ත්‍රික්කය

### තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය - 2012 (STDP)

මෙම ව්‍යාපෘතිය 2010 වසරේදී ආරම්භ කරන ලද අතර වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි 2012 වසරේදී එය නැවත සකස් කිරීමට සිදු විය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා සංචාරක ක්ෂේත්‍රයට අදාලව සිදුකරන පාරිසරික හා සමාජ හිතකාමී ආයෝජන සඳහාත්, එවැනි ආයෝජනයන් වැඩි දියුණු කිරීම සඳහාත් තුලන ප්‍රතිපාදන දීමනා (Matching Grant)ක්‍රමය යටතේ පහසුකම් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මෙහෙයුම් අත්පොත සකස් කර 2013 වසරේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු සුදානම් කර ඇත.

මේ යටතේ පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ මැදිහත් වීම මත රු. බි. 4.0 ක ආයෝජන පහසුකම් ලබා දීමට ඉදිරි දෙවර්ෂය තුළදී බලාපොරොත්තු වේ. මේ මඟින් සංචාරක ක්ෂේත්‍රයේ නියැලි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ පිබිදීමක් බලාපොරොත්තු වේ.

### 6.1.2 සංචාරක කටයුතු ප්‍රවර්ධනය (Tourism Promotion)

සංචාරකයින්ගේ පැමිණීම් වර්ෂය පුරාම ඒකාකාරී මට්ටමක පවත්වා ගැනීම අරමුණු කොට ගනිමින් අපගේ සාම්ප්‍රදායික සංචාරක වෙළඳපොළට අමතරව නව වෙළඳපොල හඳුන්වා දෙමින් චීනය, කොරියාව, රුසියාව, මැදපෙරදිග, ඉන්දියාව, ජපානය ආදී රටවල සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලදී .


එසේම 2012 වසරේදී ලොව ප්‍රධාන සංචාරක වෙළඳ ප්‍රදර්ශන, අන්තර්ජාතික මාධ්‍යවේදීන් දැනුවත් කිරීම්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොලෙහි ස්ථාපිත කරන ලද නවතම සංචාරක තොරතුරු පද්ධති (Tourism Information Kiosks), කොළඹ මැරතන් තරඟාවලිය ආදී ක්‍රියාකාරකම් මඟින් ශ්‍රී ලංකාව අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත.






කොළඹ මැරතන් තරඟාවලිය

### අන්තර්ජාතික මාධ්‍ය හරහා ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය




ගල්ෆ් කලාපීය ප්‍රවර්ධනය




චීනයේ මුද්‍රිත මාධ්‍ය මගින්

එසේම ලොව ප්‍රචලිත ගුවන් සමාගම් වන British Airways, Korean Airways ආදී ගුවන් සමාගම් ශ්‍රී ලංකාව සමඟ ඍජු ගුවන් සේවා ආරම්භ කිරීමට නියමිතයි.

### ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පැවැත්වූ වැඩසටහන්වල ප්‍රගතිය

වගු අංකය 6:1:5

| වර්ෂය | වෙළඳ සල්පිල් | | වීදි සංදර්ශන | |
|---|---|---|---|---|
| | රටවල් සංඛ්‍යාව | වෙළඳ සල්පිල් සංඛ්‍යාව | රටවල් සංඛ්‍යාව | වීදි සංදර්ශන සංඛ්‍යාව |
| 2011 | 12 | 18 | 01 | 02 |
| 2012 | 16 | 23 | 01 | 02 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

### අන්තර්ජාතික ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම

මීට අමතරව 2012 වසර පුරා අන්තර්ජාතික මාධ්‍යවේදීන් 181 දෙනෙකු පමණ සහභාගි කරවා ගනිමින් ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත් කිරීමේ සංචාර පවත්වා ඇති අතර එක්සත් රාජධානිය, ඉන්දියාව, චීනය, ජර්මනිය, රුසියාව ආදී ලොව ප්‍රමුඛ පෙළේ රටවල මාධ්‍යවේදින් මේ සඳහා සහභාගී කරවා ගන්නා ලදී.

### රැස්වීම්, දිරිගැන්වීම් චාරිකා,සමුළු හා සම්මන්ත්‍රණ ක්ෂේත්‍රය (MICE Tourism)

සංචාරක ව්‍යාපාරයේ විශේෂිත ක්ෂේත්‍රයක් වූ මෙම ක්ෂේත්‍රයෙහිද කැපී පෙනෙන දියුණුවක් පසුගිය වසර තුළ දැකගත හැකි විය. 2012 වසර සඳහා MICE සංචාරකයින්ගේ පැමිණීමේ අපේක්ෂිත ඉලක්කය සංචාරකයින් 90,000 ක් පමණ වූ අතර මෙම ඉලක්කය ඉක්මවා සංචාරකයින් 119,560 ක් පමණ මෙරටට පැමිණ ඇත.

2012 වසරේදී ශ්‍රී ලංකාවේ පැවති විශේෂ වැඩසටහන් වන Jaffna Trade Fair, පොදු රාජ්‍ය මණ්ඩල පාර්ලිමේන්තු රැස්වීම, ළමා වෛද්‍ය විශේෂඥයින්ගේ සමුළුව, Kiwani ජාත්‍යන්තර සමුළුව, ආසියානු තරුණ ක්‍රීඩා උළෙල, කොළඹ සංගීත සැණකෙළිය, චීන වෙළඳපල ප්‍රවර්ධනය සඳහා පැවති Zheng Ho Oration, Lupin Pharma සම්මේලනය ආදිය මගින් ඉහල මට්ටමේ සංචාරකයින් විශාල ප්‍රමාණයක් මෙරටට ගෙන්වා ගැනීමට සමත් විය.






Kiwani ජාත්‍යන්තර සමුළුව - කොළඹ



Lupin Pharma ජාත්‍යන්තර සමුළුව - කොළඹ

MICE සංචරණයේ පුහුණුව සඳහා සංචාරක ක්ෂේත්‍රයෙන් තෝරා ගත් 50 දෙනෙකුට පමණ අන්තර්ජාතික ප්‍රවීණයන් තිදෙනෙකුගේ මාර්ගෝපදේශකත්වය යටතේ පුහුණු සැසි පවත්වන ලදී.



MICE සංචරණයේ පුහුණුව 2012 - ක්ලබ් හොටෙල් ඩොල්ෆින්, වයික්කාල

මීට අමතරව MICE සංචරණයේ අනෙකුත් සංවර්ධන කාර්යයන් වනුයේ හම්බන්තොට නව සම්මන්ත්‍රණ ශාලාව සංවර්ධනය සඳහා උපදේශනාත්මක සහාය ලබා දීම, කොළඹින් පිටත රැස්වීම් පැවැත්වීම සඳහා මීගමුව හා වාද්දුව ප්‍රදේශයන්හි හෝටල් පහසුකම් ලබා දීම, Jetliner නෞකාව ප්‍රවර්ධනය, Courtyard (Old Dutch Hospital) ප්‍රවර්ධනය, ගාලු කෞතුකාගාරයේ චීන සංස්කෘතික කුටිය (Chinese Chamber) නිර්මාණය වැනි කාර්යයන්ය.

### 6.1.3 සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීම:Human Resources Development)

මෙරට සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය කරන මානව සම්පත පුහුණු කරන රාජ්‍ය ආයතනය වන්නේ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යි. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සමග මහනුවර, කොග්ගල, බණ්ඩාරවෙල, අනුරාධපුරය හා රත්නපුරය යන නගරවල පිහිටි ප්‍රාදේශිය පාසල් 05 ක් ද එයට අයත් වේ. මහනුවර ඉදි කෙරුණු නව පාසලේ කටයුතු 2013 වසරේදී ඇරඹීමට කටයුතු කෙරේ.

දේශීය විදේශීය ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ඉලක්ක කරගනිමින් වෘත්තීය මට්ටමේ ශිල්පීන් බිහිකිරීමද, දැනට හෝටල්වල සේවය කරන කාර්ය මණ්ඩලයට තව දුරටත් ක්ෂේත්‍රයේ අවශ්‍ය වන දැනුම සහ පුහුණුව ලබාදීමද මෙම හෝටල් පාසල් විසින් සිදු කරන ලදී, නව දනුම සහිත විෂය නිර්දේශ සැකසීම, ජාතික වෘත්තීය මට්ටමේ සුදුසුකම් ලබා ගැනීම සඳහා ප්‍රමිතිකරණය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විෂය පාඨමාලා වැඩි දියුණු කිරීම ආදී කටයුතු සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

#### 2012 වර්ෂයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වු ශිෂ්‍ය සංඛ්‍යාව

වගු අංකය 6:1:6

| | සුපවේදී (Professional Cookery) | ආහාරපාන සේවය (Food & Beverages) | හෝටල් ගෘහපාලනය (Hotel Housekeeping) | අමුත්තන් පිළිගැනීම (Front Office Management) |
|---|---|---|---|---|
| මුලික ශිල්පීය මට්ටම | 144 | 65 | 92 | - |
| සහතිකපත් පාඨමාලාව | 370 | 325 | 312 | 250 |
| අතරමැදි (Intermdiate) පාඨමාලාව (කොළඹ) | 24 | 19 | 09 | 21 |
| එකතුව | 538 | 409 | 413 | 271 |

මුලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

මීට අමතරව 2012 වර්ෂයේ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 53 දෙනෙකු සුදුසුකම් ලබන ලදී. ජාතික සංචාරක මාර්ගෝපදේශක පුහුණු වැඩසටහන සඳහා සිසුන් 205ක් ලියාපදිංචි වී ඇති අතර මින් 157 දෙනෙකු මේ සඳහා බලපත්‍ර ලබා ගෙන ඇත.





ආහාරපාන පිළියෙල කිරීම පිළිබඳව පාඨමාලා හදාරමින්

**එසේම පූර්වයෙන් සඳහන් කළ සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (TRIP) යටතේ** ඉදිකෙරුණු මහනුවර පල්ලෙකැලේ නව හෝටල් පාසලෙහි නව විෂයමාලා සකස් කිරීම හා උපදේශකවරු පුහුණු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය සඳහා ආයතන සංවර්ධන වැඩසටහන් විදේශීය විශේෂඥ සහාය ඇතිව 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි.

## 6.2 පොදු විනෝදාත්මක පහසුකම් සංවර්ධනය

දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා පොදු විනෝදාත්මක පහසුකම් සැපයීම අරමුණු කරමින් ජාතික සත්වෝද්‍යාන සහ ජාතික උද්භිද උද්‍යානයන්හි සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ 2012 වසරේදී ද වේගයෙන් පුළුල් කරන ලදී.

### 6.2.1 ජාතික සත්වෝද්‍යාන සංවර්ධනය

දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල නව සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය හා හම්බන්තොට සෆාරි උද්‍යානය යන සියල්ලම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධනය කරන ලද අතර ඒ සඳහා ජාතික අයවැයෙන් රු.මි. 600.0ක්ද, සත්වෝද්‍යාන සංවර්ධන අරමුදලින් රු.මි. 255.0ක්ද වෙන් කරන ලදී. 2012 දෙසැම්බර් 31 වන විට මෙම සංවර්ධන කාර්යයන් සඳහා වියදම රු.මි. 503.55 කි.

2012 දෙසැම්බර් 31 වන විට ජාතික සත්වෝද්‍යාන නැරඹීමට පැමිණි දේශීය සංචාරකයින් සංඛ්‍යාව 1,909,219 ක් විය. ඉන් ලැබූ ආදායම රු.මි. 146.12 කි. එමෙන්ම විදේශීය සංචාරකයින්ගේ පැමිණීම 287,485 ක් වූ අතර රු.මි. 626.78 ක ආදායමක් උත්පාදනය කර ගැනීමට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

සත්වෝද්‍යාන සංවර්ධන කටයුතු අතර පහත සඳහන් පොදු සංවර්ධන කාර්යයන් සියළුම සත්වෝද්‍යානයන්හි සිදුකෙරෙමින් පවතී.

- අභ්‍යන්තර මාර්ග සංවර්ධනය
- පර්යන්ත වැටවල් සහ භූමි අලංකරණ කටයුතු
- සනීපාරක්ෂ පහසුකම් සැකසීම හා අලුත්වැඩියාව
- කාර්යක්ෂම ජල සම්පාදන පද්ධතියක් ඇති කිරීම
- අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම
- අභ්‍යන්තර විදුලි සැපයීම්, සත්ව කුඩු සැකසීම
- නිල නිවාස ඉදිකිරීම

**දෙහිවල සත්වෝද්‍යානයේ සිදු කරන ලද සංවර්ධන කාර්යයන්**



රයිනෝසිරස් සඳහා මඩ පොකුණු සැකසීම



අභ්‍යන්තර මාර්ග සැකසීම



වානේ රාමු සහිත කුරුළු කුඩු සැකසීම

## පින්නවල සත්වෝද්‍යානයේ සිදු කරන ලද සංවර්ධන කාර්යයන්



දිවියන් සිටින කලාපය සඳහා සකස් කරන ලද අගල



දිවියන් නැරඹීම සඳහා නැරඹුම් මැදිරිය



ඉදිකරමින් පවතින සිහිවටන වෙළඳ සැල්

## හම්බන්තොට සෆාරි උද්‍යානයේ සිදු කරන ලද සංවර්ධන කාර්යයන්



ඉදිකරමින් පවතින සත්ත්ව රෝහල



සත්ත්ව රෝහලෙහි අභ්‍යන්තර පෙනුම



පිටත මායිම් තාප්පය සෑදීම - 2 වන අදියර

### 6.2.2 ජාතික උද්භිද උද්‍යානයන්හි පොදු පහසුකම් සංවර්ධනය


දැනට ස්ථාපිත උද්භිද උද්‍යාන අතර පේරාදෙණිය රාජකීය උද්‍යානය, හක්ගල උද්‍යානය, ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානය මෙන්ම ගනේවත්ත ඖෂධ උද්‍යානය සංචාරක ආර්ථිකය කෙරෙහි සෘජුවම දායකත්වය සපයන අතර 2013 වසරේදී විවෘත කිරීමට නියමිත මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය හා අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය ද සැලකිය යුතු වෙනසක් සංචාරක ක්ෂේත්‍රයට සිදු කරනු ඇත.

**නරඹන්නන්ගේ පැමිණීම**

2012 දෙසැම්බර් 31 දක්වා දේශීය සංචාරකයන් 1,931,914 ක් ද විදේශීය සංචාරකයින් 259,572 ක් ද ජාතික උද්භිද උද්‍යාන නරඹා ඇත. උද්‍යාන ඇතුල්වීමේ ගාස්තු, පැළ අළෙවිය ආදියෙන් ලැබුණු සම්පූර්ණ ආදායම 2012 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 382.79 කි.

**ප්‍රධාන උද්භිද උද්‍යානයන වලට පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව 2011 හා 2012 වර්ෂයන් තුලදී**

රූප සටහන් අංක 6.2.1




මූලාශ්‍රය - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

**උද්භිද උද්‍යානයන වලින් ලද ආදායම ( 2012 වර්ෂය තුලදී )**

වගු අංකය 6:2:1

| උද්භිද උද්‍යානයන | මුළු ආදායම (රු.මි) |
|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය | 326.22 |
| උද්භිද උද්‍යානය, හක්ගල | 40.11 |
| උද්භිද උද්‍යානය, ගම්පහ | 14.72 |
| ඖෂධ පැළෑටි උද්‍යානය, ගනේවත්ත | 0.58 |
| සුවහස් මල් පැළ තවාන, කොළඹ | 0.06 |
| තෙත් කළාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 0.81 |
| වියළි කළාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 0.29 |
| **මුළු එකතුව** | **382.79** |

මූලාශ්‍රය - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් භූමි අලංකරණ කටයුතු හා මාර්ගවල ගුණාත්මය වැඩි දියුණු කිරීම
- ආබාධිත පුද්ගලයින් සඳහා පිවිසීමේ හැකියාව සහිතව නව ප්‍රවේශපත්‍ර කවුළුවක් හා සැමරුම් හලක් ඉදිකිරීම.
- උද්‍යානයේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදි කිරීම
- පැරණි වැසිකිළි, ගිම්හාන කුටි සහ අනෙකුත් ව්‍යුහයන් පුනරුත්ථාපනය හා අළුත්වැඩියාව
- දැල් ගෘහ ඉදි කිරීම
- ජල සම්පාදන පද්ධතිය ඉදිකිරීම



නව ප්‍රවේශපත්‍ර කවුළුව ඉදි කිරීම



ගිම්හාන කුටි නවීකරණය කිරීම



මල් ආරුක්කු නවීකරණය කිරීම

### හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු

- ප්‍රධාන පිවිසුම් මාර්ගය කාපට් කිරීම සහ අභ්‍යන්තර මාර්ග කොන්ක්‍රීට් කිරීම. අඩි පාරවල් වැඩි දියුණු කිරීම තුළින් මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම
- තවාන් පැළ මනාව කළමණාකරනය කිරීම සඳහා කලින් පැවති ආරක්ෂිත ගෘහ නවීකරණය කිරීම හා විසිරි ජල සම්පාදන පද්ධතිය හා දියර පොහොර යෙදීමේ පද්ධතියක් ඉදිකිරීම
- වන සතුන්ගෙන් වන හානි වැලැක්වීමට උද්‍යානයේ පර්යන්ත වැට නවීකරණය කිරීම, ගිම්හාන කුටි ඉදිකිරීම, උද්‍යානයේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදි කිරීම, ප්‍රවේශපත්‍ර කවුළුව , පොකුණු, වැසිකිළි ඇතුළු අනෙකුත් උද්‍යාන ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය
- කොම්පෝස්ට් පද්ධතියක් පිළියෙල කිරීම



වැඩි දියුණු කරන ලද අඩි පාරක්



සංවර්ධනය කරන ලද පාෂාණ උද්‍යානය



ආරක්ෂිත ගෘහ නවීකරණය

## ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය කාපට් කිරීම
- උද්‍යානයේ ක්‍රීඩා පෙදෙස සඳහා ක්‍රීඩා උපකරණ සවි කිරීම
- නිල නිවාසවල ජලාපවහන පද්ධතිය නවීකරණය කිරීම
- නව රථ ගාලක් ඉදි කිරීම
- බෝක්කු හා පොම්පාගාරය නවීකරණය කිරීම



අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම



පැළ ගෘහය ඉදි කිරීම

## ගනේවත්ත ඖෂධ උද්‍යානයේ සංවර්ධන කටයුතු

- මනා බාහිර පෙනුමක් සඳහා උද්‍යානය භූමි සංවර්ධන කටයුතු, මාර්ග සංවර්ධන කටයුතු හා උද්‍යානයට පහසුවෙන් පිවිසිය හැකි පරිදි ප්‍රධාන පිවිසුම් මාර්ගය සහ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම
- වටිනා ශාක වර්ග ආරක්ෂා කර ගැනීම සඳහා පර්යන්ත වැට සැකසීමේ 3 වන අදියරේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීම
- පැළ ගෘහ ඉදි කිරීමේ 2 වන අදියරේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීම
- නව ශාක වර්ග 458 ක් උද්‍යානය සඳහා එකතු කිරීම
- ඉඟුරු, අරත්ත වැනි ඖෂධ ශාක වාණිජ නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කිරීම



අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම



නවීකරණය කරන ලද තුරු නිවස

### මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු

- උද්‍යානයේ ප්‍රධාන පිවිසුම, රථගාල සහ සනීපාරක්ෂක පහසුකම් සහිත ගිම්හාන කුටි 03 ක් ඉදි කිරීම
- පානීය ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීම
- නිල නිවාස ඉදිකිරීම
- අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම
- අලංකාර ශාක සහිත මල් උයන් සැකසීම
- අඩි පාරවල්, මාවත්, පඳුරු හා පතොක් උද්‍යානයන් ඇති කිරීම



වැඩි දියුණු කරන ලද අභ්‍යන්තර මාර්ග පද්ධතියක්



ප්‍රධාන පිවිසුම ඉදි කිරීමේ කටයුතු



ගිම්හාන කුටි ඉදි කිරීමේ කටයුතු

**නව නෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු - අවිස්සාවේල්ල**

- උද්‍යානයේ ප්‍රධාන පිවිසුම ඉදි කිරීම
- අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉන්ටලොක් (Interlock) අතුරා වැඩි දියුණු කිරීම
- නව උද්‍යාන භූමි ලක්ෂණ එක් කරමින් භූමි අලංකරණ කටයුතු සිදු කිරීම සහ ශාක එකතුව පුළුල් කිරීම
- සනීපාරක්ෂක පද්ධති 02 ක් ඉදි කිරීම
- පොකුණු 03 ක් ඉදි කිරීම හා පවතින වැව පුළුල් කිරීම හා ඒ වටා රැඳවුම් බැම් හා හතරැස් බෝක්කු ඉදි කිරීම
- රෝස උයන ඉදි කිරීම



සනීපාරක්ෂක පද්ධති ඉදි කිරීමේ කටයුතු



ප්‍රවේශ පත්‍ර කවුළුව ඉදි කිරීමේ කටයුතු

## 6.3 ආයෝජන ප්‍රවර්ධනය

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද තවත් වැදගත් අංශයක් වන්නේ ආයෝජන ප්‍රවර්ධන කටයුතුයි. විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකාව වෙත ආකර්ශනය කර ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, විශේෂ බදු ප්‍රතිපත්ති හඳුන්වාදීම සහ වෙනත් සහන ලබාදීම අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් සිදුකරනු ලබයි.

### වසර 2012 දී ක්‍රියාත්මක වූ වැඩසටහන් සහ ව්‍යාපෘතිවල කාර්යසාධනය

වගු අංකය 6:3:1

| වසර 2012 දී ඇරඹූ ආයෝජන ව්‍යාපෘති | | | |
|---|---|---|---|
| දර්ශකය | ව්‍යාපෘති සංඛ්‍යාව | අපේක්ෂිත ආයෝජනය (රු: මි:) | අපේක්ෂිත සේවා නියුක්තිය |
| **අනුමත කිරීම්** | 230 | 693,927 | 53,239 |
| **ගිවිසුම් අත්සන් කිරීම්** | 162 | 405,135 | 37,382 |


මූලාශ්‍රය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ව්‍යාපෘති 230 ක් අනුමත කරන ලද අතර ව්‍යවසායකයින් 162 ක් සමඟ ගිවිසුම් අත්සන් කර ඇත. අනුමත ව්‍යාපෘතිවලට අදාළ ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ආයෝජනය 2011 වසරේ එම කාලය හා සසඳන විට පිළිවෙලින් 63% ක සහ 9%ක ප්‍රගතියක් වාර්තා කරයි.

එමෙන්ම, එම කාලය ඇතුළත ව්‍යාපෘති 63 ක වානිජ මෙහෙයුම් ආරම්භ කිරීමට හැකි විය.

### විදේශ සෘජු ආයෝජන ලැබීම්
### ජනවාරි සිට දෙසැම්බර් 2012

රූප සටහන් අංක 6.3.1





මූලාශ්‍රය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය ඇතුළත ලැබුණු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ඇ: ඩො: මි: 1338 කි. මෙය පසුගිය වසරට වඩා 26% ක වර්ධනයක් පෙන්වයි. මේ ප්‍රගතිය සඳහා ''නිෂ්පාදන'' ක්ෂේත්‍රය 23% ක දායකත්වයක්ද ''දුරකතන හා සන්නිවේදන'' ක්ෂේත්‍රය 18% ක දායකත්වයක්ද ''වරාය සංවර්ධන'' ක්ෂේත්‍රය 15% ක දායකත්වයක්ද ලබා දී ඇත.

## විදේශ සෘජු ආයෝජන ලැබීම - (ජනවාරි - දෙසැම්බර්) 2012
## අයෝජනය කළ රටවල් අනුව සංයුතිය

රූප සටහන් අංක 6.3.2




මූලාශ්‍රය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

විදේශ සෘජු ආයෝජන ගලා ආ ආකාරය සැලකීමේදී, ඉදිරියෙන් සිටින්නේ මුළු ආයෝජන ප්‍රමාණයෙන් 19% ක දායකත්වයක් දක්වන හොංකොං රාජ්‍යයයි. මීළගට සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ චීනය යන රටවල් පිළිවෙලින් 16% ක් හා 14% ක් වශයෙන් දායක වී ඇත.

ජාත්‍යන්තර වශයෙන් කීර්තිනාමයක් දරන අන්තර්ජාතික හෝටල් දාමයන් ප්‍රවේශයත් සමග සංචාරක ක්ෂේත්‍රය වෙත විදේශ සෘජු ආයෝජන ලැබීම්වල සුවිශේෂ වර්ධනයක් පෙන්නුම් කෙරේ. මෙම සුපිරි ගණයේ සංචාරක ව්‍යාපෘති මගින් ඇ. ඩො. බිලියනයක පමණ ආයෝජන ලැබෙතැයි ගණන් බලා ඇත.


ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහයෝගිතාවය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සැපයෙන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග දැනටමත් ගිවිසුම්ගත සංචාරක ව්‍යාපෘති මගින් දේශීය ව්‍යවසායකයින්ට ආයෝජන අවස්ථා ලැබීම් ඉහළ ගොස් ඇත.

2012 වසර තුළ ඇ: ඩො: මිලියන 1019 ක ඇස්තමේන්තු කළ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් සහිත සංචාරක ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දී තිබේ.

ආයෝජකයින්ගේ වර්ධනය වන විශ්වාසය විදහා දක්වමින් 2012 වසර තුළ ඇ: ඩො: මිලියන 443 ක ඇස්තමේන්තු කළ ආයෝජන ප්‍රමාණයක් සහිත ව්‍යවසායයන් 30 ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර තිබේ. වසර 2011 මෙම කාල සීමාවේදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසම් අත්සන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව 18 ක් වන අතර, එමගින් අපේක්ෂිතවූ ආයෝජන ප්‍රමාණය ඇ: ඩො: මිලියන 689 කි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් ව්‍යාපෘති වල අපනයන ආදායම 2012

රූප සටහන් අංක 6.3.3




මූලාශ්‍රය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් ව්‍යාපෘති වලින් ඉපයූ අපනයන ආදායම ඇ: ඩො: මිලියන 6125 කි.

මෙම කාලය තුළ ''රෙදිපිළි සහ ඇඟළුම්, ක්ෂේත්‍රයේ ව්‍යවසායයන් ඉපයූ අපනයන ආදායමේ ප්‍රතිශතය මුළු අපනයන ප්‍රමාණයෙන් 58% කි. එමෙන්ම, රසායන ද්‍රව්‍ය, ඛණිජ ද්‍රව්‍ය, ගල් අඟුරු සහ ආහාර සැකසීම යන ක්ෂේත්‍ර වලින් ඉපයූ අපනයන ආදායමේ ප්‍රතිශතය මුළු අපනයන ප්‍රමාණයෙන් පිළිවෙලින් 16%ක් සහ 5%ක් වේ.

### ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දායකත්වය - (2012)


ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් ව්‍යවසායයන් විසින් ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකසා ඇති ආසන්නතම සංඛ්‍යාලේඛන වලට අනුව, 2012 වසර තුළ දේශීය මුළු අපනයන ආදායම ඇ: ඩො: මිලියන 9,773 කි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් ව්‍යවසායයන් විසින් එම කාලය තුළ සිදුකළ අපනයනවල ආදායම ඇ: ඩො: මිලියන 6,125 ක් වන අතර, එය දේශීය මුළු අපනයන ආදායමෙන් 63% කි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හරහා 2012 වසර තුළ කාර්මික අපනයනය වෙනුවෙන් වූ දායකත්වය 79% ක් වන අතර කාර්මික අපනයනය වෙනුවෙන් විශාලම දායකත්වය ලැබුණේ ''රෙදිපිළි සහ ඇඟළුම්, ක්ෂේත්‍රයෙනි.

ඉහත කාල පරිච්ඡේදය තුළ ''රෙදිපිළි සහ ඇඟළුම්'' සහ ''නිෂ්පාදිත'' යන ක්ෂේත්‍රයන් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හරහා වූ අපනයන ඉපයීම්වල දායකත්වය පිළිවෙලින් 90%ක් සහ 63%ක් වේ.

රූප සටහන් අංක 6.3.4




මූලාශ්‍රය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### වසර 2011-2015 කාල පරාසය වන පස් වසර සඳහා ඉලක්කගත ආයෝජනය සපුරා ගැනීම වෙනුවෙන් හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග

- පවතින දිරිදීමනා කට්ටලය ලිහිල් කර කාලෝචිත සහ සුදුසු දිරිදීමනා කට්ටලයක් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පදනම් කරමින් අළුතින් නිර්මාණය කිරිම.
- ආයෝජකයින්ට වඩාත් හොඳ සේවයක් සැළසීම සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර කේන්ද්‍රගත කරමින් නව ක්‍රියා පිළිවෙලක් සකස්කර ස්ථාපනය කිරිම.
- අපනයන සැකසුම් කලාප/කර්මාන්ත උද්‍යාන අළුතින් ඉදිකිරීම සහ නවීකරණය කිරීම.

### අපනයන සැකසුම් කලාප

දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පාලනය වන ආයෝජන ප්‍රවර්ධන අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යාන ,

| | |
|---|---|
| 1. මාවතගම | 6. හොරණ |
| 2. පොල්ගහවෙල | 7. කොග්ගල |
| 3. මීරිගම | 8. මහනුවර |
| 4. කටුනායක | 9. මල්වත්ත |
| 5. බියගම | 10. වතුපිටිවල |

කාර්මික උද්‍යාන

| | |
|---|---|
| 1. සීතාවක | 2. මිරිජ්ජවිල |

## නව ආයෝජන කලාප හා අපේක්ෂිත ආයෝජනය

1. සාම්පූර් - බැර කර්මාන්ත ආශ්‍රිත කාර්මික පුරවරය - ආයෝජනය ඇ.ඩො.මි. 4000 කි.
2. සංචාරක ක්‍රියාකාරකම් ආශ්‍රිත කලාපය - මුලතිව්
3. මිරිජ්ජවිල - ආයෝජනය ඇ.ඩො.මි. 300 කි.
4. සූරියවැව ආයෝජන ප්‍රවර්ධන කලාපය
5. වැලිකන්ද - කෘෂිකාර්මික කලාපය - ආයෝජනය - ඇ.ඩො.මි. 140 කි.

# 7

# ගිණුම්, මූල්‍ය අභ්‍යන්තර විගණන හා මානව සම්පත්

## 7. මූල්‍ය කාර්යසාධනය 2012 වසර සඳහා

### 7.1 අනුමත ප්‍රතිපාදන සහ ප්‍රගතිය

2012 වසර සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයීය ශීර්ෂ 105 යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදන පහත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා යොදවා ඇත.

වගු අංක 7.1.1

| | වැඩසටහන | ව්‍යාපෘතිය | | ප්‍රතිපාදන (රු) | |
|---|---|---|---|---|---|
| අංකය | නම | | ක්‍රියාකාරකම | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 1 | අමාත්‍ය කාර්යාලය | 58,335,000 | 17,607,000 |
| | | 2 | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය | 398,442,000 | 338,466,000 |
| | | 3 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය | 669,100,000 | 19,450,000 |
| | **වැඩසටහන 01 එකතුව** | | | **1,125,877,000** | **375,523,000** |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 1 | ග්‍රාමීය සංවර්ධනය - ගෘහ ආර්ථිකය | 8,780,500,000 | 3,915,000,000 |
| | | 2 | ග්‍රාමීය සංවර්ධනය - ගම්මාන සවිබලගැන්වීම | _ | 34,488,995,824 |
| | | 3 | නැගී එන කලාප සංවර්ධනය | _ | 26,212,844,176 |
| | | 4 | අන්තර් ප්‍රාදේශිය සංවර්ධනය | _ | 18,214,000,000 |
| | | 5 | ආයෝජන ප්‍රවර්ධනය | _ | 1,799,000,000 |
| | **වැඩසටහන 02 එකතුව** | | | **8,780,500,000** | **84,629,840,000** |
| | **මුළු එකතුව** | | | **9,906,377,000** | **85,005,363,000** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් හා සංවර්ධන වැඩසටහන් වල වසර තුල දරන ලද වියදම්, පුනරාවර්තන වියදම්, පුද්ගල පඩිනඩි හා අනෙකුත් වියදම් යටතේද මූලධන වියදම් ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම හා මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේද වර්ගීකරණය කර වගු අංක 7.1.2න් දැක්වේ.

ශීර්ෂ 105 වැඩසටහන් 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති 01 අමාත්‍ය කාර්යාලය

වගු අංක 7.1.2

| **වියදමේ ස්වභාවය** | **අනුමත ප්‍රතිපාදන රු.** | **වියදම රු.** | **ඉතිරිය රු.** | **වියදම් ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | 19,300,000 | 18,438,650 | 861,350 | 96 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 39,035,000 | 35,852,340 | 3,182,660 | 92 |
| **මුළු පුනරාවර්තන වියදම** | **58,335,000** | **54,290,990** | **4,044,010** | **93** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| **මූලධන වත්කම්වල ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 300,000 | - | 300,000 | - |
| යන්ත්‍රෝපකරණ | 300,000 | 255,353 | 44,647 | 85 |
| වාහන මූලධන වත්කම් අත්පත් කරගැනීම | 2,600,000 | 2,560,404 | 39,596 | 98 |
| **වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| වාහන | 4,030,000 | 4,021,660 | 8,340 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 393,000 | 392,445 | 555 | 100 |
| යන්ත්‍රෝපකරණ | 9,984,000 | 9,982,525 | 1,475 | 100 |
| **මුළු ප්‍රාග්ධන වියදම** | **17,607,000** | **17,212,387** | **394,613** | **98** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පුද්ගල පඩිනඩි සඳහා වෙන්කරන ලද පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදන වලින් සියයට 96 ක් සහ වෙනත් වියදම් සඳහා වෙන් කරන ලද පුනරාවර්තන වියදම් වලින් සියයට 92 ක් වර්ෂය තුල වැය කර ඇත. වැඩසටහන් අංක 1 යටතේ අනුමත මූලධන ප්‍රතිපාදන වලින් සියයට 98 ක් වසර තුළදී භාවිතා කර ඇත.

වැඩසටහන් අංක 1,2 යටතේ ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක විය. අනුමත ඇස්තමේන්තුව, වියදම, ඉතිරිය වියදම් ප්‍රතිශතය, පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් පහත සඳහන් වගු වලින් දැක්වේ.

ශිර්ෂ 105 වැඩසටහන් 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති 01 අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය

වගු අංක 7.1.3

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | 175,300,000 | 174,642,573 | 657,427 | 100 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 223,142,000 | 207,709,564 | 15,432,436 | 93 |
| **මුළු පුනරාවර්තන වියදම** | **398,442,000** | **382,352,137** | **16,089,863** | **96** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 148,000,000 | 38,691,278 | 109,308,722 | 26 |
| යන්ත්‍රෝපකරණ | 1,000,000 | 23,050 | 976,950 | 2 |
| වාහන | 5,300,300 | 3,061,026 | 2,238,974 | 58 |
| වාහන | 170,092,000 | 170,091,733 | 267 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 7,922,000 | 7,921,577 | 433 | 100 |
| යන්ත්‍රෝපකරණ | 4,152,000 | 4,151,179 | 821 | 100 |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 2,000,000 | 1,190,727 | 809,273 | 60 |
| **මුළු ප්‍රාග්ධන වියදම** | **338,466,000** | **225,130,570** | **113,335,440** | **67** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පුද්ගල පඩිනඩි සඳහා වෙන්කරන ලද අනුමත ප්‍රතිපාදන වලින් සියයට 100 ක් සහ වෙනත් වියදම් සඳහා වෙන් කරන ලද පුනරාවර්තන වියදම් වලින් සියයට 93 ක් භාවිතා කර ඇත. වැඩසටහන් අංක 2 යටතේ අනුමත මුලධන ප්‍රතිපාදන වලින් සියයට 67 ක් මෙම වසර තුළදි භාවිතා කර ඇත

වැඩසටහන් අංක 01 හි ව්‍යාපෘති 4 යටතේ ඇති දිස්ත්‍රික්ක 25හි දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාල වල ප්‍රදේශිය පරිපාලන වැඩසටහන් ක්‍රියාත්මක වු අතර අනුමත ප්‍රතිපාදන, වියදම්, ඉතිරිය හා වියදම් ප්‍රතිශතය වගු අංක 7.1.4 න් දැක්වේ

ශිර්ෂ 105 වැඩසටහන් අංක 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංක 02-03 ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය

වගු අංක 7.1.4

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදන රු. | වියදම රු. | ඉතිරිය රු. | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පුද්ගල පඩිනඩි | 622,050,000 | 601,093,057 | 20,956,943 | 96.63 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 47,050,000 | 35,402,171 | 11,647,829 | 75.24 |
| **පුනරාවර්තන වියදම එකතුව** | **669,100,000** | **636,495,228** | **32,604,772** | **95.13** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4,800,000 | 3,796,756 | 1,003,244 | 79.10 |
| යන්ත්‍රෝපකරණ | 500,000 | - | 500,000 | - |
| වාහන | 2,200,000 | 1,097,087 | 1,102,913 | 49.87 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 5,000,000 | 4,691,999 | 308,001 | 93.84 |
| යන්ත්‍රෝපකරණ | 5,450,000 | 5,040,190 | 409,810 | 92.48 |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 1,500,000 | 584,283 | 915,717 | 38.95 |
| **ප්‍රාග්ධන වියදම් එකතුව** | **19,450,000** | **15,210,315** | **4,239,685** | **78.20** |

මුලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

## ග්‍රාමීය සංවර්ධනය - ගෘහස්ථ ආර්ථිකය

**ව්‍යාපෘති 1**

වගු අංක 7.1.5

| වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | | | | |
| රාජ්‍ය ආයතන | 8,644,000,000 | 8,643,880,000 | 120,000 | 100 |
| | | - | - | |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | | - | - | |
| රාජ්‍ය ආයතන | 112,500,000 | 108,955,000 | 3,545,000 | 97 |
| උඩරට සංවර්ධන අධිකාරිය | | - | - | |
| රාජ්‍ය ආයතන | 24,000,000 | 20,640,000 | 3,360,000 | 86 |
| **මුළු පුනරාවර්තන වියදම** | **8,780,500,000** | **8,773,475,000** | **7,025,000** | 100 |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | - | - | |
| දිවි නැගුම වැඩසටහන | | - | - | |
| ඉඩම් හා ඉඩම් සංවර්ධනය | 3,515,000,000 | 2,903,002,138 | 611,997,862 | 83 |
| | | - | - | |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | | - | - | |
| රාජ්‍ය ආයතන | 260,000,000 | 32,127,468 | 227,872,532 | 12 |
| | | - | - | |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | | - | - | |
| රාජ්‍ය ආයතන | 50,000,000 | 44,972,000 | 5,028,000 | 90 |
| උඩරට සංවර්ධන අධිකාරිය | | | - | |
| රාජ්‍ය ආයතන | 50,000,000 | - | 50,000,000 | 0 |
| රණවිරු දිවි නැගුම වැඩසටහන | 40,000,000 | 10,000,000 | 30,000,000 | 25 |
| **මුළු ප්‍රාග්ධන මුදල** | **3,915,000,000** | **2,990,101,606** | **924,898,394** | **76** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකරකම්

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය - ග්‍රාමීය ජනතාව සවිබලගැන්වීම

**ව්‍යාපෘති 2**

වගු අංක 7.1.6

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | සංකේත මූල්‍යකරණ අංකය | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 2 | | | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| | 1 | 2105 | 11 | ගම නැගුම වැඩසටහන | 13,478,000,000 | 12,955,247,074 | 522,752,926 | 96 |
| | 2 | 2104 | 11 | සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය | 800,000,000 | 584,558,668 | 215,441,332 | 73 |
| | 3 | 2103 | 11 | ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් ප්‍රවර්ධනය කිරීම සඳහා දායකවීම | 400,000,000 | 255,609,907 | 144,390,093 | 64 |
| | 4 | 2502 | 11 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1,125,000,000 | 1,015,686,369 | 109,313,631 | 90 |
| | 6 | 2105 | | යටිතල පහසුකම් සඳහා ජීවනෝපාය ව්‍යාපෘතිය සංවර්ධනය | | - | - | |
| | | | 12 | | 3,000,000,000 | 2,896,964,706 | 103,035,294 | 97 |
| | | | 14 | | 1,100,000,000 | 1,009,654,279 | 90,345,721 | 92 |
| | | | 17 | | 200,000,000 | 179,968,941 | 20,031,059 | 90 |
| | 7 | 2105 | 12 | ප්‍රජා සවිගැන්වීමේ බලගැන්වීමේ ව්‍යාපෘතිය | 313,000,000 | 312,705,028 | 294,972 | 100 |
| | | | 14 | | - | - | - | 0 |
| | | | 17 | | 65,489,824 | 61,990,406 | 3,499,418 | 95 |
| | 8 | 2502 | | ප්‍රජා සංවර්ධනය හා ජීවන මාර්ග නැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ( දෙවන) | | - | - | 0 |
| | | | 12 | | 1,745,360,000 | 1,658,471,462 | 86,888,538 | 95 |
| | | | 17 | | 460,000,000 | 390,000,000 | 70,000,000 | 85 |
| | 9 | 2502 | | ලෝක ආහාර වැඩසටහන | | - | - | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 16 | | 1,550,000,000 | 1,525,924,781 | 24,075,219 | 98 |
| | | | 17 | | 1,040,000,000 | 921,486,944 | 118,513,056 | 89 |
| | 10 | 2104 | | උතුරු නැගෙනහිර නිවාස ව්‍යාපෘතිය | | - | - | |
| | | | 12 | | - | - | - | 0 |
| | | | 17 | | 17,500,000 | 15,983,174 | 1,516,826 | 91 |
| | 11 | 2502 | 13 | නිවාස ඉදිකිරීම | 1,650,000,000 | 1,645,098,726 | 4,901,274 | 100 |
| | 12 | 2502 | | ග්‍රාමීය පාලම් | | | | |
| | | | 12 | | 1,500,000,000 | - | 1,500,000,000 | 0 |
| | | | 17 | | 864,000,000 | - | 864,000,000 | 0 |
| | 13 | 2502 | 11 | පුරනැගුම | 25,000,000 | 750,000 | 24,250,000 | 3 |
| | 14 | 2502 | | උතුරු නැගෙනහිර පලාත් පාලන අයතතන හා සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 1,714,450,000 | 713,957,383 | 1,000,492,617 | 42 |
| | | | 17 | | 880,000,000 | 637,579,988 | 242,420,012 | 72 |
| | 15 | 2104 | 11 | හානිවු යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය | 297,000,000 | 296,099,030 | 900,970 | 100 |
| | 16 | 2502 | | සමෘද්ධි ආරක්ෂක ජාලය වැඩි දියුණු කිරීම , අධීක්ෂණය හා ඇගයීම | | | | |
| | | | 13 | | 50,000,000 | 35,626,050 | 14,373,950 | 71 |
| | | | 17 | | 2,500,000 | 984,488 | 1,515,512 | 39 |
| | 18 | 2502 | 11 | ප්‍රාථමික හා ද්විතීයික පාසල් වැඩි දියුණු කිරීම | 804,000,000 | 803,004,913 | 995,087 | 100 |
| | 21 | 2502 | 17 | සංවර්ධනය ඉලක්ක කරගත් හදිසි අවස්ථා සහ සංක්‍රාන්ති ආධාරය | 11,940,000 | - | 11,940,000 | 0 |
| | | | 13 | | 230,000,000 | 229,510,000 | 490,000 | 100 |
| | 22 | 2502 | 17 | කාර්යසාධනය නැංවීමේ ව්‍යාපෘතිය ( GIZ PIP) | 756,000 | - | 756,000 | 0 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2502 | 13 | | 316,000,000 | 316,000,000 | - | 100 |
| | 28 | 2502 | 13 | යුද්ධය පැවතුනාවු ප්‍රදේශවල නැවත පදිංචි කළ හා නැවත ගොඩනැගීම සඳහාවු හැකියාවන් වැඩි කිරීම සඳහාවු නිපුණතා සංවර්ධන වැඩසටහන | 22,000,000 | 21,820,000 | 180,000 | 99 |
| | 29 | 2502 | 13 | උතුරු හා නැගෙනහිර පලාත් නැවත ඒකාබද්ධ කිරීම හා ස්ථාවර කිරීම | 478,000,000 | 477,969,707 | 30,293 | 100 |
| | 30 | 2502 | 13 | ස්වෙච්ඡා සේවකයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන ආර්ථික වර්ධනය සඳහා වු ගිවිසුම | 349,000,000 | 348,654,084 | 345,916 | 100 |
| | | | | **එකතුව ( 105-02-02- 2502)** | **34,488,995,824** | **29,311,306,107** | **5,177,689,717** | **85** |

මුලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

### නැගී එන ප්‍රදේශ සංවර්ධනය

**ව්‍යාපෘති 3**

වගු අංක 7.1.7

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 3 | | | | | | | |
| | 1 | 2502 | 11 | උතුරු වසන්තය | 532,000,000 | 302,899,830 | 229,100,170 | 57 |
| | 2 | 2502 | | ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ හදිසි ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 4,585,050,000 | 4,376,781,861 | 208,268,139 | 95 |
| | | | 13 | | 153,000,000 | 152,547,628 | 452,372 | 100 |
| | | | 17 | | 595,000,000 | 561,975,824 | 33,024,176 | 94 |
| | 3 | 2502 | | උතුරු හදිසි ප්‍රතිපාදන ව්‍යාපෘතිය | | - | - | |
| | | | 12 | | 2,556,000,000 | 2,399,603,891 | 156,396,109 | 94 |
| | | | 13 | | 5,350,000 | 5,347,377 | 2,623 | 100 |
| | | | 17 | | 5,000,000 | 3,034,682 | 1,965,318 | 61 |
| | 4 | 2502 | | උතුරු පලාත් අභ්‍යන්තර අවතැන් වුවන් හා පදිංචි කළ ජන කොට්ඨාශ වල ජීවනෝපය නැවත ස්ථාපිත කිරීම සඳහා වන හදිසි සහන ව්‍යාපෘතිය | | | | |
| | | | 13 | | 149,500,000 | 134,033,783 | 15,466,217 | 90 |
| | | | 17 | | 5,000,000 | - | 5,000,000 | 0 |
| | 5 | 2502 | | ජාතික බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන | | - | - | |
| | | | 13 | | 5,000,000 | 1,956,039 | 3,043,961 | 39 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 17 | | 2,000,000 | - | 2,000,000 | 0 |
| **6** | 2105 | | ජාතික බිම් බොම්බ ඉවත් කිරීමේ වැඩසටහන | | - | - | |
| | | 13 | | 8,000,000 | 2,219,969 | 5,780,031 | 28 |
| | | 17 | | 2,000,000 | - | 2,000,000 | 0 |
| **7** | 2502 | 13 | සංක්‍රාන්ති වැඩසටහන | 1,165,000,000 | 1,164,311,334 | 688,666 | 100 |
| 11 | 2502 | 11 | නැගෙනහිර නවෝදය | 472,000,000 | 171,094,985 | 300,905,015 | 36 |
| 14 | 2502 | | උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිසාධන හා සංවර්ධන ව්‍යාපෘතිය | | | | |
| | | 12 | | 470,130,000 | 470,103,610 | 26,390 | 100 |
| | | 14 | | 546,000,000 | 545,659,503 | 340,497 | 100 |
| | | 17 | | 176,000,000 | 170,649,465 | 5,350,535 | 97 |
| 16 | 2502 | 17 | මන්නාරම් වැඩි දියුණු කිරීම - ව්‍යාපෘතිය | 1,814,176 | - | 1,814,176 | 0 |
| 17 | 2502 | 11 | සබරගමුව අරුණාලෝකය | 2,048,000,000 | 1,841,068,646 | 206,931,354 | 90 |
| 18 | 2502 | 11 | රජරට නවෝදය | 2,110,000,000 | 1,986,657,983 | 123,342,017 | 94 |
| 19 | 2502 | 11 | කදුරට උදානය | 1,567,000,000 | 969,725,516 | 597,274,484 | 62 |
| 20 | 2502 | 11 | වයඹ පුබුදුව | 1,693,000,000 | 1,643,669,645 | 49,330,355 | 97 |
| 21 | 2502 | 11 | පුබුදමු වෙල්ලස්ස | 2,100,000,000 | 1,984,508,681 | 115,491,319 | 95 |
| 22 | 2502 | 11 | බටහිර රන් අරුණ | 2,952,000,000 | 2,831,084,183 | 120,915,817 | 96 |
| 24 | 2502 | 11 | රුහුණු උදානය | 2,309,000,000 | 2,007,913,230 | 301,086,770 | 87 |
| | | | **එකතුව (105-02-03-2502)** | **26,212,844,176** | **23,726,847,670** | **2,485,996,506** | **91** |

මුලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

## අන්තර් කලාප සංවර්ධනය

**ව්‍යාපෘති 4** වගු අංක 7.1.8

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 4 | | | | | - | - | |
| | 1 | 2103 | 11 | ප්‍රාදේශීය තුලනාත්මක සංවර්ධන මූලාරම්භයන් | 14,996,667,395 | 12,657,972,221 | 2,338,695,174 | 84.4 |
| | 2 | 2103 | 11 | සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා උපකරණ | 2,303,332,605 | 2,303,332,605 | - | 100 |
| | 3 | 2103 | 11 | අත්හැර දමන ලද වැඩ නිම නොකළ පොදු දේපළ ප්‍රතිසංවර්ධනය | 500,000,000 | 348,758,858 | 151,241,142 | 69.8 |
| | 4 | 2502 | 11 | අන්තර් ප්‍රාදේශීය පොදු පහසුකම් | 414,000,000 | 156,831,377 | 257,168,623 | 37.88 |
| | | | | **එකතුව** | **18,214,000,000** | **15,466,895,060** | **2,747,104,939** | **85** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ශීර්ෂ 105 වැඩසටහන් 02 සංවර්ධන ක්‍රියාකාරකම්

## ආයෝජන ප්‍රවර්ධනය

**ව්‍යාපෘති 5** වගු අංක 7.1.9

| ව්‍යාපෘතිය | වැඩසටහන | ශීර්ෂය | | වියදමේ ස්වභාවය | අනුමත ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| | **1** | 2502 | 11 | සංචාරක ප්‍රවර්ධනය | 752,000,000 | 1,826,617 | 750,173,383 | 0 |
| | 2 | 2502 | 12 | තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය | 503,000,000 | - | 503,000,000 | 0 |
| | 3 | 2502 | | සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | | | | |
| | | | 12 | | 494,000,000 | 410,602,084 | 83,397,916 | 83.1 |
| | | | 17 | | 50,000,000 | 33,540,700 | 16,459,300 | 67 |
| | | | | **එකතුව** | **1,799,000,000** | **445,969,401** | **1,353,030,599** | **25** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## 7.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරින්ගෙන් 2716 දෙනෙක් '' රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම '' යටතේ 2012 වසරේ ණය ලබා ගෙන ඇත.

අංක 105011 අංක දරණ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුමේ වර්ෂයට අනුමත සීමා සහ සත්‍ය ශේෂයන් පහත පරිදිය.

| | අනුමත සීමාව | සත්‍ය | ප්‍රතිශතය |
|---|---|---|---|
| උපරිම හර සීමාව | රු. 120,000,000.00 | රු. 102,074,262.79 | 85.1 % |
| අවම බැර සීමාව | රු. 60,000,000.00 | රු. 89,332,491.81 | 148. 9% |
| උපරිම හර ශේෂ සීමාව | ර. 438,000,000.00 | රු. 283,436,867.55 | |

2012 වර්ෂයේ ණය නිකුත් කිරිම් සාරාංශය පහත දැක්වේ

| ණය වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| ආපදා ණය | 854 | රු. 79,183,698.98 |
| උත්සව අත්තිකාරම් | 1593 | රු. 7,965,000.00 |
| අනෙකුත් ණය | 269 | රු. 3,812,060.00 |
| | මුළු මුදල | රු. 90,960,758.98 |

### වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරිම

2012 වර්ෂය සඳහා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් '' බී'' ගිණුම සඳහා වු කේවල ශේෂ සැසදිම් ප්‍රකාශය නියමිත ආකෘතියට අනුව සකස් කර 2013 අප්‍රේල් 01 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදි. මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂාව යටතේ වර්ෂය ආරම්භයේ දී සම්පාදනය කරනු ලබන විගණන වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවන ලදී. අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා ආයතනද ඇතුලත් වන පරිදි මෙම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර ඇත.

## 7.3 2012 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද විගණන හා විමර්ශන කටයුතු පහත පරිදි වේ.

වගු අංක 7.3.1

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය | නිකුත් කළ විගණන විමසුම් ගණන | මෙහෙය වන ලද විශේෂ විමර්ශන හා පෙත්සම් විමර්ශන ගණන |
|---|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 09 | 07 |
| උඩරට සංවර්ධන අධිකාරිය | - | 01 |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය | - | 01 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 03 | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 01 | - |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 02 | - |
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | - | 03 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | - | 03 |
| ග්‍රාම සංවර්ධන පුහුණු පර්යේෂණ ආයතනය | - | 01 |
| දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | - | 01 |
| **මුළු එකතුව** | **15** | **17** |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මීට අමතරව අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතනවල වාර්ෂික ගබඩා හා වත්කම් සමීක්ෂණ කටයුතුවලටද විශේෂ දායකත්වයක් ලබා දී ඇත.

## 01. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සාමාන්‍ය විගණන කටයුතුවලට අතිරේකව 2012 වර්ෂය තුළ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහත පරිදි වේ.

| දිනය | ආයතනය |
|---|---|
| 2012.05.30 | අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු |
| 2012.07.26 | අමාත්‍යාංශය, අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු හා ආයතන |
| 2012.11.20 | අමාත්‍යාංශය, අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු හා ආයතන |

## 02. අභ්‍යන්තර විගණන අංශයේ සංයුතිය

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය පිලිබඳ විස්තර පහත පරිදි වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 |
| අභ්‍යන්තර විගණක | 02 | - |
| විගණන සහකාර | 31 | 11 |
| කා.කා.ස. | 01 | 01 |
| *එකතුව* | **35** | ***13*** |

## 7. 4. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පාලනය

2012 දෙසැම්බර් අවසාන වනවිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 7.4.1

| සේවක කණ්ඩායම් | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ මට්ටම | 742 | 586 | 156 |
| 2. තෘතීය මට්ටම | 06 | 02 | 04 |
| 3. ද්විතීය මට්ටම | 1527 | 1480 | 47 |
| 4. ප්‍රාථමික මට්ටම | 241 | 204 | 37 |
| එකතුව | *2516 | 2272 | 244 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

*2012 වර්ෂයේ අමාත්‍යාංශය යටතේ රැකියා විරහිත උපාධිධාරීන් 16,478 ක් සඳහා අභ්‍යාසලාභී පත්වීම් ලබාදීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ අනුමැතිය ලබාදී ඇත. එම තනතුරු සඳහා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බැවින් එම සංඛ්‍යාව මෙහි ඇතුලත් නොවේ.

### 7. 4..1 මානව සම්පත කළමනාකරණය

- **විදේශීය පුහුණු වැඩසටහන්**

2012 වර්ෂයේ විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව මගින් හා විවිධ ව්‍යාපෘති මගින් අමාත්‍යාංශය වෙත ලබාදුන් විදේශ පුහුණු සඳහා අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තුමේන්තු හා ආයතන වල නිලධාරීන් සහභාගී විය. ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

වගු අංක 7.4.2

| අනු අංකය | පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව | රට |
|---|---|---|---|
| 1. | විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව මගින් පවත්වනු ලැබූ විදේශ පුහුණු | 57 | මෝල්ටාව,මැලේසියාව,තායිලන්තය,කාම්බෝජය,වියට්නාමය,ලාඕසය,කොරියාව,චීනය,සිංගප්පූරුව,හොංකොං,ජපානය, ඉන්දියාව,නෙදර්ලන්තය, නේපාලය |
| 2. | ව්‍යාපෘති මගින් පවත්වනු ලබන විදේශ පුහුණු පාඨමාලා | 26 | ඇමරිකාව,ජර්මනිය,ඔස්ට්‍රේලියාව,ඉන්දියාව, තායිලන්තය,පිලිපීනය,කොරියාව,චීනය |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

- **දේශීය පුහුණු වැඩසටහන්**

අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා අනුව හා සේවා අවශ්‍යතා මත පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට වැය වූ පාඨමාලා ගාස්තු ලබා ගැනීම සඳහා කර ඇති ඉල්ලීම් වලට අනුව, ප්‍රතිපාදන සීමාව මත, ඉල්ලුම් කළ මුදලින් 50% ක් මූලික වශයෙන්ද, පාඨමාලාව අවසානයේ නිකුත් කල උපාධි සහතික පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව ඉතිරි 50% ද ලබාදෙනු ලැබේ. තවද, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවන් සඳහාද ඉල්ලීම් පරිදි හා ප්‍රතිපාදන සීමා තුල ප්‍රතිපාදන ලබාදී ඇත. 2012 වර්ෂය තුල ප්‍රතිපාදන ලබා දී ඇති එම පාඨමාලා පිලිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | ආයතනය | පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා / ඩිප්ලෝමා** | | | |
| 01 | කැළණිය විශ්ව විද්‍යාලය | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 1 |
| 02 | කොළඹ විශ්ව විද්‍යාලය | ග්‍රාමීය සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 |
| 03 | කැළණිය විශ්ව විද්‍යාලය | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 3 |
| 04 | කැළණිය විශ්ව විද්‍යාලය | සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 |
| 05 | කොළඹ විශ්ව විද්‍යාලය | සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 1 |
| 06 | කොළඹ විශ්ව විද්‍යාලය | ප්‍රාදේශීය සංවර්ධනය හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 |
| 07 | රුහුණු විශ්ව විද්‍යාලය | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 5 |
| 08 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 |
| 09 | මොරටුව විශ්ව විද්‍යාලය | ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි | 1 |
| 10 | කැළණිය විශ්ව විද්‍යාලය | ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 1 |
| **වෙනත් දේශීය පුහුණු පාඨමාලා** | | | |
| 11 | ඉංජිනේරු සේවා ආයතනය | ජල සැපයුම් පද්ධති පිළිබඳ පුහුණු පාඨමාලාව | 1 |
| 12 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | MPM පුහුණු පාඨමාලාව | 1 |
| 13 | මිලෝදා ආයතනය | ආර්ථික හා මූල්‍ය ව්‍යාපෘති ඇගයීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 5 |
| 14 | මිලෝදා ආයතනය | පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම් ක්‍රම | 1 |
| 15 | මිලෝදා ආයතනය | CIGAZ පුහුණු පාඨමාලාව | 1 |
| 16 | ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ එක් දින වැඩමුළුව | 1 |
| 17 | ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | හයිබ්‍රිඩ් වාහන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව | 1 |
| 18 | ඉංජිනේරු සේවා ආයතනය | ගොඩනැගිලි සඳහා වන ජල සැපයුම් පද්ධති පිළිබඳ පුහුණු පාඨමාලාව | 2 |

| | | | |
|---|---|---|---|
| 19 | වෘත්තීය පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව | ලේකම්කරණ පුහුණු පාඨමාලාව | 2 |
| 20 | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය | ලේකම්කරණ පුහුණු පාඨමාලාව | 1 |
| 21 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය ප්‍රසම්පාදනය සහ ගිවිසුම් පරිපාලනය | 1 |
| 22 | කැළණිය විශ්ව විද්‍යාලය | පරිවර්තනය සහ අර්ථකතනය | 1 |
| 23 | කැළණිය විශ්ව විද්‍යාලය | දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව | 1 |
| 24 | ජනාවාස සැලසුම් හා සංවර්ධන මධ්‍යස්ථානය | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 1 |
| 25 | කොළඹ විශ්ව විද්‍යාලය | පරිගණක සහතික පත්‍ර පාඨමාලාව | 2 |
| 26 | දෙමළ භාෂා දෙපාර්තුමේන්තුව | දෙමළ භාෂා උසස් විභාගය | 1 |
| | | | 39 |

මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මෙම පුහුණු වලට අමතරව අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් හා ඉදිරිපත් කිරීමේ කුසලතා පිලිබඳ වැඩමුළුවක්ද පැවැත්විණි.

තවද, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. සුබෝධ්‍යා උපදේශන මනෝවිද්‍යාත්මක සංවාද මණ්ඩපය යන මැයෙන් දින ½ක මනෝවිද්‍යාත්මක වැඩසටහනක් අමාත්‍යාංශයේ විවිධ නිලධාරී කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පවත්වන ලදි.

- **භාෂා හැකියාව පිළිබඳ පුහුණු වැඩසටහන්**

2012 වර්ෂයේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයෙහි දෙවන භාෂා හැකියා වර්ධනය කිරීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලය මගින් පවත්වනු ලබන කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහනක් නිලධාරීන් සඳහා පවත්වනු ලැබීය.

## 7.4.2 සුබ සාධක සංගමය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය , සංචාරක අමාත්‍යාංශය, ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය තවත් ආයතන ගණනාවක් ඒකාබද්ධ කිරීමෙන් ස්ථාපිත කරන ලද අතර. අදාළ අමාත්‍යාංශ හා ආයතන යටතේ වෙන් වශයෙන් පැවති සුබ සාධක සංගම් අහෝසි කර එම සංගම් සියල්ලේම සාමාජිකයින් ඇතුළත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සුබ සාධක සංගමයේ කටයුතු 2012-06-01 දින පැවති ආගමික වතාවත් සමඟ ආරම්භ කරන ලදි.

### ක්‍රියාකාරකම්

- 2012-07-21 දින බෙන්තොට සුලංකා නිවාඩු නිකේතනයේදී සංගමයේ සමාජිකයින් හඳුනාගැනීමට හා සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සුහද හමුවක් පැවැත්විය. මේ සඳහා සාමාජිකයින් 150 පමණ සහභාගි විය.
- සමාජ සත්කාරයක් ලෙසින් ත්‍රිකුණාමළය යාය 68 විද්‍යුහල සඳහා පොත් පරිත්‍යාග කරන ලදි
- සාමාජිකයින්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දේශන සංවිධානය කරන ලදි.
- සාමාජිකයින්ගේ ක්‍රීඩා රුචිය වැඩිකිරීම සඳහා කණ්ඩායම් 16 කින් යුක්ත වූ සුහද ක්‍රිකට් තරඟාවලියක් 2013.02.08 දින කොළඹ විශ්ව විද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පැවැත්විය.
- නත්තල් උත්සවය සඳහා අනුග්‍රහය දක්වමින් කිතුණු බැතිමතුන්ගේ උතුම් වූ මංගල්‍යයට සමගාමීව නත්තල් සැමරීමට දායක විම.
- සාමාජිකයින්ගේ අරමුදල් තර කිරීම සඳහා ලොතරැයි දිනුම් ඇදීමට ටිකට් පොත් මුද්‍රණය කර බෙදා හැරීම හා අලෙවි කිරීම සිදු කිරීම සිදු විය.

මේවන විට සංගමයේ සාමාජිකත්වය 400 ඉක්මවා ඇති අතර රු700,000 ඉක්මවූ අරමුදලකින්ද සුභ සාධක සංගමය සමන්විතය.

## 7.4.3 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය


ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය දේශීය සහ විදේශීය වශයෙන් ඉමහත් ජනප්‍රියත්වයට පත් සන්නිවේදන මෙවලමකි. මෙය සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් දෛනිකව යාවත්කාලීන වේ. සන්නිවේදන අංශය යටතේ ක්‍රියාත්මක වන මෙම වෙබ් අඩවියට මාසිකව පිවිසෙන ග්‍රාහකයින්ගේ සංඛ්‍යාව 40,000කට අධිකය.

අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රකාශයට පත්කරන දෛනික සිංහල සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති නිවේදනද මෙහි පළවන අතර ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර මාධ්‍ය ආයතනයන්හි දෛනික කටයුතු සඳහා එමගින් ලැබෙනුයේ අනගි සහායකි. සෑම ක්‍රියාකාරකටම අදාල ඡායාරූප සහ විඩියෝ පට එහි වෙබ් අඩවියේ අන්තර්ගත බැවින් අදාල අයට ඒවා බාගත කරගතද හැකිය. එමෙන්ම අමාත්‍යාංශයේ සියළු නිවේදන, ටෙන්ඩර් දැන්වීම්, ශිෂ්‍යත්ව සහ විශේෂ ව්‍යාපෘතිවල විස්තරද එහි ඇතුළත්ය.

ආර්ථික සංවර්ධනය පිළිබඳව දිනපතා මුද්‍රිත මාධ්‍යයන්ගේ පලවන පුවත්පත් ලිපි එකතුවක් සහ රූපවාහිනී නාලිකා වලින් පෙරදින රාත්‍රියේ විකාශනය කරන ලද එයට අදාල රූපවාහිනී පටිද වෙබ් අඩවියෙන් දෛනිකව ප්‍රකාශයට පත් කෙරේ.

**අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් තොරතුරු**
**ජනවාරි - දෙසැම්බර්, 2012**

රූප සටහන් අංක 7.4.1




මූලාශ්‍රය - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# 8

# විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ

## විගණකාධිපති විමසුම් හා නිරීක්ෂණ

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ තම සංවර්ධන කටයුතු දීප ව්‍යාප්තව සිදු කරන අතර කොළඹ පිහිටි අමාත්‍යාංශ කාර්යාලය, ප්‍රතිපත්ති, පරිපාලන හා මූල්‍ය පාලනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියාත්මක වන අතර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විවිධ දෙපාර්තමේන්තු, උප කාර්යාල ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු කරනු ලබයි. ඒ අනුව විගණකාධිපති විසින් එම දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අමාත්‍යාංශයෙන් දීප ව්‍යාප්තව සංවර්ධන කටයුතු පිළිබඳව විගණනය සිදු කෙරෙන අතර අමාත්‍යාංශයට අනුයුක්ත විගණන ඒකකය විසින් අමාත්‍යාංශ කාර්යාලයේ විගණන කටයුතු සිදු කරනු ලබයි.

2012 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත විගණන විමසුම් 16 ක් ලැබී ඇත .

එම එක් එක් විගනණ විමසුමෙන් ඉදිරිපත් කර ඇති කරුනු පිළිබද ගෙන ඇති ක්‍රියා මාර්ග ඇමුණුම් 1 න් යාකර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා අමාත්‍යාංශ ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත වර්ෂය තුල ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව 59 කි. එම එක් එක් විගණන නිරීක්ෂණ වල සඳහන් දැ නිවැරදි කිරීමට පියවර යොදන ලෙසත්, ඉදිරියට නිරික්ෂණ වලින් පෙන්වා දී ඇති අඩුපාඩු ඇති නොවීමට කටයුතු යොදන ලෙසත්, දිස්ත්‍රික් ලේකම් වරුන් දැනුවත් කර ඇත.

## 2012 මුදල් වර්ෂය තුල අමාත්‍යාංශය වෙත ලැබුන විගණන විමසුම් ඇමුණුම 01

| අනු අංකය | විගණන විමසුම් අංකය | විෂය | ලැබුන දිනය | විගණකාධිපති වෙත යොමුකල දිනය | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| 1 | එල්පී/එෆ්/එම්ඊඩී/2011/වි.14 | අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද ප්‍රසම්පාදනයන් අතරමග අත්හැර දැමීම පිලිබද පරීක්ෂාව | 2012.01.05 | 2012.09.17 | ව්‍යාපෘතියේ වර්තමාන තත්වය පැහැදිලි කර විගණකාධිපති වෙත පිළිතුරු යවා ඇත. |
| 2 | එල්පී/එෆ්/එම්ඊඩී/2011/වි.07 | කුකුලු පැටවුන් ආනයනය කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාව | 2011.11.09 | 2012.11.29 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අවධානය යොමුකර පිලිතුරු යවා ඇත. |
| 3 | එල්පී/එෆ්/එම්ඊඩී/2011/වි.15 | අර්ධ ගෘහාශිත කුකුළු පැටවුන් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරියට මුදල් ලබා දීම පිළිබද පරීක්ෂාව | 2012.01.12 | 2012.03.09 | ව්‍යාපෘතියේ වර්තමාන තත්වය පැහැදිලි කරමින් පිළිතුරු යවා ඇත. |
| 4 | එල්පී/එෆ්/එම්ඊඩී/2011/වි.16 | ගගවට කෝරලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ 105 වැය ශීර්ෂයප්‍රතිපාදන මගින් කරන ලද මාර්ග සංවර්ධන කටයුතු පිළිබද පරීක්ෂාව | 2012.01.16 | 2012.05.15 | විගණන නිරීක්ෂණ පිළිගෙන අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට පියවර යොදා වර්ථමාන තත්වය පැහැදිලි කරමින් දින පිළිතුරු යවා ඇත. |
| 5 | සිඑල්/කේඩී/එච්/යුඩීඒ/2011/74 | ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ විධායක නිළධාරීන්ගේ පත්කිරීම් සම්බන්ධව විගණන පරීක්ෂණය | 2012.02.10 | 2012.01.04 | විගණන නිරීක්ෂණ පිළිගෙන අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු කර පිළිතුරු විගණකාධිපති වෙත යවා ඇත. |
| 6 | සිඑල්/කේඩී/එච්/යුඩීඒ/2011/67 | 2011 දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ පාසැල් වලට බෙදාදීම පිනිස එළවලු පැළ මිළදී ගැනීමේදී සිදුවූ අක්‍රමිකතා සම්බන්ධව විගණන පරීක්ෂණය | 2011.11.25 | 2012.03.06 | පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කර ඇති අතර අවශ්‍යතා ඉක්මවා මිලට ගැනීම සම්බන්ධව වගකිව යුතු නිළධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බව දන්වා පිළිතුරු විගණකාධිපති වෙත යවා ඇත. |
| 7 | එල්පී/එෆ්/එම්ඊඩී/2011/වි.17 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් උඩරට සංවර්ධන අධිකාරියට ලබා දෙන ලද රු.මිලියන 20.25 න් කරන ලද සංවර්ධන කටයුතු පිළිබද පරීක්ෂාව | 2012.01.20 | | විශේෂ පරීක්ෂණ කමිටුවක් පත්කර එම නිර්දේශ අනුව ඉදිරි පියවර ගෙන ඇත. |
| 8 | එල්පී/එෆ්/එම්ඊඩී/වි.ගි/2011 | විසර්ජන ගිනුම 2011-වියදම් ශීර්ෂය 105 | 2012.05.02 | 2012.08.17 | විගණන නිරීක්ෂණ සමග එකග වී අඩුපාඩු නිවැරදිකර ගැනීමටත් එවැනි දෑ ඉදිරියට නොවීමටත් පියවර ගෙන ඇත. |
| 9 | එල්පී/එෆ්/CARE"බී"/එෆ් ඒ/2011 | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ හදිසි ව්‍යාපෘතියේ බී සංරචකයේ මුදල් වාර්තාව සඳහා වූ විගණකාධිපති වාර්තාව | 2012.05.15 | 2012.06.17 | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත. |
| 10 | එල්පී/එෆ්/එම්ඊඩී/2012/වි.01 | ගැටුම්වලින් හානියට පත් පුදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකරන හා තත්ව සහතික ඒකකය සම්බන්ධ විගණන පරික්ෂාව | 2012.06.08 | 2012.07.12 | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත. |
| 11 | එල්පී/එෆ්/එම්ඊඩී/2012/වි.02 | ඉන්ධන හා විදුලිය වියදම් පරීක්ෂාව-2012 | 2012.07.19 | 2012.08.17 | විගණන නිරීක්ෂණ පිළිගෙන අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට පියවර යොදා ඇත. |
| 12 | එල්පී/එෆ්/එම්ඊඩී/2012/වි.03 | ගම්පහ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක රන් අරුණ ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන-2011 යටතේ සිදුකල මාතෘ නිවාස ඉදිකිරීම්/ප්‍රතිසංස්කරණයට අදාල පරීක්ෂාව | 2012.07.20 | 2012.09.17 | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට අදාල අංශ දැනුවත් කර ඇත. |
| 13 | වයිඑස්/සී/එම්ඊඩී/2012/වි.05 | අනතුරට පත්වූ වාහන සම්බන්ධ පරීක්ෂාව-2012 වර්ෂය | 2012.10.05 | 2012.11.07 | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇති අතර එවැනි දෑ ඉදිරියට නොවීමට පියවර ගෙන ඇත. |
| 14 | එල්පී/එෆ්/එම්ඊඩී/2012/වි.04 | මාතෘ සායන සඳහා පොරොත්තුව රැදී සිටීමේ පුටු ලබා දීමේ වැඩ සටහන | 2012.09.11 | 2012.11.29 | විගණන නිරීක්ෂන පිළිගෙන අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත. |
| 15 | එන්ඩබ්ලිව්/පීටී/ඒ/03/පුත්.දි.ලේ/ආර්ථික.සං/2012/165 | පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන | 2012.10.03 | 2012.11.14 | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇති අතර එවැනි දෑ ඉදිරියට නොවීමට පියවර ගෙන ඇත. |
| 16 | වයිඑස්/සී/එම්ඊඩී/තොරතුරු | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ වැය ශිර්ෂය යටතේ ලබා දෙන ලද ප්‍රතිපාදන සහ එම ප්‍රතිපාදනමගින් දරන ලද වියදම් පිලිබද තොරතුරු ලබා ගැනීම-2012 | 2012.12.03 | 2012.12.20 | අදාල තොරතුරු විගණනයට ලබා දී ඇත. |

Prepared by - Planning and Monitoring Division
No. 464/A, T. B. Jayah Mawatha, Colombo 10.
Tel : 26 88088

*Designed and Layout by : S. A. A. Chandima*